2022.04.07 මහා සභා වාර්තාව

පාණදුර නගර සභාව

දිනය : 2022.04.07

වෙලාව : පෙ.ව. 10.10

ස්ථානය : නගර සභා රැස්වීම් ශාලාව

සහභාගී වීම:

ගරු සභාපති - එම්.ඩී.නන්දන ගුණතිලක මහතා

ගරු නාගරික මන්ත්‍රී - රජීව සංජය වීරමන් මහතා

ගරු නාගරික මන්ත්‍රී - අයි.ජානක උදයවර්ණ සොයිසා වික්‍රමසිංහ මහතා

ගරු නාගරික මන්ත්‍රී - විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී - එම්.පියසේන ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී _ කේ.ඩී.අශෝකා රත්නමාලි මහත්මිය

ගරු නාගරික මන්ත්‍රී _ එම්.කුමුදු ප්‍රනාන්දු මහතා

ගරු නාගරික මන්ත්‍රී _ ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතා

ගරු නාගරික මන්ත්‍රී _ එච්.ඩී.මහින්ද පුන්සිරි මහතා

ගරු නාගරික මන්ත්‍රී _ පුෂ්පා ෆොන්සේකා මහත්මිය

ගරු නාගරික මන්ත්‍රී _ එච්.චන්දිම ඒ.පීරිස් මහතා

ගරු නාගරික මන්ත්‍රී _ ගයා උදයංගනී මහත්මිය

ගරු නාගරික මන්ත්‍රී _ එච්.ආර්.බන්දුල සොයිසා මහතා

ගරු නාගරික මන්ත්‍රී _ එම්.පද්මසිරි සිල්වා මහතා

ගරු නාගරික මන්ත්‍රී _ ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මහත්මිය

ලේකම් _ ටී.මානෙල් සියඹලාගොඩ මෙය

2022.04.07 මහා සභා වාර්තාව

සභාව පිළිගැනීම හා ආගම සිහි කිරීම

ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීමෙන් හා ආගම සිහිකිරීමෙන් පසුව මහා සභා රැස්වීමේ වැඩ කටයුතු පෙරවරු 10.10 ට ආරම්භ කරන ලදී.

(අ) පසුගිය සභාවේ රැස්වීම් වාර්තා සම්මත කිරීම -

(අ.1) 2022.03.03 මහා සභා වාර්තාව

2022.03.03 වන දින මහ සභා වාර්තාව පිළිගැනීම සුදුසු බව ගරු සභාපති එම්.ඩී.නන්දන ගුණතිලක මහතා විසින් යෝජනා කල අතර ,ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා විසින් ස්ථිර කරන ලදුව 2022.03.03 වන දින මහා සභා වාර්තාව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන -

(ආ.1) අද දින එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන සභික මහත්ම මහත්මීන් රටතුළ මේවන විට උද්ගතව ඇති තත්ත්වයට සංකේතාත්මකව විරෝධය පළකිරීමක් වශයෙන් කළුපටි පැළඳ සභාව වෙත පැමිණ සිටිනවා. වත්මන් ආණ්ඩුව විසින් පසුගිය කාලයේ සිදුකරන ලද සියළු ප්‍රජාතන්ත්‍ර විරෝධීක්‍රියා, ආර්ථිකය තුළ සිදුකරන ලද දූෂිත ක්‍රියා යනාදී සමස්ථ තත්ත්වය සම්බන්ධව රටේ බහුතර ජනතාව ආණ්ඩුවට විරෝධය මේවන විට පළකරමින් සිටිනවා. මෙහිදී ප්‍රධාන සටන් පාඨයෙන් අදහස් විය යුත්තේ මේවන තෙක් ආණ්ඩු කරන ලද සියළුම පක්ෂවල දූෂිතයන් අධිකරණ වෙත ගෙන්වා දඬුවම් ලබාදිය යුතුයි කියන එක බව මාගේ පෞද්ගලික මතය වන බව සභාව වෙත නිවේදනය කරන ලදී.

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා -

(ඇ.1) ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා ,මෙදින මහා සභා වාරය වෙත නොපැමිණෙන බව දන්වා ඇති අතර මෙම සභික මහතාට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව නිවාඩු අනුමත කරන ලදී.

(ඇ.2) ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතා ,මෙදින මහා සභා වාරය වෙත නොපැමිණෙන බව දන්වා ඇති අතර මෙම සභික මහතාට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව නිවාඩු අනුමත කරන ලදී.

(ඈ) සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම -

(ඈ.1) නිවසේ එකතු වන වැසි ජලය තම නිවස පිහිටි පුද්ගලික පාරට යොමු කිරීම සම්බන්ධයෙන් පාණදුර,ද සිල්වා මාවතේ,අංක 35/4 දරණ නිවසේ පදිංචි එස්.කේ.එස්.ප්‍රනාන්දු යන අයවිසින් "ද සිල්වා මාවතේ අංක 35/4 දරන නිවස-අනවසර වතුර බටය" යන මැයෙන් ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය හරහා ඉදිරිපත් කරන ලද සංදේශය සභාගත කරන ලදී.

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා

(ඊ.1) ගරු සභාපති නන්දන ගුණතිලක මැතිතුමා, ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.1.1) පාණදුර නගර සභාවේ සියළු මහජන පුස්තකාල එක්ව සංවිධානය කරනු ලබන 2022 වර්ෂයේ සාහිත්‍ය උත්සවය පැවැත්වීම සඳහා රු 310,000.00 ක් වූ පහත දළ ඇස්තමේන්තුව පිළිගැනීමටත්, අදාළ මුදල ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව වැය ශීර්ෂ 124-6-3-0-1503 යටතේ සහා අරමුදලින් වියදම් කිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

<u>දළ ඇස්තමේන්තුව</u>

පැවැත්වීමට නියමිත තරඟ

- පද්‍ය රචනා තරඟ
  ගද්‍ය රචනා තරඟ
  කථික තරඟ
  ජන ගායනා තරඟ
  } කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ,ජ්‍යෙෂ්ඨ ද්විතීය
  (පද්‍ය රචනා,ගද්‍ය රචනා හා කෙටිකතා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ)
- කෙටිකතා - ජ්‍යෙෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ද්විතීය
- චිත්‍ර - ප්‍රාථමික, කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ,ජ්‍යෙෂ්ඨ ද්විතීය
- හිටවන කවි - විවෘත (18-25 අතර හා 35ට ඉහළ-සිංහල මාධ්‍ය පමණි)

සිංහල මාධ්‍ය තරඟ ජයග්‍රාහී ස්ථාන 60 යි

1.	ත්‍යාග සඳහා - පළමු ස්ථානය	20 * 1200.00	= 24000.00
	දෙවන ස්ථානය	20 * 1000.00	= 20000.00
	තෙවන ස්ථානය	20 * 750.00	= 15000.00

දෙමළ මාධ්‍ය තරඟ ජයග්‍රාහී ස්ථාන 24 යි(වයස් කාණ්ඩය 18-25 ත් අතර)

	ත්‍යාග සඳහා - පළමු ස්ථානය	08 * 1200.00	= 9600.00
	දෙවන ස්ථානය	08 * 1000.00	= 8000.00
	තෙවන ස්ථානය	08 * 750.00	= 6000.00

2.	ත්‍යාගලාභීන් සඳහා සහ උත්සවයේ විවිධ කටයුතු හා කුසලතාවය වෙනුවෙන් සහතික පත්‍ර	100 * 150.00	= 15000.00

(ත්‍යාගලාභීන් 84 + ප්‍රාථමික සහ කණිෂ්ඨ චිත්‍ර තරඟයේ කුසලතා සහතික 8+ උත්සවයේ විවිධ කටයුතු සඳහා සහභාගීවීම වෙනුවෙන් ලබාදෙන සහතික 08)

3.	ආරාධනා පත්‍ර	75 * 100.00	= 7500.00
4.	ආරාධිත දේශක ගාස්තු		= 25000.00
5.	විනිශ්චයකරුවන්ගේ සංග්‍රහය		= 1000.00

6.	ළමුන් හා ආරාධිත අමුත්තන් ඇතුළු සහභාගී වන්නන් සඳහා සංග්‍රහය	400* රු150.00	= 60000.00
7.	සාහිත්‍ය නිර්මාණ -2022 කෘතිය මුද්‍රණය	පිටපත් 100	= 60000.00
8.	වෙස් නැටුවන් 03 ක් හා බෙරකරුවන් 03 ක් සඳහා		= 15000.00
9.	ප්‍රචාරණ කටයුතු සඳහා බැනර්		= 5000.00
10.	ඡායාරූප,වීඩියෝ සහ ඇල්බමය		= 15000.00
11.	සැරසිලි		= 5000.00
12.	නිවේදකයින් දෙදෙනෙකු සඳහා	2 * 1500.00	= 3000.00
13.	තරඟ විනිසුරුවන් 03 දෙනෙකු සඳහා දින 02 කට	(3* 1500.00)*2	= 9000.00
14.	වෙනත්		= 6900.00
	එකතුව		= රු 310000.00

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

සංශෝධිත යෝජනාව : පාණදුර නගර සභාවේ ප්‍රධාන පුස්තකාලය,ශාඛා පුස්තකාල හා කියවීම් ශාලා එක්ව සංවිධානය කරනු ලබන 2022 වර්ෂයේ සාහිත්‍ය උත්සවය පැවැත්වීම සඳහා රු 310,000.00 ක් වූ පහත දළ ඇස්තමේන්තුව පිළිගැනීමටත්, අදාළ මුදල ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව වැය ශීර්ෂ 124-6-3-0-1503 යටතේ සහා අරමුදලින් වියදම් කිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

<u>දළ ඇස්තමේන්තුව</u>

පැවැත්වීමට නියමිත තරඟ

- පද්‍ය රචනා තරඟ
  ගද්‍ය රචනා තරඟ
  කථික තරඟ
  ජන ගායනා තරඟ
  } කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ,ජ්‍යෙෂ්ඨ ද්විතීය
  (පද්‍ය රචනා,ගද්‍ය රචනා හා කෙටිකතා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ)
- කෙටිකතා - ජ්‍යෙෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ද්විතීය
- චිත්‍ර - ප්‍රාථමික, කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ,ජ්‍යෙෂ්ඨ ද්විතීය
- හිටවන කවි - විවෘත (18-25 අතර හා 35ට ඉහළ-සිංහල මාධ්‍ය පමණි)

සිංහල මාධ්‍ය තරඟ ජයග්‍රාහී ස්ථාන 60 යි

1.	ත්‍යාග සඳහා - පළමු ස්ථානය	20 * 1200.00	= 24000.00
	දෙවන ස්ථානය	20 * 1000.00	= 20000.00
	තෙවන ස්ථානය	20 * 750.00	= 15000.00

දෙමළ මාධ්‍ය තරඟ ජයග්‍රාහී ස්ථාන 24 යි(වයස් කාණ්ඩය 18-25 ත් අතර)

	ත්‍යාග සඳහා - පළමු ස්ථානය	08 * 1200.00	= 9600.00

	දෙවන ස්ථානය	08 * 1000.00	= 8000.00
	තෙවන ස්ථානය	08 * 750.00	= 6000.00
2.	ත්‍යාගලාභීන් සඳහා සහ උත්සවයේ විවිධ කටයුතු හා කුසලතාවය වෙනුවෙන් සහතික පත්‍ර	100 * 150.00	= 15000.00

(ත්‍යාගලාභීන් 84 + ප්‍රාථමික සහ කණිෂ්ඨ චිත්‍ර තරඟයේ කුසලතා සහතික 8+ උත්සවයේ විවිධ කටයුතු සඳහා සහභාගීවීම වෙනුවෙන් ලබාදෙන සහතික 08)

3.	ආරාධනා පත්‍ර	75 * 100.00	= 7500.00
4.	ආරාධිත දේශක ගාස්තු		= 25000.00
5.	විනිශ්චයකරුවන්ගේ සංග්‍රහය		= 1000.00
6.	ළමුන් හා ආරාධිත අමුත්තන් ඇතුළු සහභාගී වන්නන් සඳහා සංග්‍රහය	400* රු150.00	= 60000.00
7.	සාහිත්‍ය නිර්මාණ -2022 කෘතිය මුද්‍රණය	පිටපත් 100	= 60000.00
8.	වෙස් නැට්ටුවන් 03 ක් හා බෙරකරුවන් 03 ක් සඳහා		= 15000.00
9.	ප්‍රචාරණ කටයුතු සඳහා බැනර්		= 5000.00
10.	ඡායාරූප,වීඩියෝ සහ ඇල්බමය		= 15000.00
11.	සැරසිලි		= 5000.00
12.	නිවේදකයින් දෙදෙනෙකු සඳහා	2 * 1500.00	= 3000.00
13.	තරඟ විනිසුරුවන් 03 දෙනෙකු සඳහා දින 02 කට(3* 1500.00)*2		= 9000.00
14.	වෙනත්		= 6900.00
	එකතුව		= රු 310000.00

සංශෝධිත යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර පාණදුර නගර සභාවේ ප්‍රධාන පුස්තකාලය,ශාඛා පුස්තකාල හා කියවීම් ශාලා එක්ව සංවිධානය කරනු ලබන 2022 වර්ෂයේ සාහිත්‍ය උත්සවය පැවැත්වීම සඳහා රු 310,000.00 ක් වූ පහත දළ ඇස්තමේන්තුව පිළිගැනීමටත්, අදාළ මුදල ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව වැය ශීර්ෂ 124-6-3-0-1503 යටතේ සභා අරමුදලින් වියදම් කිරීමටත්තීරණය විය.

<u>දළ ඇස්තමේන්තුව</u>

පැවැත්වීමට නියමිත තරඟ

- පද්‍ය රචනා තරඟ
  ගද්‍ය රචනා තරඟ
  කථික තරඟ
  ජන ගායනා තරඟ
  } කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ,ජ්‍යෙෂ්ඨ ද්විතීය

(පද්‍ය රචනා,ගද්‍ය රචනා හා කෙටිකතා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ)

- කෙටිකතා - ජ්‍යෙෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ද්විතීය
- චිත්‍ර - ප්‍රාථමික, කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ,ජ්‍යෙෂ්ඨ ද්විතීය
- හිටවන කවි - විවෘත (18-25 අතර හා 35ට ඉහළ-සිංහල මාධ්‍ය පමණි)

සිංහල මාධ්‍ය තරඟ ජයග්‍රාහී ස්ථාන 60 යි

1. ත්‍යාග සඳහා	- පළමු ස්ථානය	20 * 1200.00	= 24000.00
	දෙවන ස්ථානය	20 * 1000.00	= 20000.00
	තෙවන ස්ථානය	20 * 750.00	= 15000.00

දෙමළ මාධ්‍ය තරඟ ජයග්‍රාහී ස්ථාන 24 යි(වයස් කාණ්ඩය 18-25 ත් අතර)

ත්‍යාග සඳහා	- පළමු ස්ථානය	08 * 1200.00	= 9600.00
	දෙවන ස්ථානය	08 * 1000.00	= 8000.00
	තෙවන ස්ථානය	08 * 750.00	= 6000.00

2.	ත්‍යාගලාභීන් සඳහා සහ උත්සවයේ විවිධ කටයුතු හා කුසලතාවය වෙනුවෙන් සහතික පත්‍ර	100 * 150.00	= 15000.00

(ත්‍යාගලාභීන් 84 + ප්‍රාථමික සහ කණිෂ්ඨ චිත්‍ර තරඟයේ කුසලතා සහතික 8+ උත්සවයේ විවිධ කටයුතු සඳහා සහභාගීවීම වෙනුවෙන් ලබාදෙන සහතික 08)

3.	ආරාධනා පත්‍ර	75 * 100.00	= 7500.00
4.	ආරාධිත දේශක ගාස්තු		= 25000.00
5.	විනිශ්චයකරුවන්ගේ සංග්‍රහය		= 1000.00
6.	ළමුන් හා ආරාධිත අමුත්තන් ඇතුළු සහභාගී වන්නන් සඳහා සංග්‍රහය	400* රු150.00	= 60000.00
7.	සාහිත්‍ය නිර්මාණ -2022 කෘතිය මුද්‍රණය	පිටපත් 100	= 60000.00
8.	වෙස් නැට්ටුවන් 03 ක් හා බෙරකරුවන් 03 ක් සඳහා		= 15000.00
9.	ප්‍රචාරණ කටයුතු සඳහා බැනර්		= 5000.00
10.	ඡායාරූප,වීඩියෝ සහ ඇල්බමය		= 15000.00
11.	සැරසිලි		= 5000.00
12.	නිවේදකයින් දෙදෙනෙකු සඳහා	2 * 1500.00	= 3000.00
13.	තරඟ විනිසුරුවන් 03 දෙනෙකු සඳහා දින 02 කට(3* 1500.00)*2		= 9000.00
14.	වෙනත්		= 6900.00
	එකතුව		= රු 310000.00

(ඊ.1.2) වැකඩ,සොලමන් මාවතේ පිහිටි පාණදුර නගර සභාවට අයත් පන්විල මහලියැද්ද නොහොත් රුක්ගහදෙනිය නැමැති ඉඩමේ (ජන උදාන ගම්මානයේ) කැබලි 41 ක පදිංචිකරුවන්ට ඔප්පු ලබාදීමට අදාල නාමලේඛණය සකස් කිරීම සඳහා 2021.11.15 දින හා 2022.03.28 දින පවත්වනු ලැබූ විශේෂ කමිටු වල නිර්දේශ කළ පරිදි පහත නම් සඳහන් පදිංචිකරුවන්හට ඔප්පු ලබා දීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

අනු අංකය	සම්පූර්ණ නම	ලිපිනය	කැබලි අංකය	තක්සේරු වටිනාකම(රු)
01	ධනසිරි වේරගොඩ	128/1,ජනඋදාන ගම,වැකඩ	17	2,133,000.00
02	මද්දුමාගේ විශාන්ති රම්‍යලතා ප්‍රනාන්දු	128/2,ජනඋදාන ගම,වැකඩ	18	2,379,750.00
03	සිංහාර සුරේෂ් ලක්ෂාන් ජයවර්ධන	128/3,ජනඋදාන ගම,වැකඩ	19	1,211,250.00
04	උත්තමාවඩුගේ දුසිලින් ප්‍රනාන්දු	128/4,ජනඋදාන ගම,වැකඩ	20	1,439,250.00
05	විජයන්ති පද්මලතා ක්‍රිස්ටෝපර්	128/5,ජනඋදාන ගම,වැකඩ	31	1,354,500.00
06	සුද්දහේවගේ අජන්ත ප්‍රනාන්දු	130,ජනඋදාන ගම,වැකඩ	8	1,128,000.00
07	අස්වැදිගේ නිමල් ප්‍රනාන්දු	132,ජනඋදාන ගම,වැකඩ	11	3,965,000.00
08	තෙල්ගේ සුභානි මංජුලා ප්‍රනාන්දු	132/1,ජනඋදාන ගම,වැකඩ	12	2,679,000.00
09	රයිගමගේ පියල් සුරාජ් ප්‍රනාන්දු	132/2,ජනඋදාන ගම,වැකඩ	14	1,662,500.00
10	මහමරක්කල පටබැඳිගේ රුශාන්ත හේමේන්ද්‍ර ඩයස්	132/2/A,ජනඋදාන ගම,වැකඩ	13	2,565,000.00
11	මහමරක්කල පටබැඳිගේ රුශාන්ත හේමේන්ද්‍ර ඩයස්	132/2/D,ජනඋදාන ගම,වැකඩ	26	3,271,500.00
12	අන්තෝනිගේ නදීෂා දමයන්ති	132/2/E,ජනඋදාන ගම,වැකඩ	23	1,486,750.00
13	අන්තෝනිගේ නදීෂා දමයන්ති	132/3,ජනඋදාන ගම,වැකඩ	25	476,000.00
14	මුතුතන්ත්‍රිගේ දිනේෂ් සඳරුවන් ප්‍රනාන්දු	132/4,ජනඋදාන ගම,වැකඩ	29	1,444,500.00
15	සිරියලතා ක්‍රිස්ටෝපර්	128/6,ජනඋදාන ගම,වැකඩ	32	1,494,000.00
16	මහමරක්කල පටබැඳිගේ ටානියා ඉෂාරා ඩයස්	132/4/A,ජනඋදාන ගම,වැකඩ	27	1,457,750.00
17	ගම්පලගේ නිශාන්ත මන්ජුල ෆොන්සේකා	132/4/B,ජනඋදාන ගම,වැකඩ	35	1,385,500.00
18	ගැලනිගම මේස්ත්‍රිගේ අසංක ජයනාත්	132/5,ජනඋදාන ගම,වැකඩ	4	4,437,000.00
19	රඹුක්කනගේ රුක්මනී ප්‍රනාන්දු	132/6,ජනඋදාන ගම,වැකඩ	37	1,107,000.00
20	රඹුක්කනගේ රෝහිනී ප්‍රනාන්දු	132/6/A,ජනඋදාන ගම,වැකඩ	36	1,228,500.00
21	ජයලත් පේඩිගේ ආරියදාස	132/7,ජනඋදාන ගම,වැකඩ	42	1,632,000.00

22	වැලිපිටියගේ සුමනාවතී සිල්වා	132/7/A,ජනඋදාන ගම,වැකඩ	43	1,814,750.00
23	ගාළුගේ දයානි ප්‍රනාන්දු	132/8,ජනඋදාන ගම,වැකඩ	40	454,750.00
24	තෙල්ගේ ප්‍රසන්න කුමාර	132/8/A,ජනඋදාන ගම,වැකඩ	41	1,054,000.00
25	වන්නකුවත්ත වඩුගේ චමින්ද රොෂාන්	132/9,ජනඋදාන ගම,වැකඩ	47	1,024,000.00
26	මහතෙල්ගේ ඥානවතී පීරිස්	132/10,ජනඋදාන ගම,වැකඩ	46	1,882,750.00
27	ලංකාහළුගේ නිලානි සොයිසා	132/10/A,ජනඋදාන ගම,වැකඩ	45	1,551,250.00
28	වැඩෙනකොණ්ඩ ආරච්චිගේ සුගත් ජානක ප්‍රනාන්දු	132/10/B,ජනඋදාන ගම,වැකඩ	44	1,389,750.00
29	තෙල්ගේ තිරෝමි පීරිස්	132/10/C,ජනඋදාන ගම,වැකඩ	53	436,000.00
30	ගාළුගේ නන්දන ගයන්ත ප්‍රනාන්දු	132/10/D,ජනඋදාන ගම,වැකඩ	51	756,500.00
31	බරුපලගේ විකාශ් සංදීප	132/11,ජනඋදාන ගම,වැකඩ	50	1,228,250.00
32	මහමරක්කල පටබැදිගේ තරිඳු ක්‍රිෂාන්ත ඩයස්	132/12,ජනඋදාන ගම,වැකඩ	49	1,606,500.00
33	වන්නකු වත්ත වඩුගේ දුෂාන්ත ප්‍රනාන්දු	132/13,ජනඋදාන ගම,වැකඩ	48	1,585,250.00
34	ගැලණිගම මෛත්‍රිගේ චන්දිමා	132/14,ජනඋදාන ගම,වැකඩ	39	1,649,000.00
35	සිරිවැඩි වෙලාගේ නන්දාවතී	132/15,ජනඋදාන ගම,වැකඩ	33	2,020,500.00
36	ශාන්ත බුලත්සිංහලාගේ සුනිල් ශාන්ත කුමාර	132/16,ජනඋදාන ගම,වැකඩ	30	1,534,500.00
37	දළුවතුමුල්ල ගමගේ ශ්‍රියානි සිල්වා	132/17,ජනඋදාන ගම,වැකඩ	21	1,752,750.00
38	අන්තෝනිගේ සජිත් වාමික	132/18,ජනඋදාන ගම,වැකඩ	22	1,515,250.00
39	ගුස්තීඤ්ඤවඩුගේනිරංජලා නෙළුම් ද සිල්වා	132/19,ජනඋදාන ගම,වැකඩ	16	1,567,500.00
40	වරුෂහැන්නැදිගේ ප්‍රියන්ති මල්කාන්ති සොයිසා	132/21,ජනඋදාන ගම,වැකඩ	15	1,695,750.00
41	මග්ගොනගේ ශාන්ති විනිප්‍රීඩා මාලනී	132/22,ජනඋදාන ගම,වැකඩ	9	1,140,000.00

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

1993 බස්නාහිර පළාත් සභාවේ මහ ඇමතිනිය ලෙස චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය දිවුරුම් දුන් දවසේ තමයි මෙම ඉඩම අවම සිටි ,ඉඩම් අහිමි අය මෙම ඉඩමේ කොටස් අල්ලා ගැනීමට කටයුතු කළේ. මම මෙම සභාවේ හිටපු සභාපති නෙවිල් ප්‍රනාන්දු මහතාට ලිපියක් ඉදිරිපත් කළා එදා එක්තරා පවුලකට ඉඩම් කට්ටි 06 ක් තමන්ගේ පවුලේ ඥාතීන්ට බෙදා දී තිබෙනවා ඒ පිළිබඳව සොයා බැලීමක් කරන්න කියා.ඒ අනුව එතුමා විසින් ලිපියක් නිකුත් කලා එතන සිටි 13 දෙනෙකුට නිවාස සෑදීම නතර කරන ලෙස.මටත් ලිපියක් ලැබුණා.අදාළ ලිපියට අනුව මාස 03 ක් බලා සිටියද ඉන්පසු කිසිදු පියවරක් නොගත් නිසා මා නිවස ඉදිකිරීමට පටන් ගත්තා.

1997 වර්ෂයේදී සභාපති නෙවිල් ප්‍රනාන්දු මහතා විසින්ම මෙය සඳහා සැලැස්මක් හදලා කට්ටි කරල පදිංචිකරුවන්ට පෙන්වා සිටියා එක් එක් කෙනාට ඔවුන්ගේ ඉඩම් කොටසේ මායිම් . 2001වර්ෂයේදී මෙම සභාවේ හිටපු නාගරික මන්ත්‍රී චිත්‍රානන්ද පීරිස් මහතා හරහා යෝජනාවක් ඉදිරිපත් කරනවා මෙහි පදිංචිකරුවන්ට ඔප්පු ලබාදෙන්න කියා.එම යෝජනාව සම්මත වෙනවා.නමුදු ක්‍රියාත්මක වීමක් සිදුවුණේ නැහැ.නැවත 2004 වර්ෂයේදී ගරු සභාපතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයක් දරන අවස්ථාවේ ඔබතුමා වෙත මා මෙම පදිංචිකරුවන්ගේ දුක්ගැනවිල්ල ඉදිරිපත් කරනවා.ඔබතුමා විසින් එදා කෘෂිකර්ම ඇමති ලෙස සිටි අනුර කුමාර දිසානායක මහතා වෙත ඉදිරිපත් කරන අතර එහිදී ඔවුන් සඳහන් කර එවනවා එය ඔවුන්ට අයත් ඉඩමක් නොවෙයි එම නිසා ඒ සම්බන්ධයෙන් ඔවුන්ට කිසිදු පියවරක් ගත නොහැකියි කියා.ඒඅනුව ගරු සභාපතිතුමා විසින් එය නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමුකළ අතර ඔවුන්ගෙන් ලැබුණේද පෙර පිළිතුරමයි.

2006 වර්ෂයේදී මා මෙම නගර සභාවට පත්වී පැමිණි විට නැවතත් මාගේ පලමු යෝජනාව වන්නේ මෙම පදිංචිකරුවන්ට ඔප්පු ලබාදෙන ලෙස.එම යෝජනාව සම්මත වුවද ඉන් පසු මාස 06 කට පෙර වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් එම යෝජනාවම ඉදිරිපත් කළ නිසා මාගේ මුල් යෝජනාව බලරහිත වුණා.2011 වර්ෂයේදී නැවතත් වීරමන් මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් ගෙන එනවා මෙම පදිංචිකරුවන්ට ඔප්පු ලබාදෙන ලෙස.එම යෝජනාවත් සම්මත වුණා.ඉන්පසු නැවතත් 2018 මෙම සභාවට පත්වී ආ විට මාගේ මුල් යෝජනාව වුනෙත් මෙම පදිංචිකරුවන්ට ඔප්පු ලබාදෙන ලෙස.එම යෝජනාවට අනුව ගරු සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් මේවන තෙක් වැඩ කටයුතු කරගෙන ආවා.මෙම ඉඩම සම්බන්ධයෙන් පත්ඉරුවක් සොයා ගැනීම සම්බන්ධයෙන් නීති කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන සංවර්ධන නිළධාරී ඉමල්කා මහත්මිය

විසින් සොයා ගත්තා.ඒ අනුව දැන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නීති නිළධාරී විසින් දන්වා තිබෙනවා මෙම පදිංචිකරුවන්ට ඔප්පු ලබාදිය හැකි බව.

ඉන්පසු ලබාදිය යුතු පදිංචිකරුවන්ගේ ලැයිස්තුව සකස් කිරීම සඳහා කමිටුවක් පත්කළ අතර එම කමිටුව රැස්වී තමයි මෙම ලැයිස්තුව සකස් කළේ.මෙම ලැයිස්තුවෙහි මුලින්ම ඉඩම් ලබාගත් පුද්ගලයින්ගේ නම් නැහැ.ඔවුන් දැන් ඉන්න අයට ඉඩම් විකුණා ගොස් තිබෙනවා.එමනිසා එසේ ගත් අයට ඔප්පු ලබා නොදී සිටිය හොත් ආරම්භයේ සිට පදිංචිකරුවන්ටත් ඔප්පු ලබාදීමට නොහැකි වෙනවා.එමනිසා මෙම ලැයිස්තුවට අනුව ඔප්පු ලබාදීමට කටයුතු කරමු,එමෙන්ම මෙම සභාවාරයේදීම මෙය ලබාදීමට කටයුතු කරමු,ඒ සඳහා පවත්වනු ලබන උත්සවයේ සියළු කටයුතු මා විසින් සංවිධානය කරන බව පවසා සිටිනා ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය</u>

මෙම ඉඩමෙහි මුලින්ම පදිංචි වුණේ මම ඒ 1989 වර්ෂයේ.මා ඉපදීමටත් පෙර සිට මගේ තාත්තා මෙම ස්ථානයේ කෙසෙල් කොටුවක් කර තිබෙනවා.හිටපු සභාපති රියෙන්සි ප්‍රනාන්දු මහතා එම කෙසෙල් ගස් සියල්ල කපා දැමුවා.මගේ තාත්තා ඒ සම්බන්ධයෙන් ඉතා දුක්වුණා.අපේ තාත්තාට ඉන්න තැනක් ගන්න මම රියෙන්සි ප්‍රනාන්දු මහතාගේ නිවසට ගියා.ඒ අනුව තමයි අද ඉන්න ඉඩම් කොටස ලැබුණේ.පියසේන ප්‍රනාන්දු මහතා කරන්නේ ඉතා අගය කළ යුතු වැඩක් නමුදු මගේ තාත්තා පිළිබඳව මේ අවස්ථාවේ මතක් නොකළා නම් එය ඔහුට කරන අගෞරවයක් බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

මෙම පදිංචිකරුවන්ට ඔප්පු ලබාදීම සම්බන්ධයෙන් කිසිදු විරෝධත්වයක් නැහැ.යම් යම් ගැටළු පැවති තැන් පිළිබඳව කමිටු අවස්ථාවන් වලදී මා අදහස් ප්‍රකාශ කර තිබෙනවා.ඒවා පිළිබඳව මෙම ඔප්පු ලබාදීමේදී පළාත් පාලන කොමසාරිස් කාර්යාලය විසින් විමසා බලයි.මෙහි පදිංචිකරුවෙක් සිටියා ගාළුගේ අජිත් ප්‍රනාන්දු ලෙස ඔහුගේ නම මෙම ලැයිස්තුවේ සඳහන් වෙන්නේ නැහැ.ඒ මන්ද යන්න විමසා සිටින ලදී.එමෙන්ම මෙම ලැයිස්තුවේ සඳහන් වන ඉඩම් කැබලි වල පර්චස් ප්‍රමාණයද සඳහන් කර සහිකයින් වෙත ලබාදීම සුදුසු බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

මේ වන විට අජිත් ප්‍රනාන්දු මහතා මියගොස් සිටින අතර ඔහුගේ බිරිඳ විදෙස්ගත වී සිටිනවා.නමුදු බිරිඳ විසින් ප්‍රදේශයේ ග්‍රාමසේවක වෙත දුරකථනයෙන් සම්බන්ධවෙමින් පවසා සිටිනවා ඇයට එම නිවස ඉදිකර ඇති ඉඩම් කොටස අවශ්‍ය බව,එමනිසා ග්‍රාමසේවක විසින් නිර්දේශ කරන්නේද බිරිඳගේ නමයි.එය මෙම ලැයිස්තුවේ සඳහන් වෙනවා යැයි පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා

ඔබතුමාගේ මැදිහත් වීම මත දීර්ඝ කාලීන ගැටළුවක් විසඳීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වන බව පවසා සිටින ලදී.එමනිසා ඉදිරිකටයුතු වේගවත් කර මෙම ඔප්පු ලබාදීම කඩිනමින් ඉටු කරමු යැයි පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා

පියසේන මන්ත්‍රීතුමා වසර 20 ක් පමණ පුද්ගලයෙකු ලෙසත් පක්ෂයක් ලෙසත් ඉදිරිපත් වී සෑහෙන වෙහෙසක් දැරුවා මෙම ඔප්පු ලබාදීම සම්බන්ධයෙන්.කෙසේ හෝ මෙහි අවසානයක් මේවන විට දැකඇති අතර මෙම සභා වාරයට තවත් ඇත්තේ සුළු කාලයක් බැවින් ඒ කාලය තුළ මෙම ජනතාවට ඔප්පු ලබාදීමට කටයුතු කරමු යැයි පවසා සිටි අතර මේ සඳහා මැදිහත්වූ සියළු දෙනාට පක්ෂයක් ලෙස අපගේ ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ගරු සභාපතිතුමාගේ නායකත්වය යටතේ පක්ෂ භේදයකින් තොරව සියළු දෙනාම සහභාගීවී මෙම ඔප්පු ලබාදීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා

මෙය නගර සභා දේපළක් බැවින් මෙම ඉඩම් කැබලි සඳහා යම් මුදලක් අයකරනවාද යන්න විමසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

මෙම ඉඩම් සඳහා ඔප්පු ලබාදීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරනු ලබනවා.එහිදී ඔවුන් විසින් යම් ගාස්තුවක් අයකරන ලෙස පවසා සිටියහොත් එය අයකළ හැකියි.එසේ රජයෙන් නියම කළ හොත් එම පදිංචිකරුවන් විරෝධත්වයක් නොදක්වයි එය ගෙවීමට.මන්ද මෙම ඔප්පු ඔවුන් වසර ගණනාවක් බලා සිටි දෙයක් යැයි පවසා සිටින ලදී.

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර වෑකඩ,සොලමන් මාවතේ පිහිටි පාණදුර නගර සභාවට අයත් පන්විල මහලියැද්ද නොහොත් රුක්ගහදෙනිය නැමැති ඉඩමේ (ජන උදාන ගම්මානයේ) කැබලි 41 ක පදිංචිකරුවන්ට ඔප්පු ලබාදීමට අදාල නාමලේඛණය සකස් කිරීම සඳහා 2021.11.15 දින හා 2022.03.28 දින පවත්වනු ලැබූ විශේෂ කමිටු වල නිර්දේශ කළ පරිදි පහත නම් සඳහන් පදිංචිකරුවන්හට ඔප්පු ලබා දීමට තීරණය විය.

අනු අංකය	සම්පූර්ණ නම	ලිපිනය	කැබලි අංකය	තක්සේරු වටිනාකම(රු)
01	ධනසිරි වේරගොඩ	128/1,ජනඋදාන ගම,වැකඩ	17	2,133,000.00
02	මද්දුමාගේ විශාන්ති රම්‍යලතා ප්‍රනාන්දු	128/2,ජනඋදාන ගම,වැකඩ	18	2,379,750.00
03	සිංහාර සුරේෂ් ලක්ෂාන් ජයවර්ධන	128/3,ජනඋදාන ගම,වැකඩ	19	1,211,250.00
04	උත්තමාවඩුගේ දුසිලින් ප්‍රනාන්දු	128/4,ජනඋදාන ගම,වැකඩ	20	1,439,250.00
05	විජයන්ති පද්මලතා ක්‍රිස්ටෝපර්	128/5,ජනඋදාන ගම,වැකඩ	31	1,354,500.00
06	සුද්දහේවගේ අජන්ත ප්‍රනාන්දු	130,ජනඋදාන ගම,වැකඩ	8	1,128,000.00
07	අස්වැදිගේ නිමල් ප්‍රනාන්දු	132,ජනඋදාන ගම,වැකඩ	11	3,965,000.00
08	තෙල්ගේ සුභානි මංජුලා ප්‍රනාන්දු	132/1,ජනඋදාන ගම,වැකඩ	12	2,679,000.00
09	රයිගමගේ පියල් සුරාජ් ප්‍රනාන්දු	132/2,ජනඋදාන ගම,වැකඩ	14	1,662,500.00
10	මහමරක්කල පටබැඳිගේ රුශාන්ත හේමේන්ද්‍ර ඩයස්	132/2/A,ජනඋදාන ගම,වැකඩ	13	2,565,000.00
11	මහමරක්කල පටබැඳිගේ රුශාන්ත හේමේන්ද්‍ර ඩයස්	132/2/D,ජනඋදාන ගම,වැකඩ	26	3,271,500.00
12	අන්තෝනිගේ නදීෂා දමයන්ති	132/2/E,ජනඋදාන ගම,වැකඩ	23	1,486,750.00
13	අන්තෝනිගේ නදීෂා දමයන්ති	132/3,ජනඋදාන ගම,වැකඩ	25	476,000.00
14	මුතුතන්ත්‍රිගේ දිනේෂ් සඳරුවන් ප්‍රනාන්දු	132/4,ජනඋදාන ගම,වැකඩ	29	1,444,500.00
15	සිරියලතා ක්‍රිස්ටෝපර්	128/6,ජනඋදාන ගම,වැකඩ	32	1,494,000.00
16	මහමරක්කල පටබැඳිගේ ටානියා ඉෂාරා ඩයස්	132/4/A,ජනඋදාන ගම,වැකඩ	27	1,457,750.00
17	ගම්පලගේ නිශාන්ත මන්ජුල ෆොන්සේකා	132/4/B,ජනඋදාන ගම,වැකඩ	35	1,385,500.00
18	ගැලනිගම මේස්ත්‍රිගේ අසංක ජයනාත්	132/5,ජනඋදාන ගම,වැකඩ	4	4,437,000.00
19	රඹුක්කනගේ රුක්මනී ප්‍රනාන්දු	132/6,ජනඋදාන ගම,වැකඩ	37	1,107,000.00
20	රඹුක්කනගේ රෝහිනී ප්‍රනාන්දු	132/6/A,ජනඋදාන ගම,වැකඩ	36	1,228,500.00
21	ජයලත් පේඩිගේ ආරියදාස	132/7,ජනඋදාන ගම,වැකඩ	42	1,632,000.00
22	වැලිපිටියගේ සුමනාවතී සිල්වා	132/7/A,ජනඋදාන ගම,වැකඩ	43	1,814,750.00

23	ගාළුගේ දයානි ප්‍රනාන්දු	132/8,ජනඋදාන ගම,වැකඩ	40	454,750.00
24	තෙල්ගේ ප්‍රසන්න කුමාර	132/8/A,ජනඋදාන ගම,වැකඩ	41	1,054,000.00
25	වන්නකුවත්ත වඩුගේ චමින්ද රොෂාන්	132/9,ජනඋදාන ගම,වැකඩ	47	1,024,000.00
26	මහතෙල්ගේ ඥානවතී පීරිස්	132/10,ජනඋදාන ගම,වැකඩ	46	1,882,750.00
27	ලංකාහළුගේ නිලානි සොයිසා	132/10/A,ජනඋදාන ගම,වැකඩ	45	1,551,250.00
28	වැඩෙනකොණ්ඩ ආරච්චිගේ සුගත් ජානක ප්‍රනාන්දු	132/10/B,ජනඋදාන ගම,වැකඩ	44	1,389,750.00
29	තෙල්ගේ තිරෝමි පීරිස්	132/10/C,ජනඋදාන ගම,වැකඩ	53	436,000.00
30	ගාළුගේ නන්දන ගයන්ත ප්‍රනාන්දු	132/10/D,ජනඋදාන ගම,වැකඩ	51	756,500.00
31	බරුපලගේ විකාශ් සංදීප	132/11,ජනඋදාන ගම,වැකඩ	50	1,228,250.00
32	මහමරක්කල පටබැඳිගේ තරිඳු ක්‍රිෂාන්ත ඩයස්	132/12,ජනඋදාන ගම,වැකඩ	49	1,606,500.00
33	වන්නකු වත්ත වඩුගේ දුෂාන්ත ප්‍රනාන්දු	132/13,ජනඋදාන ගම,වැකඩ	48	1,585,250.00
34	ගැලණිගම මේස්ත්‍රිගේ වන්දිමා	132/14,ජනඋදාන ගම,වැකඩ	39	1,649,000.00
35	සිරිවැඩි වෙලාගේ නන්දාවතී	132/15,ජනඋදාන ගම,වැකඩ	33	2,020,500.00
36	ශාන්ත බුලත්සිංහලාගේ සුනිල් ශාන්ත කුමාර	132/16,ජනඋදාන ගම,වැකඩ	30	1,534,500.00
37	දළුවතුමුල්ල ගමගේ ශ්‍රියානි සිල්වා	132/17,ජනඋදාන ගම,වැකඩ	21	1,752,750.00
38	අන්තෝනිගේ සජිත් වාමික	132/18,ජනඋදාන ගම,වැකඩ	22	1,515,250.00
39	ගුස්තිඤ්ඤවඩුගේනිරංජලා නෙළුම් ද සිල්වා	132/19,ජනඋදාන ගම,වැකඩ	16	1,567,500.00
40	වරුෂහැන්නැදිගේ ප්‍රියන්ති මල්කාන්ති සොයිසා	132/21,ජනඋදාන ගම,වැකඩ	15	1,695,750.00
41	මග්ගොනගේ ශාන්ති විනිප්‍රීඩා මාලනී	132/22,ජනඋදාන ගම,වැකඩ	9	1,140,000.00

(ඊ.1.3) සෑම වර්ෂයකම අප්‍රේල් මාසයේ අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් උත්සව අත්තිකාරම් වශයෙන් රු 10,000/= ක මුදලක් සභාවේ ස්ථිර හා ආදේශක කාර්යය මණ්ඩලය වෙත ගෙවීම් සිදු කරනු ලබන අතර ඒ සඳහා චක්‍රලේඛයක්ද රජය විසින් නිකුත් කරනු ලැබේ.නමුදු මෙම වර්ෂයේ මේවන තෙක් අදාල චක්‍රලේඛය නිකුත් කර නොමැත.එම චක්‍රලේඛය මඟින් බොහෝ විට දන්වනු ලබන්නේ උත්සව අත්තිකාරම් සීමාව පිළිබඳවයි. උත්සව අත්තිකාරම් ස්ථිර,තාවකාලික,අනියම්

සේවකයින් වෙත ගෙවීමට ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 13 වන වගන්තිය යටතේ බාධාවක් නොමැති බැවින් හා ඒ සඳහා ප්‍රමාණවත් අරමුදල් ඇති බැවින් මෙම වර්ෂයේ උත්සව අත්තිකාරම් සභාවේ සේවකයින්ට හා කාර්යය මණ්ඩලයට සහා අරමුදලින් ගෙවීමටත් එය මසකට රු 1250/= බැගින් වාරික 08 කින් අයකිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු සභාපතිතුමා</u>

මෙම උත්සව අත්තිකාරම් ඩෙංගු සේවකයින් සඳහා ලබාදීමේදී වසර 10 ක සේවා කාලයක් ඇති ස්ථිර පත්වීමක් සහිත අයෙකුගේ ඇපකරයක් සහිතව මාස 06 කින් වැටුපෙන් අයකරන ආකාරයෙන් ලබාදීමටද කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය: විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ අතර 2022 වර්ෂය සඳහා උත්සව අත්තිකාරම් ලෙස රු 10,000.00 ක මුදලක් සභාවේ සේවකයින්ට හා කාර්යය මණ්ඩලයට සහා අරමුදලින් ගෙවීමටත් එය මසකට රු 1250/= බැගින් වාරික 08 කින් අයකිරීමටත් තීරණය විය.

(ඊ.1.4) ZA -2794 JCB රථය කසල අංගනයේදී අනතුරට ලක්වීම හේතුවෙන් නියෝජිත ආයතනය වන සෙනොක් ආයතනය මඟින් මෙම JCB රථයේ අළුත්වැඩියාවන් සිදු කර ගැනීම සඳහා හෝ නගර සභාවේ ලියාපදිංචි ආයතන මඟින් අළුත්වැඩියාව සිදුකර ගැනීම යෝජනා කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

මෙම රථය ලක්ෂ 20 ට ආසන්න මුදලක් වියදම් කරමින් අළුත්වැඩියා කර සභාව වෙත ගෙන ආවේ ළඟදී .එසේ තිබියදී නැවතත් කසල අංගනයේ ගාල්කර තිබියදී මෙසේ අනතුරට පත්වීම හා එහි අද පවතින්නාවූ තත්ත්වය පිළිබඳව ඉතා කණගාටුවෙන බවත් මෙම අනතුරට ලක්වීම පිළිබඳව වැඩ අධිකාරී මහතාගෙන් යම් පැහැදිලි කිරීමක් ලබාගත යුතු බවත් පවසා සිටින ලදී.

පෙ.ව.11.30 : ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් ගරු සභා අවස්ථාව කාරක සභා අවස්ථාවට පත්කළ යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව,කාරක සභා අවස්ථාවට පත්වන ලදී.

පෙ.ව. 11.40 - ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කාරක සභා අවස්ථාව, ගරු සභා අවස්ථාවට පත්කළ යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන්,කාරක සභා අවස්ථාව, ගරු සභා අවස්ථාවට පත්වන ලදී.

ගරු සභාපතිතුමා

වැඩ අධිකාරීතුමා පැහැදිලි කල පරිදි මෙම රථය කසල අංගනයේ ගාල් කර තිබියදී පෞද්ගලික අංශයේ කසල රැගෙන යනු ලබන ටිපර් රථයක් වැදීමෙන් මෙම අනතුර සිදුවී තිබෙනවා.මෙහිදී රක්ෂණ සමාගෙන් පැමිණ අදාළ රථය පරීක්ෂා කිරීමක්ද සිදුකර තිබෙනවා.අදාළ අනතුරට ලක්කළ පෞද්ගලික රථය අයත් ආයතනයෙන් වන්දි ලබා ගැනීම සඳහා පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඒ හරහා අළුත්වැඩියා කටයුතු ඉටු කිරීමට යොමු වුවහොත් අනතුර සම්බන්ධයෙන් නඩුවක් උසාවියේ විභාග වී එය අවසන් වන තෙක් JCB රථය පොලීසියේ රඳවා ගනු ලබනවා.එසේ සිදුවුවහොත් සැලකිය යුතු කාලයක් සභාවේ වැඩ කටයුතු සඳහා JCB රථය යොදා ගැනීමට නොහැකි වෙනවා.මේ සියළු කරුණු සලකා බලා යාන්ත්‍රික තාක්ෂණ නිළධාරියෙකුද සභාවේ සිටින බැවින් වැඩ අධිකාරීතුමා විසින් මාගේ අවසරයද සහිතව අනතුරට ලක්වූ කොටස් ගලවා නිරීක්ෂණය කරන ලදී. එහිදී වැඩ අධිකාරීතුමාගේ දැනුම අනුව එම බඳ කොටසේ සිදුවී ඇති අනතුර ෆයිබර් මඟින් සකස් කළ හැකි අතර අනෙත් කොටස් රථයේ නියෝජිත ආයතනයට යොමු කර මිල ගණන් ලබාගෙන එම කොටස් සඳහා පෞද්ගලික ආයතන වලින්ද මිලගණන් ගෙන වඩා අඩු මුදලකට ගත හැකි තැනින් එය මිලදී ගෙන සවිකළ හැකියි.ඒ අතරවාරයේ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරමින් අදාළ වියදම රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ හැකියි.

ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

ඉහත වැඩ අධිකාරීතුමා විසින් පැහැදිලි කළ අන්දමට JCB රථය අළුත්වැඩියා කිරීමට කටයුතු කළ හැකියි.නමුදු සභාව සතු සියළු වාහන නිසි පරිදි ,තෙමීමකට ලක්නොවන පරිදි ගාල් කිරීමටද කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

මේවන විට සභාවේ_යාන්ත්‍රික තාක්ෂණ නිළධාරියෙකුද සිටින බැවින් සියළු වාහන වල සොයා බැලීම් කටයුතු ඔහු වෙත පවරා තිබෙනවා.එමනිසා එම කටයුතු වල අධීක්ෂණය වැඩ අධිකාරීතුමා විසින්ද සිදුකරන ලෙස පවසා සිටින ලදී.එමෙන්ම බොලෙරෝ රථයේ සිදුකළ යුතු අළුත්වැඩියාවන් පිළිබඳ සොයා බලා එම අළුත්වැඩියාවන් නොපමාව සිදුකරන්න කියා මා විසින් උපදෙස් දී තිබුණද එම කටයුත්ත මේවන තෙක් ආරම්භ කර නැහැ.දැනට භාවිතා කරනු ලබන කුලී පදනමට ලබාගත් රථයට මාසයකට විශාල මුදලක් ගෙවනවා.එමනිසා එම බොලෙරෝ රථය කඩිනමින් අළුත්වැඩියා කිරීමට කටයුතු කරන්න.මෙසේ වාහන සම්බන්ධ කටයුතු පමණක් නොවෙයි ණයහිමි වෙන්කරන ලද ව්‍යාපෘතීන්ද වැඩ අවසන් කිරීමට ඇති බැවින් එම කටයුතු පිළිබඳව වැඩ අධිකාරීතුමා විසින් සොයාබලා කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

සභා සම්මුතිය: විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර අනතුරට ලක්වන ලද ZA -2794 JCB රථයේ එම කොටස් වැඩ අධිකාරීතුමා විසින් ගලවා නිරීක්ෂණය කළ අතර බඳ කොටසට සිදුවී ඇති අනතුර ෆයිබර් මඟින් සකස් කල හැකි

බව කාරක සභා අවස්ථාවේදී වැඩ අධිකාරීතුමා විසින් පැහැදිලි කරන ලදී.එමනිසා අදාළ අනතුරට ලක් උපාංගයේ මිලගණන් සෙනොක් ආයතනයෙන් ලබාගනිමින් එම මුදලට වඩා අඩුවෙන් ලබාගත හැකි බාහිර ආයතන මඟින් මිලගණන් ලබාගනිමින් අවම මිල යටතේ මිලදී ගැනීමටත් බඳ කොටසේ අළුත්වැඩියාව ෆයිබර් වැඩ කරන ආයතන මඟින් මිලගණන් ලබාගනිමින් අවම මිල යටතේ ඉටු කිරීමටත් තීරණය විය.

(ඊ.1.5) පාණදුර නගර සභාවට අයත් මහජන ක්‍රීඩාංගනයේ ගිණිකොන දිසාවෙන් ජනතාවගේ ශාරීරික සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා එලිමහන් භූමි ව්‍යායාම යන්ත්‍ර කට්ටල කිහිපයක් ප්‍රසම්පාදන රෙගුලාසි වලට අනුව මිල ගණන් කැඳවා මිලදීගෙන සවිකිරීමටත් ඒ සඳහා රාත්‍රී කාලයේ විදුලි ආලෝකය ස්වයංක්‍රීයව ක්‍රියාකරන සූර්යබල විදුලි පහන් ඔස්සේ ලබා ගැනීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා</u>

මෙම උපකරණ සෙවණ සහිත ස්ථානයක සවිකළ යුතු අතර එම උපකරණ සවිකරණ ස්ථානයේ බිම,මඩ නොවන පරිදි කුට්ටිගල් අල්ලා සකස් කිරීමද සුදුසු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය: විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර පාණදුර නගර සභාවට අයත් මහජන ක්‍රීඩාංගනයේ ගිණිකොන දිසාවෙන් ජනතාවගේ ශාරීරික සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා එලිමහන් භූමි ව්‍යායාම යන්ත්‍ර කට්ටල කිහිපයක් ප්‍රසම්පාදන රෙගුලාසි වලට අනුව මිල ගණන් කැඳවා මිලදීගෙන සවිකිරීමටත් ඒ සඳහා රාත්‍රී කාලයේ විදුලි ආලෝකය ස්වයංක්‍රීයව ක්‍රියාකරන සූර්යබල විදුලි පහන් ඔස්සේ ලබා ගැනීමටත් තීරණය විය.

(ඊ.1.6) 2022 මාර්තු මස කමිටු වාර්තා අනුමැතිය සඳහා මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

(ඊ.1.6.1) 2022.03.08 දිනැති මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය

ඒ අනුව 2022.03.08 දිනැති මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

පෙත්සම් කාරක සභාව

දිනය - 2022.03.08
වේලාව - පෙ.ව 10.00
ස්ථානය - පාණදුර නගර සභාවේ කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රීනී	අශෝකා රත්නමාලි මිය	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතා	නැත
7	ගරු නාගරික මන්ත්‍රීනී	පද්මා කොස්තා මිය	නැත
8	ගරු නාගරික මන්ත්‍රී	එච්. චන්දිම ඒ. පීරිස් මහතා	නැත
9	ගරු නාගරික මන්ත්‍රී	එම්.පද්මසිරි සිල්වා මහතා	නැත

සහභාගී වූ නිලධාරීන්

තනතුර	නම	පැමිණීම ඇත/නැත
වැඩ අධිකාරී	කේ.පී මායාරත්න මයා	ඇත
මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මයා	ඇත
තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මයා.	ඇත
තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර් තුෂාරා මිය.	ඇත
තාක්ෂණ නිළධාරී	එම්.ජී.සී.පී විජේරත්න මිය.	ඇත
සංවර්ධන නිලධාරී	ඒ.අයි අදිකාරම් මිය.	ඇත
ප්‍රජා සංවර්ධන නිලධාරී	හිජාස් මහතා	ඇත

2022.04.07 මහා සභා වාර්තාව

1.පෙත්සම - පාණදුර, වැලිපිටිය,ශාසනවංශ මාවත,අංක 53/15 දරණ ලිපිනයෙහි පදිංචි ඩබ්.ඒ.ඩී ඔනිකා විජේසූරිය මිය විසින් යොමු කර ඇති , "ඉඩමට වැසි වතුර ගලා ඒම" සම්බන්ධ ගැටළුව.

පැමිණිලිකරු - ඩබ්.ඒ.ඩී ඔනිකා විජේසූරිය

වග උත්තරකරු -ඩබ්.රත්නසිරි ප්‍රනාන්දු

මෙම ගැටළුවට අදාල වග උත්තරකරු සාකච්ඡාව සඳහා නොපැමිණි අතර කමිටු සාමාජික විජිත් විශ්වනාත් මන්ත්‍රීතුමා විසින් ගන්නා ලද දුරකතන ඇමතුමට අනුව එම මහතා පැමිණ අදහස් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව පහත තීරණය ගන්නා ලදි.

කමිටුව විසින් ගන්නා ලද තීරණය -

දෙපාර්ශවය නිවසේ රැඳී සිටින අවස්ථාවක පූර්ව දැනුම් දීමකින් අනතුරුව නැවත ස්ථාන පරීක්ෂා කර විසඳුමක් ලබා දීමට කමිටුව තීරණය කරන ලදි.

2.පෙත්සම - පාණදුර, මඩකුඹුර,සගමිත් මාවත,අංක 11 හි පදිංචි ආර්.එස් කුමුදිනී පිංතු මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති, "අනතුරුදායක පොල් ගස" සම්බන්ධ ගැටළුව.

පැමිණිලිකරු - ආර්.එස් කුමුදිනී පිංතු මිය

වග උත්තරකරු - අයිරාංගනී සිල්වා මිය, පුෂ්පානන්ද සිල්වා මයා

මෙම ගැටළුවට අදාල දෙපාර්ශවයම කරුණු ඉදිරිපත් කරන ලද අතර දැනට අනතුරුදායක පොල් ගස කම්බියකින් ඇද ඇති බව වග උත්තරකරු දන්වන ලදි. එසේ සිදු කළද සිහින් කම්බියකින් බැඳ ඇති බැවින් අනතුරුදායක තත්වය පහව ගොස් නොමැති බව පැමිණිලිකරු පැවසූ බැවින්, කමිටුව පහත තීරණය ගන්නා ලදි.

කමිටුව විසින් ගන්නා ලද තීරණය -

ඒ අනුව, දෙපාර්ශවය දැනුවත් කර, නැවත කාරක සභාව විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර තීරණයක් ලබා දීමත් ඊට පෙර, ගස් අයිතිකරු විසින් හා පූර්ව සූදානමක් ලෙස ගස ශුද්ධ කර පොල් ගෙඩි කඩා, ජීවිත අනතුරක් නොවන ලෙස කටයුතු කර ඒ බව සභාවට දැන්විය යුතු බවටත් තීරණය කරන ලදි.

3.පෙත්සම - පාණදුර,කුරුප්පුමුල්ල, වුඩ්ලන්ඩ්ස්, අංක 46/2 සී, ඩී.පී කිතුලගොඩ මයා විසින් ඉදිරිපත් කර ඇති , "ස්වභාවික ජල බැස්ම අවහිර කිරීම නිසා වැසි ජලයෙන් නිවස යට වීම" සම්බන්ධ ගැටළුව.

පැමිණිලිකරුවන් - වෛද්‍ය ඩී.පී කිතුලගොඩ

වග උත්තරකරු - චක්‍රී කිලොෂිණී සෙනෙවිරත්න , ඉන්දුමතී සෙනෙවිරත්න

මෙම ගැටළුවට අදාල දෙපාර්ශවය කමිටුව සඳහා පැමිණි අතර වග උත්තරකරු වෙනුවෙන් අදාල ඉඩමේ මුල් අයිතිකරු වන සී.ජේ සෙනෙවිරත්න මහතාද සහභාගී විය.

සී.ජේ සෙනෙවිරත්න මහතා සිදුකළ ප්‍රකාශය -

සැලසුම් අංක 210 හි දැක්වෙන බිම් කොටස් තම පවුලේ බිම් කොටස් බෙදා වෙන් කිරීමක් බව පවසන ලද අතර එය දකුණු මායිමේ 1,2,3 යන බිම් කොටස් සාමාන්‍ය මට්ටමට වඩා පහළින් දකුණු දිශාවේ මායිමට ආනතව පිහිටා තිබූ බව පවසයි. වත්මනේ එහි ලොට් අංක 02 හි, පැමිණිලිකාර පාර්ශවය (කිතුලගොඩ මහතා)

මෙම තම බිම් කොටස ස්වභාවික ජල බැස්මට අවහිර වන පරිදි උස් මට්ටම් කර බැම් දමා සකස් කර ඇති බැවින් ස්වභාවික ජල බැස්ම අවහිර වීමෙන් වැසි ජලය රඳා පවතින බව දන්වයි.

මෙයට පෙර,සාකච්ඡාවකදී මෙම ප්‍රශ්නයට විසඳුම් ලෙස ප්‍රවේශ මාර්ගයේ අවසානයේ මාර්ගය තුල වැසි ජල ටැංකි යෙදීමට කතිකා කර ගත්තද ඒ සඳහා ප්‍රතිපාදන සපයා ගැනීමට පුද්ගලයින් ඉදිරිපත් නොවන බැවින් එසේ කිරීමට හැකියාවක් නොමැති බවද පවසයි.මේ සම්බන්ධයෙන් මෙම නගර සභාව මෙම පස් පිරවීම පිළිබඳ නිවේදන නිකුත් කර ඇති බවද ගොනුවේ සඳහන් කර ඇත.

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

නැවත පෙත්සම් කාරක සභාවේ කමිටු සාමාජිකයින් විසින් ස්ථාන පරීක්ෂාවක් සිදු කර විසඳුමක් ලබා දීමට කමිටුව තීරණය කරන ලදි.

04. පාණදුර, වෑකඩ.සොලමන් මාවත අංක 1/66 ලිපිනයෙහි පදිංචි ඩබ්. කමල් පුෂ්ප කුමාර් ප්‍රනාන්දු මයා විසින් යොමු කර ඇති - අංක 54 දරණ පිඹුරේ ජලය බැස්සවීම සඳහා වෙන්කර ඇති කාණුව නිසි පරිදි සකස් කරදෙන මෙන් ඉල්ලා සිටීම.

පැමිණිලිකරු - ඩබ්.කමල් පුෂ්පකුමාර් ප්‍රනාන්දු මයා

වග උත්තරකරු - රජිතා රත්මලී ප්‍රනාන්දු මිය

මෙම ගැටළුවට සම්බන්ධ පැමිණිලිකරු 2021.12.28 දිනැති පෙත්සම් කාරක සභාව සඳහා සහභාගී වී කරුණු ඉදිරිපත් කළ අතර අද දින වග උත්තරකරු පැමිණ කරුණු ඉදිරිපත් කරන ලදි.

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

මෙම කාණු මාර්ගයට අදාල ගැටළුව ඉඩමේ මායිම් පිළිබඳ ප්‍රශ්නයක් බව වග උත්තරකාර පාර්ශවය දන්වා සිටින බැවින් පැමිණිලිකාර පාර්ශවයේ බිම් කොටස සහ වග උත්තරකරුගේ බිම් කොටස වෙන වෙනම මිනුම් කර මායිම සකසා ගැනීමෙන් අනතුරුව කාණු මාර්ගය නිදහස් වන බැවින්, ඒ සම්බන්ධව සභාවේ මානක තැන ලවා ඉටු කරවා ගැනීමටද එහි බරපැණ දෙපාර්ශවය දැරිය යුතු බවටද කාරක සභාව තීරණය කරන ලදි.

5.<u>පෙත්සම</u> -

පාණදුර,ඩයස් පෙදෙස,අංක 2/74නිවස ඉදිරිපිට පවත්නා අනවසර ඉදිකිරීම සම්බන්ධ ගැටළුව.

පැමිණිලිකරු - සමන්ති ප්‍රනාන්දු මිය,

පළමු වග උත්තරකරු - රෝහණ පල්ලියගුරු මයා

දෙවන වග උත්තරකරු - ජී.කපිල රේණුක මයා

මෙම ගැටළුව පිළිබඳ සාකච්ඡාව සඳහා, පැමිණිලිකරු සහ දෙවන වග උත්තරකරු නොපැමිණෙන ලදි. පැමිණිලිකරු, සභාව අවස්ථාවේ දුරකතන ඇමතුමක් ලබා දුන් අතර එම සංවාදය speaker phone යොදා සියලු දෙනාට අසන්නට සැලැස්වීය. එහිදී පැමිණිලිකරු ප්‍රකාශ කොට සිටියේ, අනවසර තාප්ප කොටස කඩා ඉවත් කිරීම අවශ්‍ය නොවන බවත්, වෙනදා මෙන් කාණුව ශුද්ධ කිරීම සඳහා යාමට තිබූ කඩුල්ල නැවත සකසා දෙන ලෙසත්ය.

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u>

වයි.බී.කේ කොස්තා මිනින්දෝරු මහතා විසින් මැන සකස් කරන ලද 3609 මානක සැලැස්මේ ලොට් A3 හි උතුරු දිශාවෙන්, වැසි ජලය බැස යාම සඳහා ඇති, සැලැස්මේ දැක්වෙන කාණුවට ඉහලින් ඉදිකර ඇති තාප්පයෙහි අඩි 1'.0" X 1'.0" ප්‍රමාණයේ විවරයක් සෑදීමෙන් කාණු කොටස පැමිණිලිකාරියට පැහැදිලිව පෙනෙන පරිදි සෑදීම සඳහා එකඟ වන අතර තාප්පයේ ස්ථායිතාවයට හානි නොවන ලෙසත්, ජලය බැස යන කාණුවේ වෙනත් අපද්‍රව්‍ය (කුණු රොඩු) නොදැමිය යුතු බවත්, තවද සතුන්ට ඇතුළු නොවිය හැකි ලෙස කුඩා දැලකින් ආවරණය විය යුතු බවටත් වග උත්තරකරු එකඟ විය.

තවද, මෙම කාර්යය, වග උත්තරකරු නිවසේ රැඳී සිටින අවස්ථාවක, ඔවුන් දැනුවත්ව සිදු කළ යුතු බවටත් එකඟ විය.

06.<u>පෙත්සම</u> -

කුරුප්පුමුල්ල නගර සභා නිවාස යෝජනා ක්‍රමයට අයත් බිම් කොටසක් පවරා දීම සම්බන්ධවයි.

ඉල්ලම්කරු - ඒ.සෝමපාල පෙරේරා මයා,අංක 54/15, තුඩුව,පාණදුර.

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u>

මේ කරුණ සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගැනීමට සභාවේ නීති නිලධාරී කටයුතු කරමින් සිටින බැවින් යථා කාලයේදී ඒ පිළිබඳව දැනුම් දීමට තීරණය කරන ලදි.

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.03.08 දිනැති මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.6.2) 2022.03.10 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය

ඒ අනුව 2022.03.10 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

<u>පාණදුර නගර සභාව</u>

<u>සෞඛ්‍ය,පරිසර හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව</u>

දිනය : - 2022.03.10

වේලාව : - පෙ.ව. 10.00

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු උපසභාපති	පී.එච්.විල්මන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	එම්. කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	පුෂ්පා ෆොන්සේකා මිය	ඇත
8	ගරු නාගරික මන්ත්‍රී	එච්.චන්දිම ඒ.පීරිස් මහතා	නැත
9	ගරු නාගරික මන්ත්‍රී	ගයා උදයංගනී ද සිල්වා මිය	නැත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මහතා	ඇත
3	මහජන සෞඛ්‍ය පරීක්ෂක	ආර්.පී.ඒ.සඳරුවන් මහතා	ඇත
4	තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මහතා	ඇත
5	කළමනාකරණ සේවා නිළධාරී	එම්.ආර්.එම්.ඉජාස් මහතා	ඇත

01. කසලාංගනයේ ඇති වාහන ඇතුළු සියළු වාහනවල ටයර් හා රෝදවල නඩත්තු කටයුතු වාද්දුව "සස්වා" ආයතනය මඟින් සිදුකරගන්නා අතර අදාළ ආයතනය වසා ඇති අවස්ථාවන් වලදී අදාළ නඩත්තු කටයුතු සඳහා අතිරේකව තවත් සේවා සැපයීමේ ස්ථානයක සහය ලබා ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

වාහනවල නඩත්තු කටයුතු සඳහා "සස්වා " ආයතනය හැර වෙනත් ආයතනයක් ලියාපදිංචි වී නොමැති බැවින් හදිසි අළුත්වැඩියාවන් සඳහා සේවා සපයා ගැනීම නගර සභා කාර්යාලය අවට ඇති සේවා සැපයීමේ ස්ථානයන් වෙතින් මිල ගණන් ලබාගෙන අවම මිල ගණන් ලබාදී ඇති ආයතනය මඟින් ඉටු කර ගැනීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. වාහනවල සිදුවන හදිසි නඩත්තු කටයුතු සඳහා වෙනත් සේවා සපයන ස්ථානයන්හි සහය ලබාගැනීමට සිදුවන අවස්ථාවන්වලදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

වාහනවල සිදුවන හදිසි නඩත්තු කටයුතු සඳහා වෙනත් සේවා සපයන ස්ථානයන්හි සහය ලබාගැනීමට සිදුවන අවස්ථාවන්වලදී ගෙවීම් කිරීම සඳහා රු 10,000.00 ක අත්තිකාරම් මුදලක් ලබාගැනීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

03. ටී.ඩී.ලලනි රේණුකා යන අය විසින් ගවයන් දෙදෙනෙකු තණකොළ කෑම සඳහා මිනුවන්පිටිය සුසාන භූමිය තුළට දැමීම සඳහා අවසර ඉල්ලමින් ඉදිරිපත් කරන ලද ලිපිය සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

සොහොන් කොත් වලට හානි නොවන අන්දමින්,සොහොන් කොත් නොමැති ස්ථානයක ගැටගසා තණකොළ කෑම සඳහා ගවයින් දෙදෙනා සුසාන භූමිය තුළට දැමීම කමිටුව විසින් නිර්දේශ කළ අතර මෙහිදී ගවයන් දෙදෙනා රාත්‍රී කාලයේදී නැවත රැගෙන යාම සිදුකළ යුතු බවත් ගවයන් මඟින් යම් අලාභහානියක් සිදුවුව හොත් සභාව විසින් තීරණය කරනු ලබන අලාභයේ වටිනාකම ගෙවීමට අදාළ පාර්ශවයේ එකඟත්වය ලිඛිතව ලබාගැනීමට කටයුතු කිරීමත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04. කසල කළමනාකරණ ක්‍රියාවලිය විධිමත් කරගැනීමේ අරමුණින් සියළු කලාපයන්හි ට්‍රැක්ටර් රථ සඳහා වාදනයන් සහිත විද්‍යුත් සීනු සවිකිරීම මින් පෙර සිදුකරන ලදී.එමෙන්ම ඒවායේ පැමිණි තාක්ෂණික දෝෂයන් හේතුවෙන් අවස්ථා කිහිපයකදී මෙම සීනු අළුත්වැඩියාවන් කිරීමට සිදු විය.මේවන විට උපාංග නැවත භාවිතා කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබේ.එම නිසා නැවත සුදුසු ප්‍රමිතියකින් යුක්ත විද්‍යුත් සීනු ට්‍රැක්ටර් රථ සඳහා සවිකිරීමට සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

නිසි ප්‍රමිතියෙන් යුත් සීනු මිලදී ගෙන ට්‍රැක්ටර් රථ සඳහා සවිකිරීමත් විද්‍යුත් මෙවලම,වර්ෂාවට නොතෙමෙන අයුරින් ආවරණය කිරීමත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

05. අංක LL 6996 දරණ නිල් පැහැති ටිපර් රථය සඳහා අමතර ටයර් 02 ක් ලබා ගැනීමට සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

LL 6996 දරණ නිල් පැහැති ටිපර් රථය සඳහා අමතර ටයර් 02 ක් ලබා ගැනීම කමිටුව විසින් නිර්දේශ කළ අතර ටයර් ,නැවත පිරවුම් කර භාවිතයට ගත හැකි බැවින් මේවන විට ගෙවී ඇති ටයර් දෙකක් නැවත පුරවා භාවිතයට ගත හැකිද යන්න පරීක්ෂා කිරීම සිදුකරන ලෙසත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

06. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

6.1 නගරයේ සියළු කොට්ඨාශවල, සෞඛ්‍ය අංශයෙන් සිදුකළ යුතු වැඩ ලැයිස්තුවක් සකස් කර අදාළ කාර්යයන් උපපරිපාලක මහතුන් ලවා ඉටු කර ගැනීමේ වගකීම සෞඛ්‍ය පරිපාලක එස්.ඒ. ප්‍රියන්ත මහතා වෙත පැවරීමත් අධීක්ෂණය මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් මඟින් සිදුකිරීමත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.2 කෙරවලපිටිය කසල මඟින් විදුලිය ජනනය කරන මධ්‍යස්ථානය,සෑම වසරකම මාස 02 ක 03 ක කාලයක් වසා තබන බවට තොරතුරු ලැබී ඇති බැවින් එම කාලසීමාවන් පිළිබඳව අදාළ ආයතන මඟින් දැනුවත් වී එම කාලසීමාව තුළ නගරයේ කසල කළමනාකරණ කටයුතු සඳහා නිසි වැඩ පිළිවෙලක් සංවිධානය කර තබා ගත යුතු බව ගරු සභාපති නන්දන ගුණතිලක මහතා පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින් විසින් නිර්දේශ කරන ලදී.

6.3 වැකඩ,සොලමන් මාවත ක්‍රීඩා පිටිය අවට මාර්ගයේ කසල බැහැර කිරීම සිදුවන අතර එම කසලවල පවතින ප්ලාස්ටික් හා පොලිතීන් ගිනි තැබීම හේතුවෙන් ඇතිවන දුමාරය ප්‍රදේශයේ පරිසර දූෂණයට හේතුවන බව ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මහත්මිය විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මෙම කසල දෛනිකව ඉවත් කිරීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.4 වලාන,වත්තල්පොල පාරේ ,පියසේන මහතාගේ නිවස අසලින් ආරම්භ වන කාණුව අවහිර වී දුහද හමන බැවින් එම කාණුව පිරිසිදු කළ යුතු බව ගරු සභාපති නන්දන ගුණතිලක මහතා පවසා සිටි අතර එම කාණුව කඩිනමින් පිරිසිදු කිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.5 කුරුප්පුමුල්ල ළමා ක්‍රීඩාංගණය අසළ ඇති නිවාස වලින් කසල රැගෙන යාම සිදුනොවන බවට අදාළ ප්‍රදේශවාසීන් විසින් පවසා සිටින බව ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා විසින් පවසා සිටි අතර ඒ පිළිබඳව සොයා බලා කසල අදාළ නිවාස වලින් ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.6 උඩහමුල්ල,ගයන්ග ලක්රුවන් මහතාගේ නිවසේ ගලි අපජලය මාර්ගය වෙත පැමිණීමෙන් ප්‍රදේශයේ ජනතාව අපහසුතාවයට පත්වන අතර මේ පිළිබඳව කිහිප අවස්ථාවකදී පැමිණිලි ඉදිරිපත් කළද ඒ සඳහා පියවරක් නොගන්නා බව ගරු නාගරික මන්ත්‍රී අශෝකා රත්නමාලි මිය විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මෙය ජනතාව පීඩාවට පත්වන සෞඛ්‍යමය ගැටළුවක් බැවින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් විසින් අදාළ ස්ථානීය පරීක්ෂාවන් කර ඒ සඳහා නීතිමය පියවරයන් වෙත එළඹීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.7 දිබ්බැද්දේ ආසිරි උයනේ අළුතින් ඉදිකිරීම් සිදුකරනු ලබන වැඩ බිමක,ඉදිකිරීම් සඳහා ගෙනැවිත් ඇති කළුගල් එම ඉඩම ආසන්නයේ ජලය ගලා බසින කාණුව අවහිර වන සේ දමා ඇති අතර අදාළ ඉඩමේ අයිතිකරුවෙකුද සොයා ගැනීමට අපහසු වී ඇති බව මහජන සෞඛ්‍ය පරීක්ෂක සඳරුවන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මෙම කළුගල් හේතුවෙන් ජලය ගලා යෑම අවහිර වී ඇති බැවින් එම කළුගල් සභාව වෙත ගෙනෙමින් එම අවහිරතාව ඉවත් කිරීමට කටයුතු කිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.8 උයන්කැලේ ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් වාර්තා වීම හේතුවෙන් ප්‍රදේශය පරීක්ෂා කිරීමේදී එක් මහල් නිවාසයක ඉහළ මාලයේ ජල ටැංකියක වතුර රැඳී එහි ඩෙංගු මදුරු කීටයන් හඳුනාගත් බව මහජන සෞඛ්‍ය පරීක්ෂක සඳරුවන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මෙම නිවසේ හිමිකරු පිළිබඳ සොයා බැලීමේදී අදාළ හිමිකරු වෙත අයත් දේපලක් වුවද එහි කිසිදු පුද්ගලයෙකු පදිංචි වී නොමැති බවත් මේ සඳහා නීතිමය ක්‍රියාමාර්ගයන් වෙත එළඹීමට කටයුතු නොකරන ලෙස අදාළ හිමිකරු විසින් ඉල්ලා සිටින බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂක සඳරුවන් මහතා විසින් පවසා සිටින ලදී.හිමිකරු අදාළ ස්ථානයේ පදිංචි වී නොසිටීම හා මීට පෙර ඩෙංගු කීටයන් අදාළ පරිශ්‍රයෙන් හමුවීම සම්බන්ධයෙන් අවවාද කිරීම් සිදුකර නොමැති බැවින් නීතිමය ක්‍රියාමාර්ගයන් වෙත එළඹීමට කටයුතු නොකරන ලෙස ඔහුගෙන් ලද ඉල්ලීම ලිඛිතව ලබාගනිමින් නීතිමය ක්‍රියාමාර්ගයන් වෙත නොගොස් අවවාද කිරීම පමණක් සිදුකිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.9 නගර සභා පිහිණුම් තටාකයේ ජලයෙහි ක්ලෝරීන් සංයුතිය විටින් විට අදාළ පුහුණුකරුවන්ගේ උපදෙස් අනුව වෙනස් කිරීම් සිදුකරන අතර මේ පිළිබඳව යම් නිශ්චිත වගකීමක් අදාළ සේවකයින් වෙත පැවරිය යුතු බව මහජන සෞඛ්‍ය පරීක්ෂක සම්පත් මොරමුදලි මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.පිහිණුම් තටාකය සම්බන්ධයෙන් පුහුණු නිළධාරීන් සභාව සතුව නොමැති අතර මෙම ජලයෙහි පැවතිය යුතු ක්ලෝරීන් සංයුතිය පිළිබඳව හා එය සකස් කළ යුතු ආකාරය පිළිබඳව පිහිණුම් තටාක පිළිබඳ දැනුම ඇති ආයතන මඟින් විමසීම් කර එම උපදෙස්වලට අනුව අදාළ දැනුවත් කිරීම් පිහිණුම් තටාකයේ සේවය කරනු ලබන සේවකයින් වෙත ලබාදීමත් අදාළ උපදෙස් පුවරුවක් මඟින් ප්‍රදර්ශණය කර තැබීමත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.03.10 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.6.3)2022.03.10 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය

ඒ අනුව 2022.03.10 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

දිනය : - 2022.03.10

වේලාව : - ප.ව. 12.30

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලින් හසන්ත රුදිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	ඇත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්. තුෂාරා මිය	ඇත
3	තාක්ෂණ නිළධාරී	ප්‍රසාදි විජේරත්න මිය	ඇත
4	තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මහතා	ඇත
5	අංශ ප්‍රධානී(කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
6	සංවර්ධන නිළධාරී(නීති)	ඉමල්කා වේරගම මිය	ඇත

01. PUC/05/03/01-04/2020 ලිපිගොනුවට අනුව LK-0776 ටිපර් රථය,PANADURA AUTO SERVICE ආයතනය මඟින් සේවා කරගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 25,940.00 ක මුදල ,එම ආයතනයට ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 25,940.00 ක මුදල, PANADURA AUTO SERVICE ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

02. PUC/05/03/01-23/2020 ලිපිගොනුවට අනුව ZE-0323 කම්පැක්ටර් රථය,PANADURA AUTO SERVICE ආයතනය මඟින් සේවා කරගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 24,915.00 ක මුදල ,එම ආයතනයට ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 24,915.00 ක මුදල, PANADURA AUTO SERVICE ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

03. PUC/05/03/01-06/2020 ලිපිගොනුවට අනුව ZA-5226 JCB රථය සඳහා බට දැමීම වෙනුවෙන්, M.R.Enterprises ආයතනය වෙත ගෙවිය යුතු රු 11,910.00 ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරමි.

රු 11,910.00 ක මුදල, M.R.Enterprises ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

04. PUC/05/03/01-05/2020 ලිපිගොනුවට අනුව ZA-2794 JCB රථයේ අළුත්වැඩියාවන් H.L.M.HOLDING ආයතනය මඟින් සිදුකිරීම නිසා එම ආයතනය වෙත ගෙවිය යුතු රු 1,949,890.00 ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

බිල්පත නිරීක්ෂණය කිරීමේදී පහත සඳහන් වැඩ සඳහා යොදා ඇති මිල ගණන් මේවන විට වෙළඳ පොලේ ඇති මිලගණන් හා සසඳ බැලීමේදී වැඩි අගයක් ගන්නා බවත් මෙම අළුත්වැඩියාවේදී ගලවා ඉවත් කරන ලද කොටස් නැවත සභාව වෙත භාරදී ඇත්නම් එම කොටස් වල ලැයිස්තුවක්ද කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා විසින් පවසා සිටින ලදී.

- **ඉදිරිපස බකට් එකේ ප්ලේට් දෙක ගලවා ඉවත් කර අලුතින් බකට් ප්ලේට් හා ගෙවී ගිය කොටස් අලුත්වැඩියා කිරීම,නැවත පෑස්සීම හා අලුතින් දත් 8 ක් නැවත සවිකිරීම- රු 110,000.00**

- ❖ ඉදිරිපස ලෝඩර් ආර්ම් එක ගලවා ගෙවී ගිය කොටස් පුරවා ලයින් බොර් කර සියලුම බුෂ් අලුතින් යොදා ,පින් පුරවා හෝ අලුතින් යොදා සවිකිරීම- රු**485,000.00**
- ❖ ට්‍රාන්ස්මිශන් පද්ධතිය සහ ඩිපරන්ශල් වල ඔයිල් සහ ෆිල්ටර් මාරුකර සර්විස් කිරීම- රු **25,000.00**

මෙම අළුත්වැඩියාව කිරීමට පෙර අදාළ ඇස්තමේන්තු කමිටුව වෙත ඉදිරිපත් කර නිසි කමිටු අනුමැතියද සභාව වෙත යොමුකර සභා අනුමැතියද ලබා ඇති අතර එම සභා වාරයන්හිදී මෙම මිල ගණන් පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා ඉදිරිපත් කරනු ලබන අදහස් දැක්වීමක් හෝ විරුද්ධත්වයක් කිසිදු සභිකයෙකුගෙන් ප්‍රකාශ වූයේ නැත.එමනිසා මේවන විට මෙම අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇත.නමුදු මේ අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා විසින් යම් විමසීමක් සිදුකරන බැවින් මෙම රථය අළුත්වැඩියා කටයුතු ආරම්භයේ සිට මේදක්වා වූ ක්‍රියාදාමය පිළිබඳ වාර්තාවක්ද අළුත්වැඩියාවේදී ඉවත් කරන ලදුව ,නැවත සභාව වෙත රැගෙන යා කොටස් පිළිබඳ වාර්තාවක්ද කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසු තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසා සිටි අතර ඒ අනුව මෙම කරුණ කල්තබන ලදී.

05. PUC/05/03/01-05/2020-ZA-2794 JCB රථය නගර සභාවට රැගෙන ආ පසුව හඳුනාගත් අළුත්වැඩියාවන් සඳහා නැවත JCB රථය , H.L.M.HOLDING ආයතනයට ගෙනගිය පසු එම ආයතනය විසින් ඉදිරිපත් කර ඇති අංක WP ZA 2794/03/JCB දරණ ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මෙම රථයේ ආරම්භයේ සිට සිදුකරන ලද අළුත්වැඩියාව පිළිබඳ වාර්තාව ,මීළඟ කමිටු වාරයට ඉදිරිපත් කිරීමෙන් පසු තීරණයක් ගැනීමට කල්තබන ලදී.

06. PUC/05/03/01-18/2020 ලිපිගොනුවට අනුව YN-6873 ත්‍රී රෝද රථය චතුර මෝටර්ස් ආයතනය මගින් අළුත්වැඩියා කර ගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 18,100.00 ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 18,100.00 ක මුදල, චතුර මෝටර්ස් ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

07. PUC/5/4/3/40/2020 හා වැකඩ පෙර පාසලේ ඉහල මහල ඉදිකිරීම -අදියර 02 ලිපිගොනුවට අනුව උක්ත ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහල ගොස් ඇති බැවින්,මිල ගණන් සංශෝධනය කර දෙන ලෙස ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය විසින් ඉල්ලා ඇත.එම ඉල්ලීම කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

එම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් අත්සන් තබා ඇත්තේ 2020.12.31 වන බැවින් මිල සංශෝධනය කල නොහැකි බැවින් මේවන තෙක් අවසන් කර ඇති වැඩ සඳහා අවසන් ගෙවීමක් සිදුකිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.ඉතිරිව ඇත්තේ ජනෙල් දොරවල් සවිකිරීම බැවින් එම ජනෙල් දොරවල් සභාවේ ඇති දැව මගින් ශ්‍රමය පිටතින් ලබාගනිමින් සකස් කර සවිකිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

08. PUC/05/01/පොදු/8/2021 ලිපිගොනුවට අනුව,ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි 2022.03.04 වන දින විදුලි අංශයේ වීථි පහන් දල්වන්නන් සමඟ රාජකාරී ක්‍රමවේදයක්(රාජකාරී කාලසටහනක්) ක්‍රියාත්මක කිරීමට පැවති සාකච්ඡාවේදී දැක්වූ පහත අදහස් කර්මාන්ත කමිටු සාකච්ඡාව සඳහා ඉදිරිපත් කරමි.

- වීථි පහන් දල්වන්නන් විසින් සේවය කරන පැය 45 සතියේ දිනවල පහත පරිදි ආවරණ කිරීමට ඉඩ දෙන ලෙස ඉල්ලීම.
  පෙ.ව.5.30 - පෙ.ව. 6.30 - පැය 01
  පෙ.ව.8.00 - ප.ව.14.00 - පැය 06
  ප.ව. 18.00 - ප.ව.20.00 - පැය 02

- සෙනසුරාදා ,ඉරිදා හා රජයේ නිවාඩු දිනවල පහත පරිදි අතිකාල සේවයේ යෙදීමට ඉල්ලීම
  පෙ.ව.5.30 - පෙ.ව. 6.30 - පැය 01
  පෙ.ව.8.00 - ප.ව.14.00 - පැය 06
  ප.ව. 18.00 - ප.ව.20.00 - පැය 02

- දිලික් මයාව කාර්යාලයට ගෙන්වීමටත්,වෙරළේ විදුලි පහන් නිවීම සඳහා වීථි පහන් දල්වන්නන් සතියකට වරක් මාරු කරමින් යෙදවීමට ඉල්ලීම.

- වීථි පහන් දල්වන්නන් හතර දෙනා උදයේ කාලයේ රාජකාරියට ගෙන්වීම සඳහා ඉල්ලීම
  ඉහත ආකාරයට ක්‍රියාත්මක වීමේදී ප.ව.14.00 ට පසු යම් හදිසි විදුලි නඩත්තු කටයුත්තක් සඳහා යෙදවීමට සේවකයින් නොමැති වන බැවින් වීථි පහන් දල්වන්නන් හතර දෙනා උදයේ කාලයේ රාජකාරියට ගෙන්වීම සඳහා සිදුකළ ඉල්ලීම පිළිබඳව සලකා බලන ලෙස විදුලි අධිකාරී කුසුම්සිරි මහතා විසින් ඉල්ලීම් කර ඇති අතර මෙහිදී වීථිපහන් දල්වන්නන් හතර දෙනා සමඟ සිදුකළ සාකච්ඡාවේදී ඔවුන් විසින් ඉල්ලා ඇති පරිදි මාසයක කාලයක් ක්‍රියාත්මක කර ඒ අනුව පැනනැගෙන ගැටළු පිළිබඳව සලකා බලා කටයුතු කිරීම සුදුසු බවත් වෙරළේ විදුලි පහන් නිවීම සඳහා වීථි පහන් දල්වන්නන් හතර දෙනා හා දිලික් මහතාද සමඟ සේවා මුරයක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී.ඒ අනුව පහත පරිදි රාජකාරී කාලසටහන ක්‍රියාත්මක කිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.
- **වීථි පහන් දල්වන්නන් විසින් සේවය කරන පැය 45 සතියේ දිනවල පහත පරිදි ආවරණ කිරීම**
  පෙ.ව.5.30 - පෙ.ව. 6.30 - පැය 01
  පෙ.ව.8.00 - ප.ව.14.00 - පැය 06
  ප.ව. 18.00 - ප.ව.20.00 - පැය 02

- **සෙනසුරාදා ,ඉරිදා හා රජයේ නිවාඩු දිනවල පහත පරිදි අතිකාල සේවයේ යෙදවීම**
  පෙ.ව.5.30 - පෙ.ව. 6.30 - පැය 01
  පෙ.ව.8.00 - ප.ව.14.00 - පැය 06
  ප.ව. 18.00 - ප.ව.20.00 - පැය 02

- **වීථි පහන් දල්වන්නන් හතර දෙනා හා දිලික් මයා ඇතුළුලත්ව වෙරළේ විදුලි පහන් නිවීම සඳහා සේවා මුරයක් ක්‍රියාත්මක කිරීම**

- **වීථි පහන් දල්වන්නන් හතර දෙනා උදයේ කාලයේ රාජකාරියට ගෙන්වීම**

09. PUC/05/02/පොදු/2022 ලිපිගොනුවට අනුව, නගර සභා ප්‍රධාන කාර්යාලයේ වහල මත සවිකර ඇති සූර්යය පැනල හේතුවෙන් සභාවේ විදුලි බිලෙහි අඩුවීම පිළිබඳ වාර්තාව කර්මාන්ත කමිටුවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

වර්ෂය	කාලසීමාව	මුළු විදුලි ඒකක ගණන	සෝලා පද්ධතියෙන් ලද ඒකක ගණන	මුදල් ගෙවිය යුතු ඒකක ගණන	ගෙවූ මුදල
2021	2020.12.03-2021.01.05	1319	392	927	21421.95
	2021.01.05-2021.02.05	1417	265	1146	26426.10

	2021.02.05-2021.03.03	1730	338	1392	32047.20
	2021.03.03-2021.04.05	2413	229	2184	50144.40
	2021.04.05-2021.05.04	1897	560	1337	30790.45
	2021.05.04-2021.06.03	845	565	280	5364.00
	2021.06.03-2021.07.03	1012	386	626	14544.10
	2021.07.03-2021.08.03	1027	275	752	17423.20
	2021.08.03-2021.09.03	713	403	310	5913.00
	2021.09.03-2021.10.04	666	604	62	1374.60
	2021.10.04-2021.11.04	951	389	562	13081.70
	2021.11.04-2021.12.05	1946	58	1888	43380.80
2022	2021.12.05-2022.01.05	2445	2	2443	56062.55
	2022.01.05-2022.02.04	1955	109	1846	42421.10

මෙම වාර්තාව වෙත අවධානය යොමු කිරීමේදී සූර්යය පැනල මඟින් ලැබිය යුතු නිසි ඒකක ගණන සභාව වෙත නොලැබෙන බව පෙනී යන අතර ගණනය කිරීමේදී සූර්යය පැනල මඟින් උත්පාදනය වී ජාතික විදුලි පද්ධතිය වෙත ලබාදෙන ඒකක ප්‍රමාණයද මුදලද සඳහන් කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා විසින් පවසා සිටින ලදී.එමෙන්ම මෙහිදී සූර්යය පැනල වලින් ලැබිය හැකි ඒකක ගණන අවම 1150 ක් ලෙස අදාළ ආයතනය විසින් නිකුත් කර ඇති ලිපිලේඛණ වල සඳහන් වුවද වාර්තාවට අනුව කිසිදු මාසයක එම අවම විදුලි ඒකක ප්‍රමාණයවත් උත්පාදනය වී නොමැත.විශේෂයෙන්ම ඒකක 02 ක් ලැබීම පිළිබඳව සලකා බැලිය යුතු වේ.මෙහිදී දෛනිකව උත්පාදනය වන ඒකක ප්‍රමාණය කුමක්ද යන්න නිරීක්ෂණය කළ හැකි මෙහෙයුම් පද්ධතියක් ඇති බැවින් එය ලබාගනිමින් මෙය අධීක්ෂණය කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා විසින් තවදුරටත් පවසා සිටින ලදී.

ඒ අනුව මෙම සූර්යය පැනල මඟින් උත්පාදනය වන අවම ඒකක ප්‍රමාණය උත්පාදනය නොවීම පිළිබඳවද එක් මසක ඒකක 02 ක් නිපදවීම පිළිබඳවද අදාළ ආයතනයෙන් විමසීම් කර වාර්තාවක් ලබාගැනීමත් ,අළුත්වැඩියා කටයුතු සිදුකිරීමත්, මෙම විදුලි ඒකක උත්පාදනය පිළිබඳ දත්ත ලබාගැනීමේ දුරකථන මෙහෙයුම් පද්ධතිය වැඩ අධිකාරීතුමා වෙත හා රසිකා මිය වෙත ලබා දෙමින් එය දෛනිකව අධීක්ෂණ කටයුතු සිදුකිරීමේ වගකීම භාරදීමත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

10. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

10.1 PUC/5/4/2/9-2021 හා කුරුප්පුමුල්ල ගාමිණී කොස්තා මාවත කොන්ක්‍රීට් කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් 10% අතරුදවුම් මුදල වන රු 71,574.99 ක මුදල,682ඒ,කුරුප්පුමුල්ල ඡ්‍යෝෂ්ඨ පුරවැසි එකමුතුව වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටුවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 71,574.99 ක මුදල, 682ඒ,කුරුප්පුමුල්ල ඡ්‍යෝෂ්ඨ පුරවැසි එකමුතුව වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

10.2 PUC/5/4/02/24-2021 හා රණවිරු නාලක අමරසිංහ මාවත සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් සකස් කර ඇති අවසාන බිල්පතට අනුව මුදල වන රු 180,925.41 ක මුදල,ඟිනෑන්ස්වත්ත සංවර්ධන සමිතිය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 180,925.41 ක මුදල, ඟිනෑන්ස්වත්ත සංවර්ධන සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

10.3 PUC/5/4/02/16-2021 හා ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය ඉදිරිපිට වූ මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් සකස් කර ඇති අවසාන ගෙවීම් වාර්තාව අනුව මුදල

වන රු 505,917.05 ක මුදල,මණ්ඩාවල පරාක්‍රම සුභ සාධක සමිතිය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 505,917.05 ක මුදල,මණ්ඩාවල පරාක්‍රම සුභ සාධක සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

10.4 PUC/5/2/13-2021 හා වික්‍රම මාවත කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් 10% ක අතරුදවුම් මුදල වන රු 70,245.79 ක මුදල,ඇටඹගොඩ අවමංගල්‍යාධාර හා සමාජ සේවා සමිතිය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටුවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 70,245.79 ක මුදල,ඇටඹගොඩ අවමංගල්‍යාධාර හා සමාජ සේවා සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

10.5 PUC/5/2/2/12-2021 හා පෙරේරා මාවත වරිපනම් අංක 1/10 සිට 5/10 දක්වා සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් 10% ක අතරුදවුම් මුදල වන රු 35,941.87 ක මුදල,ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටුවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 35,941.87 ක මුදල,ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

10.6 PUC/5/4/1/1-2020 හා වැඩ අංගනයේ සෞඛ්‍ය අංශ ගොඩනැගිල්ලේ බිම ටයිල් ඇතිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් 10% ක අතරුදවුම් මුදල වන රු 26,393.55 ක මුදල,ගිනෑන්ස්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටුවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 26,393.55 ක මුදල,ගිනෑන්ස්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

10.7 PUC/5/4/02/23-2021 හා තන්තිරිමුල්ල පුස්තකාලය ඉදිකිරීම අදියර 03 ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ ගිවිසුම්ගත මුදල ඉතාමත් අඩු බැවින් හා සෑම භාණ්ඩයකම මිල ගණන් ඉහළ ගොස් ඇති බැවින්,මිල සංශෝධනයක් කර දෙන ලෙස ඉදිරිපත් කර ඇති ඉල්ලීම කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොමැති බැවින් ඇස්තමේන්තුව, නව ගොඩනැගිලි ගාස්තු අනුව සංශෝධනය කිරීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

10.8 PUC/5/4/02/17-2021 හා වෑකඩ පෙර පාසලේ අමතර වැඩ ඉටු කිරීම අදියර 03 ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා මිල සංශෝධනයක් කර දෙන ලෙස ගිවිසුම්ගත සමිතිය විසින් ඉල්ලා ඇත.එකී ඉල්ලීමට අදාලව නව ගොඩනැගිලි ගාස්තු ලේඛණයේ දක්වා ඇති නව මිල ගණන් වැඩිවීම,ගිවිසුම්ගත දිනය හා ගලපා ,ප්‍රතිශතයක් වශයෙන් ලබාදීම සුදුසු බව වැඩ අධිකාරී විසින් නිර්දේශ කර ඇත.ගිවිසුම්ගත දිනය 2021.12.30 වන අතර අවසන් වන්නේ 2022.03.30 දින වේ.කර්මාන්ත කමිටු සාකච්ඡාවට ඉදිරිපත් කරන ලදී.

නව ගොඩනැගිලි ගාස්තු ලේඛණයේ දක්වා ඇති නව මිල ගණන් වැඩිවීම,ගිවිසුම්ගත දිනය හා ගලපා ,ප්‍රතිශතයක් වශයෙන් ලබාදීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

10.9 පාණදුර නගර සභාව සතු මේවන විට මැනුම් කටයුතු සිදු කර ඇති ඉඩම් පිළිබඳ පහත වාර්තාව කර්මාන්ත කමිටුවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

ඔප්පුවක් හෝ පිඹුරු පතක් නොමැති ඉඩම්	මිනින්දෝරු තැන විසින් මැනුම් කටයුතු සිදුකර ඇති ඉඩම්	මේවන විට පිඹුරුපත් ලබාදී ඇති ඉඩම්
ගොඩපරගහවත්ත-මාලමුල්ල	මැනුම් කටයුතු සිදුකර නොමැත. මිනින්දෝරු වෙත දන්වා යවා ඇත.	–
නල්ලූරුව සුසාන භූමිය	මැනුම් කටයුතු සිදුකර නොමැත. මිනින්දෝරු වෙත දන්වා යවා ඇත.	–
නල්ලූරුව මෝදරවිල කියවීම් ශාලාව(ගාලුපාරට මායිම්ව)	මැනුම් කටයුතු සිදු කර ඇත.	මේ වන තෙක් පිඹුර ලබාදී නොමැත.
උයන්කැලේ නගර සභා නිවාස අසල ඉතිරි බිම් කැබලි	මැනුම් කටයුතු සිදුකර නොමැත. මිනින්දෝරු වෙත දන්වා යවා ඇත.	–
සාගර මාවත ළදරු පාසල පිහිටි ඉඩම	මැනුම් කටයුතු සිදුකර නොමැත. මිනින්දෝරු වෙත දන්වා යවා ඇත.	–
පොලවත්තේ ගොඩනැගිලි හා ඉඩම ධර්මශාලා මාවතට මායිම්ව	මැනුම් කටයුතු සිදුකර නොමැත. මිනින්දෝරු වෙත දන්වා යවා ඇත.	–
තුඩුව ශ්‍රී මේධානන්ද පාර ශාඛා පුස්තකාලය	මැනුම් කටයුතු සිදු කර ඇත.	මේ වන තෙක් පිඹුර ලබාදී නොමැත.
නගර සභා ක්‍රීඩා පිටිය පිහිටි ඉඩම	මැනුම් කටයුතු සිදු කර ඇත.	මේ වන තෙක් පිඹුර ලබාදී නොමැත.
කවිරාජ මාවත පුස්තකාලය පිහිටි ඉඩම	මැනුම් කටයුතු සිදු කර ඇත.	මේ වන තෙක් පිඹුර ලබාදී නොමැත.
සුමනධීර මාවතේ පිහිටි ඉඩම	මැනුම් කටයුතු සිදු කර ඇත.	මේ වන විට පිඹුර ලබාදී ඇත.
වෙරළ උද්‍යානයේ පැරණි පුස්තකාලය පිහිටි ඉඩම	මැනුම් කටයුතු සිදු කර ඇත.	මේ වන විට පිඹුර ලබාදී ඇත.

වාර්තාව වෙත කමිටුවේ අවධානය යොමුවන ලදී. ගොඩපරගහවත්ත-මාලමුල්ල ඉඩම සම්බන්ධයෙන් පාණදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නාගරික සැලැස්ම ගෙන්වා ගනිමින් ඒ සඳහා සභාවේ අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කිරීම කමිටුව විසින් නිර්දේශ කල අතර මිනින්දෝරුවන් හා සම්බන්ධ වෙමින් කඩිනමින් අදාළ ඉඩම්හී මැනුම් කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

10.10 PUC/5/4/1/10-2021 හා වීදිනාම පුවරු සැකසීම ලිපිගොනුවට අනුව නගර සභා සීමාවට අයත් මාර්ග වල වීදිනාම පුවරු සවිකිරීම සඳහා විවිධ පාර්ශවයන් විසින් ඉල්ලා ඇත.එම පුවරු සවිකිරීම සඳහා අනුග්‍රාහක දායකත්වයන් සොයා ගත යුතු බැවින් අනුග්‍රාහකයන් සොයා ගන්නා ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරන ලදී.

ආයතන වෙතින් විමසීම් කර හා සහිකයින් මාර්ගයේන් අනුග්‍රාහක දායකත්වය ආයතන මඟින් ලබාගැනීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

10.11 PUC/5/4/3/34/2020 හා තන්තිරිමුල්ල පුස්තකාලය අළුත්වැඩියා කිරීම ඇස්තමේන්තු 1 වන අදියර ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කරගෙන යාමේදී කොටස් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත.ඒ අනුව සකස් කරන ලද රු 978,446.10 ක කොටස් මුදල ස්වශක්ති සංවිධානය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 978,446.10 ක කොටස් මුදල ස්වශක්ති සංවිධානය වෙත ගෙවීම,කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

10.12 පාන/05/02/අන.ඉදි/2016/21 ගොනුවට අනුව පාණදුර,උඩහමුල්ල,අංක 37/1 බී ස්ථානයේ පවතින ඉදිකිරීම සම්බන්ධව (එච්.වී.ගාමිණී-ඩබ්.ජී.ලක්රුවන් මහතා සම්බන්ධ ගැටළුව) මෙවන විට අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින අතර මේ දක්වා විවිධ ඉදිකිරීම් සිදු කර ඇති බව වරින් වර ලැබෙන පැමිණිලි පරීක්ෂාවේදී නිරීක්ෂණය වන බැවින්,මේ සම්බන්ධව කර්මාන්ත කමිටුවේ සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

මේ පිළිබඳව අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් අදාළ තීන්දුව ලද පසු සලකා බැලීමට කල්තබන ලදී.

10.13 ජයන්තිපුර නිවාස යෝජනා ක්‍රමයේ ඉඩම් කොටසක ඇති කොස්ගස් දෙක කපා එහි ලීද උළුවහු දොරජනෙල් සකස් කිරීම සඳහා භාවිතයට ගත හැකි බව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් පවසා සිටින ලදී.ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිසි අවසරය ලබාගනිමින් එම කොස්ගස් දෙක කපා ලී ලබා ගැනීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.03.10 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.6.4) 2022.03.22 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය

ඒ අනුව 2022.03.22 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

<u>පාණදුර නගර සභාව</u>

<u>කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව</u>

දිනය : - 2022.03.22

වේලාව : - පෙ.ව. 10.00

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

<u>කමිටු සාමාජිකයින්</u>

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත

2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	ඇත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්.තුෂාරා මිය	ඇත
3	අංශ ප්‍රධානී(කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
4	කළමනාකරණ සේවා නිළධාරී	කේ.කේ.කේ.ගංගා කුමාරි මිය	ඇත

01. PUC/5/4/1/5-2022 මිනුවන්පිටිය සුසාන භූමියේ අළුකුටි ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකස් කර ඇති රු 1,150,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මෙම අළුකුටි ඉදිකිරීමේදී නව්‍ය ආකාරයෙන් ඉදිකළ යුතු අතර අළුකුටි තාප්පයට අල්ලා සකස් කිරීම වෙනුවට ඇවිදින මංතීරුවක් ලෙස කුට්ටගල් අතුරා මාර්ගය සකස් කර ඒ දෙපස අළුකුටි ඉදිකිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව ඉහත ඇස්තමේන්තුගත මුදලට ආසන්න වන සේ ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද අදහසට අනුව නැවත ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. PUC/5/4/1/14-2021 ඕබට් සිල්වා කියවීම් ශාලාව සහ පරණ මස්ටරය පැවැත්වූ ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව ලිපිගොනුවට අනුව 2022.03.03 දින මහා සභා තීරණ අංක 7.1 අනුව එම ව්‍යාපෘතියේ මිල ගණන් සංශෝධනය කිරීමට තීරණය වී ඇති බැවින් 62% ක මිල වැඩි වීම අනුව සකස් කර ඇති සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,786,899.34 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

03. PUC/5/4/1/5-2021 මිනුවන්පිටිය ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම ලිපිගොනුවට අනුව එකී අළුත්වැඩියා කටයුතු එල්.ඒ .එල්.ලියනාරච්චි ආයතනය විසින් සිදුකර ඇති අතර අදාළ ඇස්තමේන්තුවේ සඳහන් වන c

channels එක හොඳ තත්ත්වයේ පවතින බැවින් එය මාරු කර නොමැත.එබැවින් එයට අදාල වන රු 30,000.00 ක මුදල අඩුකර,ඉතිරි මුදල වන රු 540,000.00 ක මුදල එල්.ඒ .එල්.ලියනාරච්චි ආයතනය වෙත ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 540,000.00 ක මුදල එල්.ඒ .එල්.ලියනාරච්චි ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

04. PUC/05/03/01-01/2020 ලිපිගොනුවට අනුව PE-6871 කැබ් රථය සඳහා පිටුපස ජැක් 02 ක් හා අගුල් දෙකක් ELCARDO TRADING (PVT) LTD ආයතනය මඟින් සවිකිරීම නිසා එම ආයතනය වෙත ගෙවිය යුතු රු 20,000.00 ක මුදල ,කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 20,000.00 ක මුදල, ELCARDO TRADING (PVT) LTD ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

05. පාන/01/06/නීති/17 ලිපිගොනුවට අනුව වැකඩ සොලමන් මාවතේ පිහිටි පන්විල මහලියැද්ද නොහොත් රුක්ගහදෙනිය නැමැති ඉඩමේ (ජන උදාන ගම්මානයේ) පදිංචිකරුවන්ට ඔප්පු ලබාදීම සඳහා අදාල ඉඩමේ පදිංචිකරුවන්ගේ පදිංචියට අදාලව ග්‍රාම නිලධාරී විසින් සකසන ලද හා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද පදිංචිකරුවන්ගේ නාම ලේඛණය අනුසාරයෙන් 2021.11.15 වන දින මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් විශේෂ කමිටුව විසින් ගනු ලැබූ තීරණ මත සකසන ලද කමිටු වාර්තාවට අනුව,ඔප්පු ලබාදීමට සුදුසුකම් ලද පදිංචිකරුවන්ගේ නාම ලේඛණය කමිටු නිර්දේශයටත් එම නාම ලේඛණය පදනම් කරගෙන පන්විල මහලියැද්ද නොහොත් රුක්ගහදෙණිය ඉඩමේ පදිංචිකරුවටන්ට ඔප්පු ලබාදීම සඳහාත් කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

සියළු සභිකවරුන් රැස්වී සාකච්ඡා කර අවසන් තීරණයකට එළඹීම සුදුසු බැවින් 2022.03.28 වන දින පෙ.ව.11.30 ට මෙම කරුණ සඳහාම රැස්වීම තීරණයක් ගැනීම සඳහා කල්තබන ලදී.

06. PUC/5/4/1/3-2022 හා වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම 2022 ලිපිගොනුවට අනුව නගර ශාලාවේ අක්‍රිය වී ඇති වායු සමීකරණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව විසින් එවා ඇති රු 13,837.50 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මීළඟ කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා කල්තබන ලදී.

07. PUC/5/4/1/3-2022 හා වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම 2022 ලිපිගොනුවට අනුව කමිටු කාමරයේ අක්‍රිය වී ඇති වායු සමීකරණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව විසින් එවා ඇති රු 43,875.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මීළඟ කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා කල්තබන ලදී.

08. 2022.03.10 කර්මාන්ත කමිටුවේ නිර්දේශය අනුව ZA-2794 JCB රථයේ සිදුවූ අළුත්වැඩියාව සම්බන්ධ වාර්තාව ,කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

01. ZA-2794 JCB රථයේ ඇති වූ කාර්මික දෝෂයන් හේතුවෙන් අක්‍රිය තත්ත්වයේ පැවති අතර 2021 වර්ෂයේ පාණදුර නගර සභාවේ වාහන නඩත්තු සඳහා ලියාපදිංචි ආයතනයක් වන H.L.M.HOLDING ආයතනය වෙත අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කරන ලදී.

02. ZA-2794 JCB රථය, H.L.M.HOLDING ආයතනයට රැගෙන යාමෙන් පසු, කල යුතු අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවක් ලබාදෙන ලෙස හොරණ ඩිපෝවේ යාන්ත්‍රික ඉංජිනේරු

එච්.ඩී.පෙරේරා මහතාගෙන් ඉල්ලීම් කරන ලදුව ඔහු විසින් රථයේ සිදුකළ යුතු අළුත්වැඩියාවන් සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

03. අදාළ වාර්තාව අනුව 2021.11.09 වන දින H.L.M.HOLDING ආයතනය මඟින් රු 1,274,920.00 ක වටිනාකමක් ඇති ඇස්තමේන්තුවක් සභාව වෙත යොමුකළ අතර එම ඇස්තමේන්තුවට අනුව කටයුතු කිරීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයද සභා අනුමැතියද ලබාගෙන ඇත.

04. අදාළ සභා අනුමැතිය අනුව මෙම රථයේ අළුත්වැඩියා කටයුතු ඉටු කරන මෙන් සභාව විසින් H.L.M.HOLDING ආයතනය වෙත ලිඛිතව දැනුවත් කිරීම් සිදුකළ අතර අදාළ අළුත්වැඩියා කටයුතු සිදුකිරීමේදී නිරීක්ෂණ කටයුතු සඳහා වැඩ අධිකාරී මහතාද තාක්ෂණ නිළධාරී ජයන්ත මහතාද යොමු වන ලදී.

05. ඉහත ඉදිරිපත් කරන ලද රු1,274,920.00 ක වටිනාකමක් ඇති ඇස්තමේන්තුවට අමතරව රථය අළුත්වැඩියා කටයුතු සඳහා ගැලවීමෙන් පසු හඳුනාගත් අළුත්වැඩියාවන් සඳහා රු 815,770.00 ක් වන අමතර ඇස්තමේන්තුවක් H.L.M.HOLDING ආයතනය විසින් ඉදිරිපත් කරන ලදී.

06. අදාළ ඇස්තමේන්තුවට අනුව අළුත්වැඩියා කටයුතු කිරීමටද සභා අනුමැතිය ලබාගන්නා ලදී. (2022 ජනවාරි මස කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර අදාළ කමිටුව විසින් නිර්දේශ කර සභා අනුමැතියද ලබාදී ඇත)

07. ඒ අනුව ඇස්තමේන්තු දෙකෙහිම එකතුව රු 2090690.00 ක් වුවද ඇස්තමේන්තුවේ සඳහන් එක් අළුත්වැඩියාවක් සිදුකර නොමැති බැවින් එම මුදල අඩුකර රු 1,949,890.00 ක බිල්පත සභාව වෙත යොමු කරන ලදී.අදාළ අළුත්වැඩියාවෙන් පසු රථය නිසි ලෙස ක්‍රියාකරන බව රියදුරු මහතා විසින්ද තහවුරු කර ඇත.

08. තවද අළුත්වැඩියාවේදී ඉවත් කරන ලද කොටස් නැවත සභාව වෙත යොමුකළ අතර එම කොටස් රියදුරු මහතා විසින් ගබඩාව වෙත භාර දී ඇත.

09. ඉහත අළුත්වැඩියාවෙන් පසු නැවතත් යාන්ත්‍රික ඉංජිනේරු විසින් අදාළ ඇස්තමේන්තුවල සඳහන් අමතර කොටස් යොදා ධාවනයට සුදුසු පරිදි එම අළුත්වැඩියාවන් නිසි ආකාරයෙන් නිමකර ඇති අතර ගෙවීමද නිර්දේශ කර ඇත.මෙම අළුත්වැඩියා කටයුතු සිදුකරන ලද්දේ 2021 වර්ෂයේ බැවින් මෙම වසරේ ගෙවීම් කිරීමට ණයහිමිද වෙන්කර ඇත.

10. අදාළ අළුත්වැඩියාවෙන් පසු ZA-2794 JCB රථය නගර සභා පරිශ්‍රයට ගෙන ඒමෙන් පසුව රථයේ පිටුපස ජැක් සීල් පළුදු වී තිබූ අතර එය නිරීක්ෂණය කරන ලද්දේ වැඩ අධිකාරී මහතා හා තාක්ෂණ නිළධාරී ජයන්ත මහතා විසින්ය.

11. එසේ හඳුනාගත් අළුත්වැඩියාව සඳහා H.L.M.HOLDING ආයතනය වෙත නැවත යොමුකළ අතර එහිදී ඒ සඳහා එය රු 166,350.00 ක ඇස්තමේන්තුවක් අදාළ ආයතනය විසින් සභාව වෙත යොමු කර ඇත.

ZA-2794 JCB රථයේ රු 1,949,890.00 ක මුදල ගෙවීම සඳහා සියළු මූලික පියවරයන් පෙර පැවති කර්මාන්ත කමිටු වෙත ඉදිරිපත් කර කමිටු නිර්දේශයද සභා අනුමැතියද ලබාගෙන ඇති බැවින් අදාළ රු 1,949,890.00 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කළ අතර රු රු 166,350.00 ක ඇස්තමේන්තුව සඳහා අදාළ වන අළුත්වැඩියාව සම්බන්ධයෙන් වැඩ අධිකාරීතුමා හා තාක්ෂණ නිළධාරී ජයන්ත මහතා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු තීරණයක් ගැනීමට මීළඟ කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

09. සාකච්ඡා කරන ලද වෙනත් කරුණු

9.1 හදිසි වාහන අළුත්වැඩියාවන් සඳහා සෙනසුරාදා ඉරිදා දින නඩත්තු අංශයේ සේවකයින් කැඳවීම සිදුකළද නිසි රාජකාරියක් සිදු නොවන බැවින් එම සේවකයින් සෙනසුරාදා ඉරිදා සේවයට නොකැඳවමින් එම අළුත්වැඩියාවන් සතියේ දිනවල ඉටු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

9.2 ගඟුලේ දේවාලය ඉදිරිපිට සංවර්ධනය කරමින් පවතින ඉඩමෙහි සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදීම නගර සභාව විසින් සිදුනොකළ අතර එහි සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදීම සිදුකර ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියෙන් වේ.නමුදු මෙහි සිදුවන සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් මහජන පැමිණිලි රාශියක් ඉදිරිපත් වන බැවින් මෙම ඉඩම සඳහා ජල සම්බන්ධතාවය හා විදුලි සම්බන්ධතාව සඳහා අනුමැතිය ,තාවකාලිකව ලබා නොදීමටත් බිම්කට්ටි මත අයකරනු ලබන 1% බදු මුදල තාවකාලිකව ලබානොගැනීමත් සුදුසු බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

9.3 වැවේ කුඹුර වෙල්යායේ,පහත් බිම් සංවර්ධන මණ්ඩලය විසින් සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ගොඩකිරීමක් සිදුකරන අතර අදාළ ගොඩකිරීම මඟින් එම ඉඩම වටා ඇති ජලය බැසයන කාණු අවහිර වීමක් සිදුවන බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් පවසා සිටින ලදී. ඒ අනුව තාක්ෂණ නිළධාරීන් විසින් අදාළ ස්ථානය නිරීක්ෂණය කිරීමට යොමුවන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.03.22 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.6.5) 2022.03.22 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය

ඒ අනුව 2022.03.22 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

මුදල් කමිටු රැස්වීම් වාර්තාව

දිනය :2022.03.22

වේලාව : පෙ.ව.11.00

ස්ථානය :පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත

02	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
03	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
04	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	නැත
05	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
06	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
07	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
08	ගරු නාගරික මන්ත්‍රී	පද්මා කොස්තා මිය	නැත
09	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය	ඇත

සහභාගී වූ වෙනත් නිලධාරී

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
02	ගණකාධිකාරී	තිලක් මුණසිංහ මහතා	ඇත
03	පරිපාලන නිලධාරී	කුමුදු අබේසේකර මිය	ඇත
04	අභ්‍යන්තර විගණන නිලධාරී	කේ.ඒ.සී. ද සිල්වා මිය	ඇත
05	තාක්ෂණ නිලධාරී	එස්.ඩී.තුෂාරා මිය	ඇත
06	අංශ ප්‍රධානී (ආයතන)	කේ.ඩී.යූ.පී.ජයරත්න මිය	ඇත
07	අංශ ප්‍රධානී (වරිපනම්)	ඩී.ඩී.ඒ.එල්.ශ්‍රියාණි මිය	ඇත
08	අංශ ප්‍රධානී (ගිණුම්)	ඒ.ඒ.චන්ද්‍රිකා මිය	ඇත
09	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
10	අංශ ප්‍රධානී (මිශ්‍ර ආදායම්) වෙනුවට	අසංගි විජේසූරිය මිය	ඇත
11	අංශ ප්‍රධානී (සෞඛ්‍ය)	එච්.ටී. හෙට්ටිආරච්චි මිය	ඇත
12	අංශ ප්‍රධානී (ප්‍රජා සංවර්ධන) වෙනුවට	ටී.උපුල් විරාජ් පීරිස් මහතා	ඇත
13	ආදායම් පරීක්ෂක	ටී.සුනිල් ජයලාල් මහතා	ඇත
14	ආදායම් පරීක්ෂක	පියල් පද්මචන්ද්‍ර මහතා	ඇත
15	ආදායම් පරීක්ෂක (වැ.බ.)	ජී.තරංග ජනකමිණි පෙරේරා මහතා	ඇත
16	ආදායම් පරීක්ෂක (වැ.බ.)	දර්ශන ඒකනායක මහතා	ඇත

01. <u>වරිපනම්</u>

1.1 ලිපි ගොනු අංකය PUC /03/05/02/15/22

කොට්ඨාශ අංකය හා වීදිය	03, ශ්‍රී ගුණරතන පාර
අයිතිකරු	බී.නිල්මිණි සමන්තිකා ප්‍රනාන්දු
වරිපනම් අංක	4ඒ
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු.1,500/-
වාර්ෂික වටිනාකම	රු.7,500/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.02.17
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් වරිපනම් බදු වලින් නිදහස් කරන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් 2022/2 කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අය කිරීම .

හිඟ වරිපනම් මුදල් අයකර ගැනීමත්, ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් 2022/2 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතය මත බදු අය කිරීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

1.2 ලිපි ගොනු අංකය **PUC /03/07/110/2022**

කොට්ඨාශ අංකය හා වීදිය	08, ග්‍රේස් පීරිස් මාවත	
අයිතිකරු	ඩී.සී.සී.විජේසූරිය	
වරිපනම් අංක	23	23 B
දේපල විස්තරය	වාණිජ්‍ය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත	නැත
වාර්ෂික වටිනාකම	රු.112,500/-	රු.52,500
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.02.01	
ඉල්ලීම	උපකාරක පංති පවත්වන ස්ථානය වසා දමා ඇති බැවින් වරිපනම් බදු සහනයක් ලබා දෙන ලෙස	
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථාන වසා දමා ඇති බැවින් 2022/2 සිට 5% නේවාසික ප්‍රතිශතය මත බදු අය කිරීම.	

උපකාරක පන්ති පවත්වන ස්ථානය වසා දමා ඇති බැවින් 2022/ 2 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතය මත බදු අය කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

1.3 ලිපි ගොනු අංකය **PUC /03/05/02/14/22**

කොට්ඨාශ අංකය හා වීදිය	03, ජනප්‍රිය මාවත
අයිතිකරු	එම්.ඒ.ප්‍රියන්ත
වරිපනම් අංක	12 1/1
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු.20,000/-
වාර්ෂික වටිනාකම	රු. 150,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.02.15
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථානය දිගු කලක සිට වසා දමා ඇති බැවින් වරිපනම් බදු ප්‍රතිශතය අඩු කර දෙන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් 2022/2 කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අය කිරීම .

හිඟ වරිපනම් මුදල් අයකර ගැනීමත්, ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් 2022/ 2 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතය මත බදු අය කිරීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

1.4 ලිපි ගොනු අංකය **PUC /03/07/112/2022**

කොට්ඨාශ අංකය හා වීදිය	08, හොරණ පාර
අයිතිකරු	එම්.ඩී.ඒ. පෙරේරා
වරිපනම් අංක	34
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත
වාර්ෂික වටිනාකම	රු.127,500/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.02.14
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථානය කිසිදු ව්‍යාපාරික කටයුත්තක් සිදු නොකරන බැවින් නේවාසික ප්‍රතිශතයට බදු අය කරන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් 2022/2 කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අය කිරීම .

ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් 2022/2 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතය මත බදු අය කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

02. <u>මිශ්‍ර ආදායම් අංශය</u>

2.1 පාණදුර , නල්ලූරුව, මැදවේල්ල පාර, නො.20, හි ක්ලැසික් බෝයිස් ආයතනය විසින් පාණදුර එළිමහන් ක්‍රීඩාංගණයේදී 2022.02.11 වන දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා 2022.01.28 වන දින පහත පරිදි මුදල් ගෙවා ඇත.

ලදුපත් අංකය	විස්තරය	මුදල
I 49400	එළිමහන වෙන් කිරීම	රු.6,000.00
I 49441	අයදුම්පත්‍ර ගාස්තුව	රු. 500.00
I 49442	තැන්පතු මුදල	රු.1,000.00

නමුත් පවත්නා කොරෝනා වසංගත තත්වය යටතේ සංගීත ප්‍රසංග පැවැත්වීම සඳහා පාණදුර පොලිස් ස්ථානය විසින් තහනමක් ක්‍රියාත්මකිරීම හේතුවෙන් එම ප්‍රසංගය අවලංගු කිරීමට සිදු වී ඇත.එම ක්ලැසික් බෝයිස් ආයතනය විසින් එම මුදල් ආපසු ලබා දෙන ලෙස 2022.02.21 දින ඉල්ලීමක් කර ඇත.
එම ප්‍රසංගය සඳහා අදාල අවසර ගැනීම් වලින් තොරව ඔවුන් විසින් සභාවේ අනුමැතිය පමණක් ලබා ගෙන මුදල් ගෙවීම සභාවේ අතපසු වීමක් නොවන බැවින් වෙන් කිරීම් ගාස්තුවෙන් 10% රඳවා ගෙවීමට (රු.6,000/- (*10%) = 5,400.00) මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.
(බලපත්‍ර ගාස්තුව රු.500/- ආපසු නොගෙවන අතර තැන්පතුව සම්පූර්ණයෙන් ආපසු ගෙවිය හැකි බවද කාරුණිකව දන්වමි.)

වෙන්කිරීමේ ගාස්තුව වන රු 6,000.00 ක මුදලින් 10% ක මුදලක් රඳවා ගනිමින් ඉතිරි මුදල වන රු 5400.00 හා තැන්පතු මුදල වන රු 1,000.00 ක මුදල නැවත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.2 මාර්කට් පාර එල් 03 දරණ කඩ කාමරය සිව්වන වරට 2021.04.29 දින ප්‍රාදේශීය වශයෙන් ලංසු කැඳවීමේ දී එය රු.152,000.00 මුදලකට පාණදුර පෙරේරා මාවතේ 45C හි මහීෂා අවනි මහත්මියට හිමි විය.
නමුත් එම ව්‍යාපාරය ඇයට පවත්වාගෙන යාමට සහනයක් ඉල්ලා ඉදිරිපත් කරන ලද 2021.07.15 දිනැති ලිපිය සඳහා රු.19,000/- බැගින් මාස 3ක තැන්පතුවක් තබන ලෙසත් 2021.09.01 සිට 2021.12.31 දක්වා කඩය ලබා දීමටත්2021.07.27 පැවති මුදල් කමිටුවෙන් නිර්දේශ කරන ලදි. ඒ බව ඉහත බදු කරුට දැන්වූ අතර තැන්පතු මුදල් තැබීමට අපහසු බවත් වාචිකව පවසා පසුව කඩය ලබා ගැනීම සම්බන්ධව දැනුම් දෙන බව පවසන ලදි. පසුව නැවත කෙරෝනා වසංගතය පැතිරීම නිසා රටෙහි සංචරණ සීමා පැනවීම නිසා ඇයට කඩය ලබා ගැනීමට නොහැකි විය.

එබැවින් නැවත ඇය 2021.10.29 දැනැතිව කොරෝනා වසංගතය නිසා කඩය ලබා ගැනීමට නොහැකි වූ නිසා නැවත කඩය මාස 06කට හෝ අවුරුදු 01කට ලබා දෙන ලෙසත් මාස 02කට කඩය ලබා ගැනීමෙන් වන අපහසුතාවය නිසා සාධාරණයක් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබුණි.නොවැම්බර් මස මුදල් කමිටුවේ දී එම කඩය 2022 වර්ෂයට බදු දෙන බැවින් නැවත බදු කාලය දීර්ඝ කිරීමට නොහැකි බව තීරණය වූ අතර ඒ බව ඇයට දන්වන ලදි.

ඒ අනුව නැවත ඇය මෙම කඩය වෙනුවෙන් තබන ලද ලංසු තැන්පතුව වන රු.15,000.00 මුදල ආපසු ලබා දෙන ලෙස හෝ එම තැන්පතුව 2022 වර්ෂය වෙනුවෙන් කැඳවන ටෙන්ඩරය තබාගෙන ඇයට ලංසු ඉල්ලුම්පත් ගාස්තුව පමණක් ගෙවා 2022 වර්ෂයට ඉල්ලුම් කිරීමට කටයුතු සලසා දෙන ලෙසත්,ඇයට සිදු වී ඇති අසාධාරණ වෙනුවෙන් සාධාරණයක් ඉටු කර දෙන මෙන් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇත. 2021

දෙසැම්බර් මස මුදල් කමිටු නිර්දේශය පරිදි ගිවිසුම් ගත වීම නිසි පරිදි සිදු කර නොමැති නිසා සහන ලබා දිය නොහැකි බව දන්වා නැවත ඇයට දන්වන ලදි.

නමුත් ඇය විසින් 2022.01.22 දිනැතිව ලංසු තැන්පතුව වන රු.15,000.00 ක මුදල ආපසු ලබා දෙන ලෙස හෝ තැන්පතු මුදල නව ටෙන්ඩරය සඳහා ලබා දෙන ලෙස ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇත.

2022 වර්ෂයට ඉහත කඩ කාමරය ලංසු කැඳවා වෙනත් අයෙකුට හිමිව ඇත.ලංසුකරු විසින් කඩය ලබා ගැනීම ප්‍රතික්ෂේප කළහොත් ලංසු පෝරම තැන්පතු ලබා දිය නොහැකිය.නමුත් ඇය මීට පෙර පැමිණි පළමු අවස්ථාවේ දීම මාස 03ක තැන්පතුව ගෙවා කඩය ආරම්භ කර අවශ්‍ය සහනයක් ඉල්ලුම කරන ලෙස දැන්වූවද ඇය මුදල් තැන්පත් නොකර සහන ඉල්ලා ලිපි ඉදිරිපත් කර ඇත.තවද ඇයට කඩය ආරම්භ කිරිමට නොහැකි වීමට රටේ පැවති තත්වයද බලපා ඇත.ලංසු කැඳවීමෙන් 2021.05.01 සිට 2021.12.31 දක්වා ඉහත කඩය ලබා දිමට කටයුතු කලද කෙරෝනා වසංගතය නිසා 2021 අප්‍රේල් මාස අග සිට ජූනි දක්වාත් නැවත ජූලි 21 සිට ඔක්තෝම්බර් 01 දක්වාත් රටෙහි සංචරණ සීමා පනවා තිබුණි.එසේම තාවකාලික කඩ කාමර ඉදි කෙරෙමින් පැවති කාලයේ එම කඩ කාමරය සභාව විසින් පරිහරණය කිරීමත් සිදු කරන ලදි.

ඉහත කරුණ මීට පෙර දෙවරක් මුදල් කමිටු ඉදිරිපත් කර ඇති අතර එම අවස්ථා දෙකේ දීම ඉල්ලීම් ප්‍රතික්ෂේප විය. නැවත වරක් මුදල් කමිටුවේ නිර්දේශය සඳහා කාරුණිකව ඉදිරිපත් කරන ලදී.

කොරෝනා වසංගත තත්ත්වය මත ව්‍යාපාර කටයුතු කිරීමට අපහසු වූ බැවින් මෙම ලංසු තැන්පතු මුදල වන රු 15,000.00 ක මුදල නැවත ලබාදීම සඳහා සලකා බැලීමට ඇය විසින් ගිවිසුම්ගත වීමක් සිදුවී නොමැති බැවින් පවත්නා නීතිරීති අනුව හැකියාවක් පවතීනම් අදාළ නීතිමය තත්ත්වයද සමඟ මහා සභා වෙත යොමු කරන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.3 පාණදුර ජයතිලක මාවත, නො.35 හි, ද ෆෝන් හවුස් ආයතනයේ හිමිකරු වන එම් .එස්.එන්.ප්‍රනාන්දු යන අය විසින් පාණදුර සභා තාප්පයෙහි මාර්කට් එක දෙසට වන අන්තයෙහි අඩි 15 * 15 ක පමණ වන සිමෙන්ති පිරියම් කරන ලද බිත්තියෙහි වෙළඳ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශණය කිරීම සඳහා ඉල්ලීමක් කර ඇත.

එම ප්‍රමාණයේ දැන්වීම් පුවරුවක් වසරකට ප්‍රදර්ශණය කිරීම සඳහා අය කරනු ලබන ගාස්තු පහත පරිදි වේ.

15 * 15 ප්‍රදර්ශණ ගාස්තුව	= 4500.00
අයදුම්පත්‍ර ගාස්තුව	= 500.00
මුළු මුදල	= 5,000.00

නගර සභාවට අයත් කොටසක මෙම දැන්වීම් පුවරුව ප්‍රදර්ශණය කරන බැවින් ඒ සඳහා ප්‍රදර්ශණ ගාස්තුවට අමතරව බිම්කුලියක් ලෙස රු.15,000.00 ක් අය කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීම සඳහා මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

ප්‍රදර්ශණ ගාස්තු ලෙස රු 4500.00 ක මුදලක්ද අයදුම්පත්‍ර ගාස්තුව ලෙස රු 500.00 ක්ද බිම්කුලිය ලෙස රු 15,000.00 ක මුදලක් අයකිරීමද මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.4 පාණදුර නගර සභාව සතු L කඩ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එවන ලද 2022.01.26 සහ 2021/12/09 දිනැති තක්සේරු වාර්තා වලින් දක්වන ලද තක්සේරු මුදල් පහත පරිදි වේ.

අනු අංකය	කඩ කාමර අංකය	2022/01/26 දිනැති වාර්තාව අනුව නව තක්සේරු මුදල	2017/07/25 දිනැති වාර්තාව අනුව පෙර පැවති තක්සේරු මුදල	2020.03.05 දිනැති වාර්තාව අනුව සංශෝධිත තක්සේරු මුදල
01	L 01	13,750/-	8,000/-	

02	L 02	16,500/-	10,000/-	
03	L 05	19,250/-	11,500/-	
04	L 06	19,250/-	11,500/-	
05	L 07	16,500/-	10,000/-	
06	L 08	16,500/-	10,000/-	
07	L 09	16,500/-	10,000/-	
08	L 10	16,500/-	10,000/-	
09	L 11	19,250/-	11,500/-	
10	L 12	22,500/-	13,000/-	
11	L 13	40,250/-	25,000/-	
12	L 14	40,250/-	25,000/-	
13	L 15	40,250/-	25,000/-	
14	L 16	40,250/-	25,000/-	
15	L 17	23,250/-	14,500/-	
16	L 18	50,000/-	28,500/-	
17	L 19	12,500/-	16,000/-	11,000/-
18	L 20	26,500/-	16,000/-	
19	L 21	26,500/-	16,000/-	
20	L 22	20,500/-	12,000/-	

අනු අංකය	කඩ කාමර අංකය	2022/01/26 දිනැති වාර්තාව අනුව නව තක්සේරු මුදල	2017/07/25 දිනැති වාර්තාව අනුව පෙර පැවති තක්සේරු මුදල	2020.03.05 දිනැති වාර්තාව අනුව සංශෝධිත තක්සේරු මුදල
21	L 03	19,500/-	19,000/-	10,000/-
22	L 04	19,500/-	19,000/-	11,500/-

එම කඩ කාමර සඳහා පෙර පැවති තක්සේරු මුදල ද (2017.07.25 සහ 2020.03.05 දිනැති තක්සේරු වාර්තා අනුව) වගුවෙහි දක්වා ඇත.

ඒ අනුව, 2022.01.26 සහ 2021.12.09 දිනැති තක්සේරු වාර්තා මඟින් දක්වා ඇති නව තක්සේරු මුදල අය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදි.

2022.01.26 සහ 2021.12.09 දිනැති ලිපි මඟින් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති පහත තක්සේරුව පිළිගැනීමටත් ඒ අනුව කඩකුලී අයකිරීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

අනු අංකය	කඩ කාමර අංකය	නව තක්සේරු මුදල
01	L 01	13,750/-
02	L 02	16,500/-
03	L 05	19,250/-
04	L 06	19,250/-
05	L 07	16,500/-
06	L 08	16,500/-
07	L 09	16,500/-
08	L 10	16,500/-
09	L 11	19,250/-
10	L 12	22,500/-
11	L 13	40,250/-
12	L 14	40,250/-

13	L 15	40,250/-
14	L 16	40,250/-
15	L 17	23,250/-
16	L 18	50,000/-
17	L 19	12,500/-
18	L 20	26,500/-
19	L 21	26,500/-
20	L 22	20,500/-
21	L 03	19,500/-
22	L 04	19,500/-

03. <u>ආයතන අංශය</u>

3.1 පාන/01/09/01/2019 පොදු ලිපි ගොනුවට අදාල 2022 ජනවාරි මස සඳහා කාර්යාලයේ දුරකථන බිල්පත් ගාස්තු සහ අංක පහත සඳහන් වේ. සභා ආවරණ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත රු.16,597.07 ක ගෙවූ මුදල මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදි.

සංකේත අංකය	දුරකථන අංකය	නම	කාල සීමාව		ගාස්තුව
124-1-1-0-1401	038-3126384	කමිටු කාමරය	2022.01.16 2022.02.15	සිට	1438.70
	038-2249955	අභ්‍යන්තර විගණන නිළධාරී	2022.01.16 2022.02.15	සිට	226.20
124-1-2-0-1401	038-3127416	ගණකාධිකාරී	2022.01.16 2022.02.15	සිට	1102.80
	038-2249953	සැපයුම් නිළධාරී කාමරය	2022.01.16 2022.02.15	සිට	1540.71
124-8-1-0-1401	038-3126174	කසල අංගණයේ රවුටරය	2022.01.16 2022.02.15	සිට	1642.03
124-4-3-0-1401	038-2249954	වැඩ අධිකාරී කාර්යාලය	2022.01.16 2022.02.15	සිට	375.53
	038-2249950	කර්මාන්ත අංශය	2022.01.16 2022.02.15	සිට	1909.40
	038-3370564	පිහිනුම් තටාකය	2022.01.16 2022.02.15	සිට	777.59
	038-3127405	නගර ශාලාව	2022.01.16 2022.02.15	සිට	1004.11
	038-3397714	වැඩ අංගණයේ කාර්යාලය	2022.01.16 2022.02.15	සිට	1674.95
124-3-1-0-1401	038-2249952	සෞඛ්‍ය අංශය	2022.01.16 2022.02.15	සිට	1571.26
	038-3127406	මිනුවම්පිටිය සුසාන භූමිය	2022.01.16 2022.02.15	සිට	866.79
124-2-1-0-1401	038-2249951	මිශ්‍ර ආදායම් අංශය	2022.01.16 2022.02.15	සිට	2467.00
			එකතුව		**16,597.07**

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත ගෙවන ලද රු.16,597.07 ක මුදල , මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

3.2 PUC/01/03/2021 ලිපි ගොනුවට අනුව පාණදුර නගර සභාවේ යොවා ඇති බස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වෙස්ප්‍රෝ ආයතනයේ ආරක්ෂක නිලධාරීන් සඳහා 2022 පෙබරවාරි මස දීමනා ගෙවීම වෙනුවෙන් සභා ආවරණ අනුමැතියට යටත්ව, එකී ආයතනය වෙත ගෙවන ලද රු.**426,160/-** ක මුදල මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදි.

වෙස්ප්‍රෝ ආයතනය වෙත රු.426,160/- ක මුදල ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

3.3 පාන/01/09/01/2019 ලිපි ගොනුවට අදාල 2022 ජනවාරි මස සඳහා කාර්යාලයේ දුරකථන බිල්පත් ගාස්තු පහත සඳහන් වේ. සභා ආවරණ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත රු.**24,290.97**ක ගෙවූ මුදල , මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදි.

සංකේත අංකය	දුරකථන අංකය	නම	කාල සීමාව	ගාස්තුව
124-1-1-0-1401	038-2232656	සභාපති කාර්යාලය	2022.01.01 සිට 2022.01.31	2360.58
	038-2249956	ලේකම්	2022.01.01 සිට 2022.01.31	258.21
	038-2232275	පොදු දුරකථනය	2022.01.01 සිට 2022.01.31	3508.61
	038-2232276	ෆැක්ස්/ඉන්ටර්නෙට්	2022.01.01 සිට 2022.01.31	5939.87
	038-2232285	උප සභාපති කාර්යාලය	2022.01.01 සිට 2022.01.31	1348.62
	038-3124635	පරිපාලන නිලධාරී	2022.01.01 සිට 2022.01.31	489.19
	038-2248477	ආයතන අංශය	2022.01.01 සිට 2022.01.31	2270.08
124-3-5-3-1401	038-2241705	ආයුර්වේදය	2022.01.01 සිට 2022.01.31	803.16
124-8-1-0-1401	038-2221422	කසල අංගණය	2022.01.01 සිට 2022.01.31	1112.73
	038-3127580	සූර්ය පැනලයේ රවුටරය	2022.01.01 සිට 2022.01.31	495.91
	038-2249957	වරිපනම් අංශය	2022.01.01 සිට 2022.01.31	1919.45
124-6-3-0-1401	038-2243299	පුස්තකාලය	2022.01.01 සිට 2022.01.31	3784.56
			එකතුව	**24,290.97**

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත ගෙවන ලද රු.24,290.97 ක මුදල , මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

04. <u>සෞඛ්‍ය අංශය</u>

4.1 UCP/06/02/07/2021 ලිපි ගොනුවට අනුව 2022.02.01 – 2022.02.28 දින දක්වා පාණදුර නගර සභා බල ප්‍රදේශයේ එකතු කරන ලද දිරන කසළ ලෝඩ් 43 ක් ඉවත් කිරීම වෙනුවෙන් රු 28,500.00 බැගින් රු 1,225,500.00 ක මුදලක් ලබා දෙන ලෙස GFC Machinery (Pvt) Ltd ආයතනය විසින් ඉල්ලීම් කර ඇත.ඒ අනුව සභා ආවරණ අනුමැතියට යටත්ව GFC Machinery (Pvt) Ltd ආයතනය වෙත ගෙවන ලද රු. 1,225,500/- ක මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

GFC Machinery (Pvt) Ltd ආයතනය වෙත රු.1,225,500/- ක මුදල ගෙවීම , මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

4.2 UCP/06/03/02/2022 ලිපි ගොනුවට අනුව 2022.01.01 සිට 2022.01.31 දක්වා ගල්කිස්ස අපජල පද්ධතියට මළාපවහන මුදාහැරීම වෙනුවෙන් මළාපවහන ගාස්තු වශයෙන් , ලෝඩ් එකක් මුදාහැරීම සඳහා රු.2000/- බැගින් ලෝඩ් 22 ක් සඳහා රු.44,000/- හා 8% VAT රු.3520.00 සමඟ මුළු මුදල රු.47,520/- ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රු.47,520/- ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

4.3 UCP/06/02/13/2021 ලිපි ගොණුවට අනුව 2022.01.01 – 2022.01.31 දින දක්වා පාණදුර නගර සභා බල ප්‍රදේශයේ එකතු කරන ලද දිරන කසළ මෙට්‍රික් ටොන් 116.729 ක් ඉවත් කිරීම වෙනුවෙන් සහා ආවරණ අනුමැතියට යටත්ව කළුතර පොහොර වත්ත කසල ව්‍යාපෘතිය වෙත ගෙවන ලද රු.158,394.15ක මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

2022.01.01 – 2022.01.31 දින දක්වා කසළ මෙ.ටොන්. 116.729 * 1250/-	=	රු. 145,911.25
තරාදි බර 50 * 26	=	රු. 750.00
		රු 146,661.25
8 % VAT	=	රු. 11,732.90
		රු. 158,394.15

කළුතර පොහොර වත්ත කසල ව්‍යාපෘතිය වෙත ගෙවන ලද රු.158,394.15 ක මුදල , මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

05. <u>ගිණුම් අංශය</u>

5.1 PUC/AC7/වාහන/පොදු /01/2022 ලිපිගොනුවට අදාලව කර්මාන්ත අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව LL – 6996 ටිපර් රථය වෙනුවෙන් මිලදී ගත් රථවාහන අමතර කොටස් වෙනුවෙන් පානදුර,ජනප්‍රිය මාවත,සලාකා මෝටර්ස් ආයතනයට රු.69800.00ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

ට්‍රැක්ටර් හයිඩ්‍රොලික් පවර් රැක් ෂොක් තයිරොඩ් 01 = 69800.00

පානදුර,ජනප්‍රිය මාවත,සලාකා මෝටර්ස් ආයතනය වෙත රු. 69800.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.2 PUC/AC7/වාහන/පොදු /01/2022 ලිපිගොනුවට අදාලව කර්මාන්ත අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව මිලදී ගත් අමතර කොටස් වෙනුවෙන් පානදුර,ජනප්‍රිය මාවත,සලාකා මෝටර්ස් ආයතනයට රු.14750.00ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

ටොන් 25 හයිඩ්‍රොලික් ජැක් 01 =14750.00

පානදුර,ජනප්‍රිය මාවත,සලාකා මෝටර්ස් ආයතනය වෙත රු.14,750/- ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.3 PUC/AC7/වාහන/පොදු /01/2022 ලිපිගොනුවට අදාලව කර්මාන්ත අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව මිලදී ගත් රථවාහන අමතර කොටස් වෙනුවෙන් කළුතර,සිරිවර්ධන මෝටර්ස් ආයතනයට රු.14750.00ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

කම්පැක්ටර් ලෝඩ් වැල් 01 =14750.00

කළුතර,සිරිවර්ධන මෝටර්ස් ආයතනය වෙත රු.14750.00ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.4 PUC/AC7/G21/2022 ලිපිගොනුවට අදාලව කර්මාන්ත අංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව මිලදී ගත් ZA – 2794 JCB රථවාහන අමතර කොටස් වෙනුවෙන් ගාලුපාර,පානදුර නිව් පියසේන මෝටර් ස්ටෝර්ස් ආයතනයට රු.19610.00ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත්කරන ලදි.

ඇම්පියර් 90 බැටරිය(exid 2 years warranty) =19610.00

ගාලුපාර,නිව් පියසේන මෝටර් ස්ටෝර්ස් ආයතනය වෙත රු.19,610.00 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.5 Puc/AC7/ G- 07 /2022 ලිපිගොනුවට අදාළව කර්මාන්ත අංශයෙන් කරන ලද ඉල්ලීම අනුව මිලදී ගත් කොලාස් බැරල් 200L න් 50ක් වෙනුවෙන් dima Lanka(pvt) ltd. ආයතනයට රු. 1,220,000.00ක මුදලක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

Bitumen Emulsion CSSI 50x24,400.00 = 1,220,000.00

dima Lanka(pvt) ltd. ආයතනය වෙත රු.1,220,000.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.6 Puc/AC7/ Vehi rent/2019 ලිපිගොනුවට අදාළව කාර්යාලයේ අවශ්‍යතා සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගැනිම වෙනුවෙන් කුලී පදනම යටතේ ලබා ගත් මෝටර් රථය වෙනුවෙන් වලපල,Sathya rent A Car ආයතනය වෙත රු.67200 .00ක මුදලක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

2022.01.26 දින සිට 2022.02.24 2800.00 x 24 67,200.00

Sathya rent A Car ආයතනය වෙත රු.67200 .00 ක මුදල ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.7 Puc/AC7/ G- 10/12/2021 සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම ලිපිගොනුවට අදාළව ගබඩාවෙන් කරන ලද ඉල්ලීම අනුව සෞඛ්‍ය අංශයට අවශ්‍ය ඉදල්/කොසු මිලදී ගැනිම වෙනුවෙන් වාද්දුව B.M.C.P Balasooriya ආයතනය වෙත රු11625.00 ක මුදලක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

කොසු	155.00 x 25	=	3875.00
ඉදල්	155.00 x 50	=	7750.00
		=	11,625.00

B.M.C.P Balasooriya ආයතනය වෙත රු11,625.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.8 Puc/AC7/ G- 29/2021 කාර්යාලිය උපකරණ මිලදී ගැනීම ලිපිගොනුවට අදාළව කර්මාන්ත අංශයෙන් කරන ලද ඉල්ලීම අනුව සභාපතිතුමාගේ නිළ කාමරයට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍රය මිලදී ගැනිම වෙනුවෙන් කොළඹ රජයේ වාණිජ විවිධ නිතීගත සංස්ථාවට රු .94500.00 ක මුදලක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

Air Conditiners 18000 Btu/ Btu 12000/ Btu 24000	.7500000 x01	=	75000.00
VAT 8%		=	6000.00
Installation Charges		=	12500.00
VAT 8%		=	1000.00
		=	94500.00

රාජ්‍ය වාණිජ විවිධ නිතීගත සංස්ථාව වෙත රු .94,500.00 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.9 Puc/AC7/ G- 27/10/2021 ලිපිගොනුවට අදාළව ගබඩාවෙන් කරන ලද ඉල්ලීම අනුව පිහිණුම් තටාකයට අවශ්‍ය 70% ක්ලෝරීන් මිලදී ගැනිම වෙනුවෙන් පිටකෝට්ටේ ,Aqua Technologies (pvt) ltd. ආයතනයට රු 26,000.00 ක මුදලක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

70% ක්ලෝරීන් 26000.00 x01 = 26000.00

Aqua Technologies (pvt) ltd. ආයතනය වෙත රු 26,000.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.10 Puc/AC7/ G- 23/14/2021 ලිපිගොනුවට අදාළව ගිණුම් අංශයේ ඉල්ලීම අනුව අය වැය පොත් 50ක් මුද්‍රණය කර ගැනිම වෙනුවෙන් පානදුර,NEW Dilruk printers ආයතනයට රු .87250.00 ක මුදලක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

50 Budget report 4 colour page 1745.00 x50 = 87250.00

NEW Dilruk printers ආයතනය වෙත රු .87250.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්ශෙ කරන ලදි.

5.11 Puc/AC7/ ආදා.සැප/2019 ලිපිගොනුවට අදාළව මිනුවන්පිටිය ආදාහනාගරය සඳහා අවශ්‍ය ගෑස් ටැංකි මිලදී ගැනිම වෙනුවෙන් තලංගම උතුර , බත්තරමුල්ල, Adithya Agencies (pvt) ltd.ආයතනයට රු . 176,160.00 ක මුදලක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

2022/02/11 37.5 kg ගෑස්	8808.00 x 10	=	88080.00
2022/02/15 37.5 kg ගෑස්	8808.00 x 10	=	88080.00
		=	176160.00

Adithya Agencies (pvt) ltd.ආයතනය වෙත රු.176,160/- ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.12 Puc/AC7/ ආදා.සැප/2019 ලිපිගොනුවට අදාළව මිනුවන්පිටිය ආදාහනාගරය සඳහා අවශ්‍ය ගෑස් ටැංකි මිලදී ගැනිම වෙනුවෙන් තලංගම උතුර , බත්තරමුල්ල, Adithya Agencies (pvt) ltd.ආයතනයට රු . 132,120.00 ක මුදලක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

2022/02/27 37.5 kg ගෑස් 8808.00 x 15 = 132,120.00

Adithya Agencies (pvt) ltd.ආයතනය වෙත රු.132,120/- ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.13 Puc/AC7/ කාර්.සැපයුම්/2022 ලිපිගොනුවට අදාළව ආයතනයේ විවිධ අංශ වලින් කරන ලද ඉල්ලිමට අනුව මිලදී ගත් කාර්යාලිය සැපයුම් වෙනුවෙන් , කොළඹ,සී/ස රජයේ වාණිජ විවිධ නිතීගත සංස්ථාවට රු.32772.56 ක මුදලක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරමි.

USB MOUSE 01	750.00 x 4	=	3000.00
KEYBOARD 01	1200.00 x 4	=	4800.00
ERESER	08.24 x 25 + VAT 16.48	=	222.48
STEPLER HD 45	350.00 x 10	=	3500.00
FOOT RULER12''	37.04.00 x 25+ VAT 74.08	=	1000.08
CALULATORS	2025 x 10	=	20250.00
		=	24972.56
		=	32772.56

සී/ස රජයේ වාණිජ විවිධ නිතීගත සංස්ථාව වෙත රු.32,772.56 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.14 Puc/AC7/ කාර්මාන්./සැපයුම්/2022 ලිපිගොනුවට අදාළව කර්මාන්ත අංශයේ ඉල්ලිම් අනුව මිලදි ගත් උපාංග වෙනුවෙන් හොරණ, Ariyarathne trade center (pvt) ltd.ආයතනයට රු.28540.00 ක මුදලක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

ඉග්නේෂන් කොයිල්	2350.00 x 1	=	2350.00
Crank oil seal	290.00 x 4	=	1160.00
Starter Assy	1200.00 x 2	=	2400.00
නයිලෝන් කටර් ප්ලේට්	975.00 x 2	=	1950.00
Clutch Liner set	950.00 x 3	=	2850.00
Grass Cutter head	3250.00 x 1	=	3250.00
Pully gear head assy	3590.00 x 3	=	10770.00
බෙයාරින්	490.00 x 4	=	1960.00
පොළව තලන මැෂිමට ප්ලග්	1850.00 x 1	=	1850.00
		=	28540.00

Ariyarathne trade center (pvt) ltd.ආයතනය වෙත රු.28540.00 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

5.15 Puc/AC7/ කාර්මාන්./සැපයුම්/2022 ලිපිගොනුවට අදාළව කර්මාන්ත අංශයේ ඉල්ලීම් අනුව මිලදී ගත් උපාංග වෙනුවෙන් හොරණ, Ariyarathne trade center (pvt) ltd.ආයතනයට රු.67996.10 ක මුදලක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

Diggin frok 4t large lanlo	2975.00 x 2	=	5950.00
Plywood sheet 18mm	6750.0 x 1	=	6750.00
Cement Holcim	1375.00 x 20	=	27500.00
Thinner 1L	625.50 x 17	=	10633.50
White Nipolac 1L	2246.80 x 2	=	4493.60
Enamal 1L Nipolac	1271.00 x 3	=	3813.00
Gulf red 1L Nipolac	1279.20 x 1	=	1279.20
Black 1L Nipolac	984.00 x 5	=	4920.00
Enamal black 1L Nipolac	1328.40 x 2	=	2656.80
		=	67996.10

Ariyarathne trade center (pvt) ltd.ආයතනය වෙත රු.67,996.10 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

06. <u>කර්මාන්ත අංශය</u>

6.1 PUC/5/4/1/10/-2021 හා වීදිනාම පුවරු සැකසීම ලිපිගොනුවට අනුව බෙවර්ලි ආයතනය විසින් ඉල්ලා ඇති ඉල්ලීම 2021.12.21 වන දින කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කල අතර, එහිදී එම ආයතනයයෙන් මුදල් අය කිරීම සම්බන්ධව තීරණයක් ගෙන නොමැති බැවින් මුදල් අයකිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයට එක් පුවරුවක් ප්‍රදර්ශණය සඳහා රු 750.00 ක මුදලක් ප්‍රදර්ශණ ගාස්තු ලෙස අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.2 PUC/5/6/2/1/2021 - අනතුරුදායක ගස් කැපීම පොදු ගොනුවට අනුව, පාණදුර උයන්කැලේ හරස් මාර්ගයෙහි අංක 1/7 දරණ ඉඩමෙහි , යාබද මාර්ගයට අනතුරුදායකව පැවති පොල් ගස,කපා ඉවත් කිරීම සඳහා අයිතිකරුහට හැකියාවක් නොමැති බව මෙම සභාවට දන්වා තිබූ බැවින් ටෙන්ඩර් කැඳවා ගස කපා ඉවත් කරන ලදි. එම කාර්යය සඳහා වැය වූ මුදල ගස් අයිතිකරු වෙතින් නැවත ලබා ගැනීම සඳහා සභාව විසින් දන්වා යවන ලද අතර ශ්‍යාමා ප්‍රියංකාද සිල්වා වන ගස් අයිතිකරු ස්ථිර රැකියාවක් නොකරන අයෙක් බවට ග්‍රාම නිලධාරී විසින් තහවුරු කරන ලද ලිපියක් මෙම සභාව වෙත ඉදිරිපත් කර ඇත.එම් ලිපිය සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

අදාළ වියදම සභාව මඟින් දැරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලද අතර අඩුආදායම්ලාභී බවට සහතික කරන ලද ලිපිය සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමද කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

6.3 PUC/05/03/02 – 02/2021 ලිපි ගොනුවට අනුව 2022.02.01 සිට 2022.02.28 දක්වා නගර සභා වාහන වෙනුවෙන් වැය කරන ලද පෙට්‍රල් ඉන්ධන සඳහා එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත ගෙවිය යුතු රු.66,262.63ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත රු.66,262.63ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

6.4 PUC/05/03/02-01/2021 ලිපි ගොනුවට අනුව 2022.02.01 සිට 2022.02.28 දක්වා නගර සභා වාහන වෙනුවෙන් වැය කරන ලද ඩීසල් ඉන්ධන සඳහා එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත ගෙවිය යුතු රු.341,048.00ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදි.

එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත රු.341,048/- ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

6.5 PUC/05/02/02/2022 ලිපිගොනුවට අනුව පාණදුර නගර සභාවට අයත් ගොඩනැගිලිවල 2022 පෙබරවාරි මස දක්වා ලැබී ඇති ජල බිල්පත් සඳහා, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.37,661.04ක මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රු.37,661.04 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

<u>2022.03.10 වන දින කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරණ ලද කරුණු</u>

6.6 PUC/05/03/01-04/2020 ලිපිගොනුවට අනුව LK-0776 ටිපර් රථය,PANADURA AUTO SERVICE ආයතනය මඟින් සේවා කරගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 25,940.00 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

PANADURA AUTO SERVICE ආයතනය වෙත රු.25,940.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

6.7 PUC/05/03/01-23/2020 ලිපිගොනුවට අනුව ZE-0323 කම්පැක්ටර් රථය,PANADURA AUTO SERVICE ආයතනය මඟින් සේවා කරගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 24,915.00 ක මුදල , ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

PANADURA AUTO SERVICE ආයතනය වෙත රු.24,915.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

6.8 PUC/05/03/01-06/2020 ලිපිගොනුවට අනුව ZA-5226 JCB රථය සඳහා බට දැමීම වෙනුවෙන්, M.R.Enterprises ආයතනය වෙත ගෙවිය යුතු රු 11,910.00 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

M.R.Enterprises ආයතනය වෙත රු 11,910.00 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.9 PUC/05/03/01-18/2020 ලිපිගොනුවට අනුව YN-6873 ත්‍රී රෝද රථය චතුර මෝටර්ස් ආයතනය මඟින් අළුත්වැඩියා කර ගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 18,100.00 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

චතුර මෝටර්ස් ආයතනය වෙත රු 18,100.00 ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.10 PUC/5/4/2/9-2021 හා කුරුප්පුමුල්ල ගාමිණී කොස්තා මාවත කොන්ක්‍රීට් කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් 10% අතරුදවුම් මුදල වන රු 71,574.99 ක මුදල,682ඒ,කුරුප්පුමුල්ල ජ්‍යෙෂ්ඨ පුරවැසි එකමුතුව වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 71,574.99 ක මුදල,682ඒ,කුරුප්පුමුල්ල ජ්‍යෙෂ්ඨ පුරවැසි එකමුතුව වෙත ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.11 PUC/5/4/02/24-2021 හා රණවිරු නාලක අමරසිංහ මාවත සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් සකස් කර ඇති අවසාන බිල්පතට අනුව මුදල වන රු 180,925.41 ක මුදල,ෆිනෑන්ස්වත්ත සංවර්ධන සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 180,925.41 ක මුදල,ෆිනෑන්ස්වත්ත සංවර්ධන සමිතිය වෙත ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.12 PUC/5/4/02/16-2021 හා ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය ඉදිරිපිට වූ මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් සකස් කර ඇති අවසාන ගෙවීම් වාර්තාව අනුව මුදල වන රු 505,917.05 ක මුදල,මණ්ඩාවල පරාක්‍රම සුභ සාධක සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 505,917.05 ක මුදල,මණ්ඩාවල පරාක්‍රම සුභ සාධක සමිතිය වෙත ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.13 PUC/5/2/13-2021 හා වික්‍රම මාවත කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් 10% ක අතරුදවුම් මුදල වන රු 70,245.79 ක මුදල,ඇටඹගොඩ අවමංගල්‍යාධාර හා සමාජ සේවා සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 70,245.79 ක මුදල,ඇටඹගොඩ අවමංගල්‍යාධාර හා සමාජ සේවා සමිතිය වෙත ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.14 PUC/5/2/2/12-2021 හා පෙරේරා මාවත වරිපනම් අංක 1/10 සිට 5/10 දක්වා සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් 10% ක අතරුදවුම් මුදල වන රු 35,941.87 ක මුදල,ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 35,941.87 ක මුදල,ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.15 PUC/5/4/1/1-2020 හා වැඩ අංගනයේ සෞඛ්‍ය අංශ ගොඩනැගිල්ලේ බිම ටයිල් ඇතිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතියේ වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් 10% ක අතරුදවුම් මුදල වන රු 26,393.55 ක මුදල,ෆිනෑන්ස්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 26,393.55 ක මුදල,ෆිනෑන්ස්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.16 PUC/5/4/3/34/2020 හා තන්තිරිමුල්ල පුස්තකාලය අළුත්වැඩියා කිරීම ඇස්තමේන්තු 1 වන අදියර ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කරගෙන යාමේදී කොටස් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත.ඒ අනුව සකස් කරන ලද රු 978,446.10 ක කොටස් මුදල ස්වශක්ති සංවිධානය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 978,446.10 ක කොටස් මුදල ස්වශක්ති සංවිධානය වෙත ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

07. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

7.1 <u>කර්මාන්ත අංශය</u>

7.1.1 UCP/05/02/01/2022 ලිපිගොනුවට අනුව පාණදුර නගර සභාවට අයත් ගොඩනැගිලිවල(නගර ශාලාව සමඟ) 2022 මාර්තු මස දක්වා ලැබී ඇති විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්) සමාගම වෙත ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු 171,141.91 ක මුදල ,මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 171,141.91 ක මුදල, සී/ස ලංකා විදුලි (පෞද්) සමාගම වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.2 PUC/05/03/04-04/2020 මිනුවන්පිටිය ආදාහනාගාරයේ විදුලි ජනක යන්ත්‍රය සේවා කිරීම වෙනුවෙන් Super Gen Lanka Engineering Service (Pvt) Ltd ආයතනයට ගෙවිය යුතු රු 10,000/= ක මුදල,එම ආයතනයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 10,000/= ක මුදල, Super Gen Lanka Engineering Service (Pvt) Ltd ආයතනයට ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.3 PUC/05/03/01-16/2020 49-7537 ට්‍රැක්ටර් රථයේ ,ස්ටාටර් මෝටරය අළුත්වැඩියා කිරීම J.A.MOTORS ආයතනය මඟින් සිදුකර ගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 19,750/= ක මුදල,එම ආයතනයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 19,750/= ක මුදල, J.A.MOTORS ආයතනයට ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.4 UCP/05/02/පොදු/2020 ලිපිගොනුවට අනුව පාණදුර නගර සභාවට අයත් හඩිසන් උද්‍යාන පිහිණුම් තටාකයේ 2022.02.08 සිට 2022.03.10 දක්වා රු 361,241.32 ක ජල බිල්පතක් ලැබී ඇත.ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන නිලධාරිනිය මඟින් විධිමත් පරීක්ෂණයක් සිදු වෙමින් පවතී.නමුදු මෙම බිල්පත් ගෙවීම ප්‍රමාද කිරීමක් වුවහොත් අතිරේක ප්‍රමාද ගාස්තු ගෙවීමටද,විසන්ධි කිරීමක් සිදුවුවහොත් නැවත සම්බන්ධතා ගාස්තු සමඟ ගෙවීමටත් සිදුවන බැවින් ,විගණන නිළධාරිණියගේ පරීක්ෂණ වාර්තාව ලැබෙන තෙක් රු 361,241.32 ක මුදල,ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවීමට මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මෙවන් අසාමාන්‍ය වටිනාකමක් සහිත බිල්පතක් ලද්දේ පළමු වරට බැවින් ඒ පිළිබඳව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය දැනුවත් කර එම ආයතනය විසින් ලබාදී ඇති පහසුකමක් යටතේ මෙහි ජල මීටරයෙහි යම් දෝෂයක් තිබේද යන්න පරීක්ෂා කර ගන්නා ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2022.03.22 වන දින පැවති කර්මාන්ත කමිටුවෙන් නිර්දේශ වී මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලද කරුණු

7.1.5 PUC/5/4/1/14-2021 ඕබට් සිල්වා කියවීම් ශාලාව සහ පරණ මස්ටරය පැවැත්වූ ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව ලිපිගොනුවට අනුව 2022.03.03 දින මහා සභා තීරණ අංක 7.1 අනුව එම ව්‍යාපෘතියේ මිල ගණන් සංශෝධනය කිරීමට තීරණය වී ඇති බැවින් 62% ක මිල වැඩි වීම අනුව සකස් කර ඇති රු **1,786,899.34** සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,786,899.34 ක සංශෝධිත ඇස්තමේන්තුව මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.6 PUC/5/4/1/5-2021 මිනුවන්පිටිය ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම ලිපිගොනුවට අනුව එකී අළුත්වැඩියා කටයුතු එල්.ඒ .එල්.ලියනාරච්චි ආයතනය විසින් සිදුකර ඇති අතර අදාළ ඇස්තමේන්තුවේ සඳහන් වන c channels එක හොඳ තත්ත්වයේ පවතින බැවින් එය මාරු කර නොමැත.එබැවින් එයට අදාල වන රු 30,000.00 ක මුදල අඩුකර,ඉතිරි මුදල වන රු 540,000.00 ක මුදල එල්.ඒ .එල්.ලියනාරච්චි ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 540,000.00 ක මුදල එල්.ඒ .එල්.ලියනාරච්චි ආයතනය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.7 PUC/05/03/01-01/2020 ලිපිගොනුවට අනුව PE-6871 කැබ් රථය සඳහා පිටුපස ජැක් 02 ක් හා අගුල් දෙකක් ELCARDO TRADING (PVT) LTD ආයතනය මඟින් සවිකිරීම නිසා එම ආයතනය වෙත ගෙවිය යුතු රු 20,000.00 ක මුදල ගෙවීම,කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 20,000.00 ක මුදල, ELCARDO TRADING (PVT) LTD ආයතනය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.1.8 ZA-2794 JCB රථයේ සිදුකරන ලද අළුත්වැඩියා කටයුතු සඳහා H.L.M.HOLDING ආයතනය වෙත ගෙවිය යුතු රු 1,949,890.00 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,949,890.00 ක මුදල, H.L.M.HOLDING ආයතනය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.2 <u>වරිපනම් අංශය</u>

7.2.1 2020 වර්ෂයේ කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා වසා දැමූ දැනටත් ව්‍යාපාර ආරම්භ නොකරන ලද දේපළ ලැයිස්තුව මුදල් කමිටුවේ අවධානය සඳහා ඉදිරිපත් කරන ලදී.

මුදල් කමිටුවේ අවධානය යොමු වන ලදී.

සභා සම්මුතිය: විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.03.22 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.6.6) 2022.03.28 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.03.28 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

දිනය : - 2022.03.28
වේලාව : - පෙ.ව. 09.30
ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	නැත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. ප්‍රියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	ඇත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	නැත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්.තුෂාරා මිය	ඇත

4	තාක්ෂණ නිළධාරී	ප්‍රසාදි විජේරත්න මිය	ඇත
5	තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මහතා	ඇත
6	අංශ ප්‍රධානී(කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
7	සංවර්ධන නිළධාරී(නීති)	ඉමල්කා වේරගම මිය	ඇත

01. PUC/5/4/1/3-2022 හා වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම 2022 ලිපිගොනුවට අනුව නගර ශාලාවේ අක්‍රිය වී ඇති වායු සමීකරණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව විසින් එවා ඇති රු 13,837.50 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 13,837.50 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.එමෙන්ම සභාවේ ඇති වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගෙන වසර කිහිපයක් ගත වී ඇති බැවින් ඒවා සම්බන්ධයෙන් තත්ත්ව වාර්තාවක් ලබාගන්නා ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. PUC/5/4/1/3-2022 හා වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම 2022 ලිපිගොනුවට අනුව කමිටු කාමරයේ අක්‍රිය වී ඇති වායු සමීකරණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව විසින් එවා ඇති රු 43,875.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 43,875.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

03. PUC/5/4/2/5-2022 හා පාණදුර නගර සභාවට අයත් මිනුවන්පිටිය සුසාන භූමිය වටා තාප්පය ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකස් කර ඇති රු 1,000,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,000,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

04. PUC/5/4/2/22-2021 හා තන්තිරිමුල්ල පුස්තකාලය ඉදිකිරීම අදියර 02 ලිපිගොනුවට අනුව ගිවිසුම් මුදල සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා ඇත.එකී ඉල්ලීමට අනුව සකස් කර ඇති රු 445,158.01 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 445,158.01 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

05. PUC/5/4/02/23-2021 හා තන්තිරිමුල්ල පුස්තකාලය ඉදිකිරීම අදියර 03 ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකස් කර ඇති රු 1,646,859.43 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,646,859.43 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

06. PUC/5/4/1/6-2022 කැරපන් ඇලෙහි පැති බැම්ම ඉදිකිරීම-අදියර 1 ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සකස් කර ඇති රු 2,250,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 2,250,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

07. PUC/5/4/3/5/2020 හා වැකඩ පෙර පාසලේ ඉහළ මහල ඉදිකිරීම අදියර 01 ලිපිගොනුවට අනුව අදාල ව්‍යාපෘතිය නිමකර වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති බැවින් එහි 10% අතරුදවුම් මුදල වන රු 122,213.06 ක මුදල නිදහස් මානව හිමිකම් සංවිධානය වෙත ගෙවීම කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 122,213.06 ක මුදල නිදහස් මානව හිමිකම් සංවිධානය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

08. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

8.1 PUC/5/4/3/02/17-2021 හා වැකඩ පෙර පාසලේ අමතර වැඩ ඉටු කිරීම අදියර 03 ලිපිගොනුවට අනුව උක්ත ව්‍යාපෘතියේ වැඩ ඉටු කර යාම වෙනුවෙන් සකස් කරන ලද කොටස් ගෙවීම වන රු 220,387.32 ක මුදල සෞභාග්‍යා වැඩිහිටි සංවිධානය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 220,387.32 ක මුදල සෞභාග්‍යා වැඩිහිටි සංවිධානය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

8.2 PUC/5/4/2/5-2022 හා නෙවිල් පෙරේරා මාවත පළමු වංගුවේ දෙපස තාර දමා සංවර්ධනය කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකස් තර ඇති රු 144,534.41 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 144,534.41 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

8.3 PUC/5/4/3/40-2020 හා වැඩ අංගනයේ ඉහළ මහල ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් මු.රෙ. 704 ට අනුව සකස් කර ඇති අවසාන ගෙවීම වන රු 928,567.44 ක මුදලින්,කොටස් ගෙවීම වන රු 663,147.94 ක මුදල අඩුකර ඉතිරිය වන රු 265,419.50 ක මුදල ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 265,419.50 ක මුදල ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

8.4 PUC/05/01/පොදු/8/2021 ලිපිගොනුවට අනුව,පාණදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 686 ඒ උයන්කැළේ ග්‍රාම නිලධාරී වසමේ සමුද්‍ර මාවතේ පිහිටි (නගර සභා නිවාස යෝජනා ක්‍රමයේ අතහැර දමා ඇති හිස් බිම් කොටස) දොඹගහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ආර්.ජී.සී.සිරිසෝම මහතා මැන සාදන ලද අංක 1077 හා 1994.04.01 දිනැති සැලැස්මේ කැබලි අක්ෂර "බී", "සී" සහ "ඩී" ඉඩම් කොටස් කොට්ඨාශයේ පොදු මහජන අවශ්‍යතාවයක් සඳහා සේවා පියසක් ලෙස ඉදිකළ යුතු බවට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා ප්‍රාදේශීය ලේකම් පාණදුර විසින් එකඟතාවය විමසා ඇත.උක්ත ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කර එකඟතාවය පිළිබඳ තීරණයක් ගැනීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මෙම තීරුව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් නොවන අතර ඒ පිළිබඳව තාක්ෂණික පැහැදිලි කිරීමක් සහිතව පාණදුර ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.5 ගඟුල දේවාලය ඉදිරිපිට ඇති සංවර්ධනය කරන ඉඩමෙහි ගැටළුවක්ව ඇත්තේ ජල බැස්ම පිළිබඳව බැවින් එම ඉඩමෙහි සැලැස්ම හා ජලය උරාගැනීම සම්බන්ධයෙන් ගෙන ඇති වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් ඉඩම කට්ටි කිරීම හේතුවෙන් 1% බදු මුදලක් ගෙවීමට සිදුවන බවත් අදාළ පාර්ශවයන් වෙත දන්වා යැවීමද කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.03.28 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.2) ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.2.1) නල්ලූරුව උතුර කොට්ඨාශයේ මැද වේල්ල පාරේ මහාමාත්‍ය විද්‍යාලය ඉදිරිපස කාණුව සංවර්ධනය කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර නල්ලූරුව උතුර කොට්ඨාශයේ මැද වේල්ල පාරේ මහාමාත්‍ය විද්‍යාලය ඉදිරිපස කාණුව සංවර්ධනය කිරීමට තීරණය විය.

(ඊ.2.2) නෙවිල් පෙරේරා පාරේ ඇති හරස් මාර්ගය කුට්ටිගල් අල්ලා සංවර්ධනය කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මිය

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර නෙවිල් පෙරේරා පාරේ ඇති හරස් මාර්ගය කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීමට තීරණය විය.

(ඊ.2.3) පාණදුර,නල්ලූරුව උතුර කොට්ඨාශයේ මෝදරවිල රබර් වත්ත පාර දකුණු පැත්තේ කැරපන් ඇළට මායිම්ව ඇති පැති බැම්ම සංවර්ධනය කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මිය

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා</u>

මෙහිදී මා යෝජනා කරන්නේ කැරපන් ඇලේ දකුණු පස බැම්ම සංවර්ධනය කළ යුතු බව.වර්ෂාව පවතින අවස්ථා වලදී මෙම ඇලේ ජලය සියල්ල එම අවට නිවාස වෙත ගලායෑමක් සිදුවෙනවා.මෙම ඇලේ වම් පස අයිති වෙන්නේ ප්‍රාදේශීය සභාවට.අප සභාව සංවර්ධනය කළ යුත්තේ දකුණු පස යැයි පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

කැරපන් ඇලේ ඉහළ කොටසට වඩා සකස් කළ යුත්තේ මන්ත්‍රීතුමා පවසන පරිදි පහළ කොටස තමයි.මේ සඳහා යම් වියදමක් දැරීමට සිදුවෙයි.කෙසේ හෝ මෙම කාර්යය ඉටු කරමු.සභාව සතුව

ස්ථාවර තැන්පත් වශයෙන්ද මුදල් පවතින බැවින් මෙවන් සංවර්ධන කටයුතු සඳහා එම මුදල් යෙදවීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.එසේම පළාත් සභාවට වෙන්කරන ලද මුදල්ද ඔවුන් සතුයි.එමනිසා පළාත් සභාවෙන් හෝ ප්‍රතිපාදන ඉල්ලා ගැනීමට උත්සහ දරමු යැයි පවසා සිටින ලදී.

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර පාණදුර,නල්ලූරුව උතුර කොට්ඨාශයේ මෝදරවිල රබර් වත්ත පාර දකුණු පැත්තේ කැරපන් ඇළට මායිම්ව ඇති පැති බැම්ම සංවර්ධනය කිරීමට තීරණය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2209/38 හා 2021.01.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද පාණදුර නගර සභා රැස්වීම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 19.8 වගන්තිය අනුව ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.3) ගරු සභාපති එම්.ඩී.නන්දන ගුණතිලක මැතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.3.1) ඩයනා ෂූ ආයතනය විසින් නගර ශාලාවේ ප්‍රදර්ශනයන් පැවැත්වීම වෙනුවෙන් එහි සේවකයන් නගර ශාලාවේ නවාතැන් ගැනීම වෙනුවෙන් 2022.04.04 සිට 2022.04.12 දක්වා දෙදෙනෙකුට නවාතැන් පහසුකම් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව නවාතැන් ගැනීම වෙනුවෙන් එක් සේවකයෙකුගෙන් දිනකට රු 250.00 බැගින් අයකිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය: ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා

සභා සම්මුතිය : විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර ඩයනා ෂූ ආයතනය විසින් 2022.04.04 සිට 2022.04.12 පවත්වනු ලබන ප්‍රදර්ශනයේදී එහි සේවකයන් දෙදෙනෙකුට නගර ශාලාවේ නවාතැන් ගැනීම වෙනුවෙන් එක් සේවකයෙකුගෙන් දිනකට රු 250.00 බැගින් අයකිරීමට තීරණය විය.

(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම -

(උ.1) 2022.03.08 දිනැති මහජන පෙත්සම් කාරක සභා වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

මහජන පෙත්සම් කාරක සභාවෙන් යම් තීන්දු තීරණ ලබාදෙන අතර එම තීන්දු තීරණ අනුව සමහර ස්ථානවල අනවසර ඉදිකිරීම් සිදු කරමින් පවතිනවා.එම නිසා එම අනවසර ඉදිකිරීම් පිළිබඳව සොයා බලා ඒ සම්බන්ධව නිසි නීතිමය පියවරයන් ගන්නා ලෙස පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

පෙත්සම් කාරක සභාවෙන් ,පවතින්නාවූ නීතීන් වලට පටහැනි ලෙස තීන්දු තීරණ ගෙන නැහැ.එමනිසා ලබාදුන් තීන්දු වලට පිටින් යම් යම් අනවසර ඉදිකිරීම් සිදුවෙනවා නම් ඒ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම නීතිමය පියවර ගන්නා බව පවසා සිටින ලදී.

(උ.2) 2022.03.10 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.3) 2022.03.10 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.4) 2022.03.22 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.5) 2022.03.22 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.6) 2022.03.28 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම -

(ඌ.1) 2022 ජනවාරි මස ලැබීම් ගෙවීම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.2) 2022 ජනවාරි මස වරිපනම් අයකිරීම සම්බන්ධ මාසික ප්‍රගති වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

ගරු සභාපතිතුමා

වරිපනම් අංශයේ කාර්යය මණ්ඩලය ගිය මාසේ ජංගම සේවා පවත්වමින් හිඟ වරිපනම් අයකිරීමට කටයුතු කළ අතර ඒ අනුව සැලකිය යුතු ආදායමක් සභාවට රැගෙන ආවා.එමෙන්ම ආදායම් පරීක්ෂක නිළධාරීන් වෙත නිල ඇඳුමක් පවතින බැවින් ඉදිරියේදී ඔවුන් සමඟද සාකච්ඡා කර නිළ ඇඳුමෙන් සැරසී ආදායම් එකතු කිරීමට කටයුතු කිරීමට උපදෙස් ලබාදිය යුතු බව පවසා සිටින ලදී.

එමෙන්ම සභාවේ වැඩ කටයුතු සඳහා මුදල් ලබාගන්නා බවට සමහර සේවකයින්ගේ පිංතූර සමඟද සමාජ මාධ්‍යවල පළවුණා.එමනිසා මෙම තොරතුර පිළිබඳ සත්‍යඅසත්‍යතාවයද සමාජ මාධ්‍යවල පළකරන පුද්ගලයන් පිළිබඳවද සොයාබැලීම් අනිවාර්යයෙන්ම සිදුකරන බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා

පොදු වෙළඳ පොලේ කඩ ලබාදීමේදී ගරු සභාපතිතුමා හා තවත් පුද්ගලයෙකු එකතුවී මුදලට කඩ කාමර විකුණන බවට අසත්‍ය ප්‍රචාර පැතිරෙන බැවින් ඒ පිළිබඳවද සොයා බලා කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

(ඌ.3) 2022.01.31 දිනට හිඟ ආදායම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.4) 2022 පෙබරවාරි මස ලැබීම් ගෙවීම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.5) 2022 පෙබරවාරි මස වරිපනම් අයකිරීම සම්බන්ධ මාසික ප්‍රගති වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.6) 2022.02.28 දිනට හිඟ ආදායම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ) අංශ ප්‍රගතිය සලකා බැලීම -

(එ.1) 2022 පෙබරවාරි මස ආදාහනාගාරයේ ආදායම් වියදම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.2) 2022.01.01 සිට 2022.01.31 දක්වා සභාව විසින් කසළ කළමනාකරණයේදී ,කසළ අවසන් බැහැර කිරීම පිළිබඳ සංශෝධිත වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.3) 2022.02.01 සිට 2022.02.28 දක්වා සභාව විසින් කසළ කළමනාකරණයේදී ,කසළ අවසන් බැහැර කිරීම පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.4) 2022 පෙබරවාරි මාසයේ ඩෙංගු මර්දන ව්‍යාපෘති සේවකයින්, සේවයේ යෙද වූ ආකාරය පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.5) බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමියගේ උපදෙස් පරිදි 2020.02.10 වන දින බඳවා ගන්නා ලද ඩෙංගු මර්දන ව්‍යාපෘති සේවකයින් 2022 පෙබරවාරි මාසයේ සේවයේ යෙද වූ ආකාරය පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.6) 2022 පෙබරවාරි මස නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.7) 2022 පෙබරවාරි මස පෙර පාසල් මාසික ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.8) 2022 පෙබරවාරි මස පුස්තකාල ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

<u>අදහස් ප්‍රකාශ කරමින්:</u>

<u>ගරු සභාපතිතුමා</u>

පුස්තකාලාධිපති තනතුරේ පැවති පුරප්පාඩුව සඳහා පුස්තකාලාධිපතිනියක් ස්ථානමාරු වී පැමිණ සිටින අතර ඇයට ශාඛා පුස්තකාලයන්හී කටයුතු අධීක්ෂණය පවරා දෙන ලදී.පුස්තකාලයන්හී සේවය කරන කාර්යය මණ්ඩලයේ යම් යම් අයගේ පුද්ගලික හේතුන් හා ඉල්ලීම් සලකා බලමින් ශාඛා පුස්තකාලයන් අතර ස්ථාන මාරුවීම් කිහිපයක්ද සිදුකිරීමට සිදුවූ බව පවසා සිටින ලදී.එමෙන්ම වැකඩ පුස්තකාලය හා පෙර පාසලේ සේවය කරන කාර්යය මණ්ඩලයෙන් ඉල්ලීමක් පවතිනවා ඔවුන්ට එම ස්ථානයට ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකර ලබාදෙන ලෙස.එමනිසා එම ස්ථානයට ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකිරීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

තුඩුව පුස්තකාලය වසන ලෙස අදහස් ඉදිරිපත් වුනද මාගේ අදහස නම් පුස්තකාලයක් වැසීමට ලක්නොකරන ලෙසයි.මේ සඳහා ජනතාව ගෙන්වා ගැනීමට යෝජනා කිහිපයක් මා විසින් ප්‍රජා සංවර්ධන අංශයට ඉදිරිපත් කළද මේවන තෙක් ඒවා ක්‍රියාත්මක වීමක් සිදුවුණේ නැහැ.එමනිසා එම කටයුතු පිළිබඳව සොයාබලා ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

වැවේ කුඹුර වෙල්යායේ සිදුවන සංවර්ධන කටයුත්ත සඳහා පහත් බිම් සංවර්ධන මණ්ඩලයේ ඉල්ලීම මත වෙරළ භූමියේ ගොඩගසා තිබූ පස් ලබාදුන්නද එම පස් මඟින් වෙනත් ගොඩකිරීම් සිදුකරන බවට චෝදනා සභාව වෙත යොමුවන බැවින් ඒ පිළිබඳව වැඩ අධිකාරීතුමා මැදිහත් වී සොයා බැලීමක් සිදුකරන ලෙස පවසා සිටින ලදී.එමෙන්ම මෙහි සිදුවන සංවර්ධන කටයුත්තේ සැලැස්මක් මේවන තෙක් සභාව වෙත ලැබී නොමැති බවද පවසා සිටින ලදී.තවද ගඟුල පන්සල ඉදිරිපිට සංවර්ධනය කරන ඉඩම සම්බන්ධයෙන් සභාවට ඇති ගැටළුව වන්නේ වර්ෂා ජලය රඳවා ගන්නේ කෙසේද යන්න හා ජල සම්පාදන මණ්ඩලයෙන් මෙහි ඉදිවන නිවාස ඒකක සඳහා ජල සැපයුම ලබාදීමේදී එම ප්‍රදේශයේ අනෙකුත් ජනතාවට ලබාදෙන ජල සැපයුමට යම් බාධාවක් වෙනවාද යන්නයි.එමනිසා එම ගැටළු සඳහා විසඳුම් පවතිනවා නම් එම සැලැස්ම අනුමත කිරීමේ ගැටළුවක් නොමැති බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය</u>

උඩහමුල්ල ශාඛා පුස්තකාලයේ සේවය කරන මහත්මියකුත් ස්ථාන මාරු ඉල්ලා සිටින බැවින් ඒ පිළිබඳවද සලකා බලන මෙන් පවසා සිටින ලදී.

(ඒ) වෙනත් කරුණු

(ඒ.1) <u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

(ඒ.1.1) 1956 අප්‍රේල් මාසයේ 05 වන දා පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී පාණදුර ආසනයෙන් සම සමාජ පක්ෂයෙන් තරඟකරපු ලෙස්ලි ගුණවර්ධන සහෝදරයාව මල් මාලයක් දාලා පිළිඅරගෙන ආරම්භ කළ දේශපානයට ,2021 වසරේ අප්‍රේල් 05 වන දිනට වසර 65 ක් සපිරෙණවා. මගේ දේශපාලන ජීවිතයට මෙම වසරේදී වසර 66 ක් ගත වෙනවා. ඒ කාලය තුළ නොයෙක් තර්ජන වලට මුහුණ දීලා තියෙනවා.එමෙන්ම තුන්වතාවක් මරණයෙන් බේරී තිබෙනවා. 77 මහ මැතිවරණය කාලයේදී අපි ජීවත්වුණේ ජයන්තිපුර නිවාස යෝජනා ක්‍රමයේ. ඒ කාලයේ දේශපාලඥයින් මගේ ගෙදරට බලහත්කාරයෙන් ඇතුළු වී මාස 03 ක් පදිංචි වෙලා හිටියා.පොලීසියෙන් කිව්වත් ඔවුන් ඉවත් වුණේ නැහැ.ඉන්පසු මට උපදෙස් ලැබුණා බලෙන් ගෙට ඇතුළු වෙන්න කියා.ඒ අනුව මම බලහත්කාරයෙන් තමයි මගේ ගෙට ඇතුල් වෙන්නේ. ඒ වෙද්දි ගෙදර පා පිස්සවත් තිබුණේ නැහැ. අන්න එහෙම දුෂ්කරව තමයි අපි දේශපාලනය කරේ. 1965 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් පැවති කාලයේ ශිෂ්‍යගුරු හැටියට පත්වීම් දෙන්න සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවා.මමත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුණා. නමුත් සමසමාජ කාරයෙක් කියලා මට පත්වීම ලැබුණේ නැහැ. ඉන් අනතුරුව 1965 සිට ලෙස්ලි ගුණවර්ධන මහතා ලග සම්බන්ධීකරණ ලේකම් හැටියට මම පත්වීම අරගෙන වැඩකරා. 1970 දී මහ මැතිවරණයේදී ආසනයේ සංවිධායක ලෙස පත්වෙලා ආපු වීරමන් මන්ත්‍රීතුමාගේ පියා සමඟ එකතු වී වැඩ කරලා මේ ආසනය ජයග්‍රහණය කරලා.එහිදී ලෙස්ලි ගුණවර්ධන මහතාට ගමනාගමන ඇමතිලෙස පත්වීම හමුවුණා.මාසයක් දෙකක් යනකොට පාණදුරේ බොහෝ තරුණයෝ පිරිසක් ගමනාගමන මණ්ඩලයේ සේවයට ආවා.ඒ අනුව මමත් ගියා ලෙස්ලි ගුණවර්ධන මහතාගේ නිවසට ඔහුව මුණ ගැහෙන්න.එහිදී එතුමා ඔහු ලඟ සේවය කරන්න මාව අරගත්තා. ටික කාලයක් යනකොට අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගත්තා, මන්ත්‍රීලා ලඟ සේවය කරන අයව තාවකාලික ලිපිකරු තනතුරට අනුයුක්ත කරන්න කියා.එමඟින් මට තාවකාලික ලිපිකරු පත්වීමක් ලැබුණා. 1975 වර්ෂයේදී , සමසමාජ පක්ෂයේ අය සාකච්ඡා කරලා මට ස්ථිර රස්සාවක් දෙන්න සුදුසු කියලා හෙක්ටර් කොබ්බෑකඩුව මහතාට කථා කරලා එම අමාත්‍යංශයේ රැකියාවක් දෙන්න කියලා එම ස්ථානයට යොමු කරා. නමුදු පාණදුරේ ශ්‍රීලංකා එකේ අය ඒ

සඳහා හරස් වුණා. ඉන් අනතරුව මම නොයෙකුත් දුෂ්කරතා මැද ජීවත් වුණා. 2010 වසරේ රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවේ රාජ්‍ය පරිපාලන නියෝජ්‍ය අමාත්‍ය වුණේ ලංකා සමසමාජ පක්ෂයේ හිටපු ආතාවුද සෙනවිරත්න මහතාට .එහිදී පවසා සිටියා අර මන්ත්‍රීවරුන්ගේ ලඟ සේවය කරන අයට ස්ථිර පත්වීම් දෙන්න නොහැකි නම්, ඒ අයට විශ්‍රාම වැටුපක් වගේ දීමනාවක් දෙන වැඩ කටයුත්තක් සලසා දෙන්න කියලා. මට ඒ සම්බන්ධයෙන් දෙයක් කරන්න බැහැ කියලා එතුමා ඒක ප්‍රතික්ෂේප කරා. 2003 වර්ෂයේ මම සමසමාජ පක්ෂයෙන් ඉවත් වුණේ ප්‍රතිපත්තිමය වල තියෙන වෙනසක් නිසා නෙවෙයි , පාණදුරේ සමසමාජ පක්ෂයේ ශාඛාවේ හිටපු අයිතිකාරයින්ගේ ප්‍රශ්නයක් නිසයි.ඊට පසුවත් මම 2001 වර්ෂයේදී හිටපු ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ආණ්ඩුවට විරෝධිව කටයුතු කරා. ඊට පසු 2001 වර්ෂයේ දී පළාත් පාලන ඡන්දයේදී සමසමාජ පක්ෂයේ බලය ගන්න ඕන කියලා හිතාගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ හවුලක් ඇති කර ගන්න උත්සහ කරා. නමුත් එක් කෙනෙකුට දෙන්නෙකුට තමයි අවස්ථාව සැලසුනේ. මේ මැතිවරණ පිළිබඳ මට ආසාවක් තිබුණේ නැහැ.මම මේ මැතිවරණ ක්‍රමය ගැන , ඡන්ද ක්‍රමය ගැන විරුද්ධ කථා කරපු කෙනෙක්. දැනට වැකඩ සායනය පවත්වාගෙන යන ඉඩමේ සායනයක් හදන්න යන අවස්ථාවේ තමයි ජනතා විමුක්ති පෙරමුණේ ජගත් පුෂ්ප කුමාර සහෝදරයා හා මුදිත සමනක්කොඩි සහෝදරයා මා සමඟ සම්බන්ධ වන්නේ.ඒ අනුව 2003 වර්ෂයේ සිට මා ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් ලෙස කටයුතු කරනවා. 2006 දී පක්ෂයෙන් ඉල්ලීමක් කරනවා පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙන්න කියලා. හැබැයි ඒ වේලාවේ නම් මම අකමැත්තක් දැක්වූවේ නැහැ. ඒ අවස්ථාවේදී එම එම මැතිවරණයෙන් මමයි, මුදිත සහෝදරයයි පාණදුර නගර සභාවට තේරී පත්වුණා. ඉන්පසු 2015 වසරේ මහ මැතිවරණයෙන් පස්සේ 2016 ජනවාරි මාසයේ නලින්ද ජයතිස්ස සහෝදරයා හමුවෙන්න කළුතර ගියා. ඒ ගියෙත් කොට්ඨාශයේ මහත්මයෙක්ගේ යම් ගැටළුවක් සාකච්ඡා කරන්න.එහිදී එතුමා මගෙන් ඉල්ලීමක් කළා පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙන්න ,ආසනය ජයග්‍රහණය කරන්න ඒවගේම පක්ෂයෙන් කිහිප දෙනෙකුත් ඇතුළට ගන්න කියා.එම අභියෝගය භාරගනිමින් 2018 වර්ෂයේ පළාත් පාලන ඡන්දයට තරඟ කරලා මුළු ලංකාවෙන් ජනතා විමුක්ති පෙරමුණේ ආසනයක් දිනාගත් එකම මන්ත්‍රී වුණේ මමයි.එමෙන්ම තවත් සහිකයින් 03 දෙනෙකුත් මෙම සභාවට පත්වුණා.එදා ඒ පිළිබඳව පුවත්පත් වාර්තා පවා පළවුණා.බීබීසී එකෙන් පවා මා පිළිබඳව වැඩසටහනක් කළා.නමුදු අද පියසේන කියන චරිතයත් හිටියේ නැහැ වගේ තමයි හැසිරෙන්නේ. මම මේ ප්‍රකාශය කරන්න හිටියේ ගිය වසරේ.මගේ දේශපාලන ජීවිතයට වසර 65 ක් පිරීම නිමිත්තෙන්. නමුත් විවිධ සිත්තැවුල් හේතුවෙන් මම ඒ ගැන ප්‍රකාශ කරේ නැහැ. එදා මම ගැන සියළු දෙනා කථා කරාට අද මම ගැන කථා නොකරන තරමට මම කැමතියි යැයි පවසා සිටින ලදී.

(ඒ.1.2) මම සභාවේ වසර දෙකක කාලයක් තිස්සේ මහා සභා වාරයන්හීදී වෙනත් කරුණු යටතේ පුස්තකාලයේ වැසිකිළි පද්ධතිය පිළිබඳ කරුණු දක්වා තිබෙනවා. ඇත්තටම ඒ පැත්ත බලන්න අශෝභනයි. මේ වන විට බොහෝම නරක තත්වයක් තියෙන්නේ. වැසි දවස් වලට වැසිකිළි වළවල් උතුරලා , ක්‍රීඩා පිටියට ගලා ගෙන යන තැනටම ඇවිත් තියෙන්නේ.මෙම වැසිකිළි පද්ධතිය අළුත්වැඩියාව සඳහා මුදල් වෙන්කර තිබියදීත් මෙම ඉටු නොකිරීම පිළිබඳව ඉතා කණගාටුවන බව පවසා සිටින ලදී.

(ඒ.1.3) මිනුවම්පිටිය සුසාන භූමියේ හා ආදාහනාගාරයේ ඇති අඩුපාඩු පිළිබඳවත් විටින් විට සහික මහත්ම මහත්මීන් සභා වාරයන්හීදී අදහස් දක්වා තිබෙනවා.එම භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර එතැන අළුතින් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු කල යුතු

අතර ආදාහනාගාරය අසල ඇති පැරණි ගොඩනැගිල්ල එහි සේවකයින්ට රැඳී සිටීමට හා භාණ්ඩ තැබිය හැකි ලෙස සකස් කළ යුතු බව පවසා සිටින ලදී.

(ඒ.1.4) ජයන්තිපුර නිවාස යෝජනා ක්‍රමයේ කාණු පද්ධතියක් හදන්න යෝජනා කරා. එය ඉටු කර ගැනීමට නොහැකි වුණා.හැකියාවක් ඇත්නම් එම කාර්යය ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.2) <u>ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා</u>

(ඒ.2.1) මේ වන විට දේශපාලනය බොහොම අස්ථාවර වෙලා තියෙන්නේ. මේ වන විට තරුණ තරුණියෝ ඔක්කොම පාරට බැහැලා තියෙන්නේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ඉන්න කොට මට වයස අවුරුදු 10යි. මට මතකයි මට ඇහෙනවා, ඒ දවස් වල පෙළපාලි යනවා " අපේ අම්මා ළඟ එනවා, හාල් සේරු දෙක දෙනවා, සීනි නැතිව තේ බොනවා, මිරිස් නැතිව හොඳි කනවා " ආදී වශයෙන් කිය කියා. 1975 වෙනකම් හවුල් ආණ්ඩුවක් තිබුණේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ පාලන කාලය 1975 වර්ෂයෙන් අවසන් වුණත් එතුමිය 1977 වර්ෂය දක්වා පාලනය කරා. ඉන් පස්සේ ජේ.ආර්.ජයවර්ධන මහතා බලයට පත් වුණා. ඒ වන කොට බණ්ඩාරනායක මැතිණියට ප්‍රජා අයිතිය අහෝසි වෙලා තිබුණේ වසර දෙකක් රට පාලනය කළාට. 1977 ජේ. ආර්. ජයවර්ධන මහතා විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වා දුන්නා. විවෘත ආර්ථිකය සමඟ අපනයන මෙන්ම ආනයනයට යම් ප්‍රගතියක් වුවත්, රටට අහිතකර දේවල් තමයි බොහොමයක් ආවේ. ඉන්පසු රටේ දේශීය නිෂ්පාදන ආයතන වන කැලණි ටයර්, වානේ සංස්ථාව, කන්තලේ සීනි කර්මාන්ත වැනි කර්මාන්ත ශාලා වැසී ගියා. ඒ එක්කම ජේ. ආර්.ජයවර්ධන මහතා පත්වෙනවාත් සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 08 බැස්සා. පතාක යෝධයෝ පැරදුනා. 1982 ජනාධිපතිවරණයක් පවත්වන්න ඉඩ තියෙද්දී ආණ්ඩුවේ තවත් වසර ගණනාවක් ඉදිරියට කරගෙන ගියා. කොබ්බෑකඩුව මහත්මයා තමයි ඡන්දයට ඉදිරිපත් වුණේ. විජේවීර සහෝදරයාත් ඉදිරිපත් වෙලා හිටියා. 1982 ලාම්පු කළගෙඩි ඡන්දයෙන් ප්‍රජාතන්ත්‍රවාදය විදිහට තරුණයන්ට පාර්ලිමේන්තුවට එන්න ඉඩ නොදී ඒක මඟ හැරියා. එතැනින් වුණේ ලොකු විනාශයක්. 1983 වෙනකොට දෙමළ සිංහල , ප්‍රශ්නයක් ඇති කරා.පාණදුරේ දෙමළ අයට ගහලා කඩ ගිනි තියලා කලබල ඇති කළා.ඒ කාලේදී නවත්ත ගන්න පුළුවන් වුණ එක නවත්ත ගත්තේ නැහැ. ඒ පිට දාලා පක්ෂ 03 ක් තහනම් කරා. සමසමාජ පක්ෂයයි, නව සමසමාජ පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි. පසුව එයින් පක්ෂ දෙකක තහනම ඉවත් කලද ජනතා විමුක්ති පෙරමුණට පනවන ලද තහනම එසේම තබාගෙන හිටියා. ඊට පස්සේ ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ තහනම ඉවත් කර ගන්න සැහෙන්න බලපෑම් කරලා තියෙනවා.නමුත් ඉවත් කළේ නැහැ. උතුරේ ජනතාව අපේ නගර වලින් පැන්නුවා.ඉන්දු ලංකා ගිවිසුම් ගහලා සියල්ලන්ම විරුද්ධ වෙද්දි බලහත්කාරයෙන් ලක්ෂ ගණනක් ඉන්දියන් හමුදාව මෙරටට ගෙන්නුවා. එතනදී තරුණයෝ බොහොමයක් ආයුධ අතට ගන්න පෙළඹුනා.එයින් තරුණ ජීවිත 60 000 ක් පමණ පූජා කරල තමයි එම හමුදාව පලවා හරින්න හැකිවුණේ. පසුව ඔය අතර ප්‍රේමදාස මහතා ජනාධිපති වුණා. තරුණයන්ගේ සංවිධානය බොහොම වැදගත්. අද දින ඔවුන්ගේ ඉල්ලීම මත බැසිල් මහතාට එළියට බහින්න වුණා. අපි කියන්නේ සංවිධානයට නිසි අරමුණක් තියෙන්න ඕන. රටේ සංවිධානාත්මකව කටයුතු කිරීමේදී පක්ෂයක් වශයෙන් අපි කියනවා අපිත් එක්ක එකතු වන්න. අපි නිරායුධ සටනක් කරමු. ප්‍රජාතන්ත්‍රවාදී සටනක් අපි දැන් කරන්න ඕන. ආයුධ අතට අරන් සටන් කරන්න අපිට බැහැ. ඒක ලෝකයම පිළිගත් න්‍යායක්. අපි එදා තීන්දු තීරණ ගත්තේ රට වෙනුවෙන්.එදා

වගේම අදටත් අපි අපේ මව්බිමට ආදරෙයි. අද වන කොට විද්වතුන් කියන අය ඉදිරිපත් වෙන්න ඕන මේ රට වෙනුවෙන්. දේශපාලන ඉතිහාසය ගැන අපි හැමෝම දන්නවා.හැමෝම පත්වෙන්නෙ හොරු අල්ලනවා කියලා.නමුදු බලය අරගත්තට පස්සේ ඒදේ සිද්ධ වෙන්නේ නැහැ.යුද්ධයක් ඇති නොවෙන්න ඒ කාලේ කටයුතු කරන්න තිබුණා.එසේ වුණා නම් අද එක් කොට්ඨාශයකට යුධ ජයග්‍රහණය ලබාදුන්නා කියා කියන්න වෙන්නේ නැහැ. කලින් කලට හිටපු නායකයන් ක්‍රියාකරපු ආකාරය අපි දන්නවා. ඒ වගේම රටේ ජනතාවද දන්නවා.අපි හිතනවා අපිටත් පුළුවන් කියලා මේ එට හදන්න.මොකද අපි ජාතික දේපළ මංකොල්ල කාලා නැහැ.එමනිසා ජාතික ජන බලවේගය වන අපිත් සමඟ එකතු වෙන්න කියලා හැමෝටම ආරාධනා කරන බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

එදා පැවති අරගලය උද්දීපනය කළ ගීත අද නැවතත් ඇසනෙ අතර අරගලය මර්දනය කල අයටත් ඒවා කියන්න සිදුවෙලා තිබෙනවා. එයයි දේශපාලනය.එය තේරුම් නොගෙන පක්ෂවල ඇලීගෙන ඉන්න නරකයි. තරුණයො මැරෙන්න නොදී මට කළ හැකි උපරිමයෙන්ම මම ඔවුන් වෙනුවෙන් කරනවා යැයි පවසා සිටින ලදී.

(ඒ.3) <u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා</u>

(ඒ.3.1) සමස්ථ රටවැසියා පාරට බැස ඇති අවස්ථාවක් මේක.ජනතාවට කෑම නැහැ,ඉන්ධන නැහැ,ගෑස් නැහැ,රටේ ඩොලර් නැහැ.මෙම ආණ්ඩුවට තිබෙනවා 69 එක්ක පුදුම සම්බන්ධයක්. හැටනම ලක්ෂයක ජනතා බලයෙන් පත්වූ මෙම ආණ්ඩුවට විරුද්ධව ජනතා අරගලයක් ඇති වී තිබෙන්නේ 1953 වර්ෂයෙන් පසු වසර 69 කට පසුවයි.මේ ජනතා සටන ඇතුලේ පක්ෂ නැහැ,ජාතී නැහැ,ආගම් නැහැ.එක් පැත්තකින් මෙම සටන සර්වපාක්ෂිකයි.සියළු පක්ෂවලට ඡන්දෙ දීපු වැඩකරපු සියළු දෙනා මෙන්ම කිසිදු පක්ෂයකට ඡන්දෙ නොදීපු වැඩ නොකරපු සියළු දෙනාද මෙම සටනට එකතු වෙලා තිබෙනවා.පසුගිය 04 වෙනිදා පාණදුරේදී කරපු ජනසටනේදී අපි ඒ බව දැක්කා.මේ ආණ්ඩුවේ මර්දන නීති කඩාගෙන 03 වෙනිදා උද්ඝෝෂණය කළා.එදින ජනතාව පාරට පැමිණ කිව්වේ ජනතා මර්දනයට ලැස්ති වෙන්න එපා කියා.

මෙය ඉතාම ආශ්චර්යමත් සටනක්. අපි ඉතිහාසයක් පුරා පක්ෂයක් විදියටත් දේශපාලඥයින් විදිහටත් වමේ ව්‍යාපාරයක් විදිහටත් බලාපොරොත්තු වුණේ ජනතාව සටන අතට අරගෙන මෙම ක්‍රමය වෙනස් කිරීමයි.ලංකාව තුළ 74 අවුරුද්දක මෙම ශාපය වෙනස් කරන්න.එය වෙනස් කළොත් විතරයි මේ රට ගොඩනගන්න පුළුවන් වෙන්නේ.ජනතාව අද එය අතට අරගෙන තිබෙනවා.ඒක ඇතුළේ ගැටළු කිහිපයක් තිබෙනවා.එම ගැටළුව ඇත්තටම ඇතිවෙන්නේ ආර්ථික අර්බුදයත් එක්ක.ආර්ථික අර්බුදය ඇතිවුණේ ආණ්ඩුව මුදල් අව්වු ගැහුවා.එක් එක් මුදල් වංචාවන් සිදුකළා.ජනතාවට මෙම ආර්ථික අර්බුදය ඇතිවන විට මුලදි එය එච්චර දැනුනේ නැහැ.අපි හොරා කියා කියන විට නඩු දාන්න කියලයි මිනිස්සු කිව්වෙ.නමුදු දැන් ජනතාවගේ දෛනික ජීවිතයට දැනෙන් පටන් ගෙන තිබෙනවා.ආණ්ඩුව සාදාරණ විසඳුම් දෙනවා වෙනුවට ජනතාවට විහිළු සැපයීම සිදුකළා.එමනිසා ජනතාවගේ සීමාව පැන තිබෙනවා.ඔවුන් දැන් ජනතා අරගලය පටන් ගත්තා.මේවන විට ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් බවට පත්වී තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ,පොහොට්ටුවේ මන්ත්‍රීවරු 40 ක් පමණ මේවන විට ස්වාධීන වී තිබෙනවා.ඔවුන්ද උද්ඝෝෂණ කරනවා.ජනතාව දැන් කියන්නේ GOTA GO HOME කියා.ජනාධිපතිතුමාගේ System එකත් fail වෙලා එයත් fail වෙලා

එයාගේ කණ්ඩායමටත් මෙය බැහැ කියා ඔප්පු වෙලා තිබෙනවා.දේශපාලන අර්බුදය ඇතිවන විට ආණ්ඩුව කළේ ජනතාව මර්දනය කිරීමට අප්‍රේල් 01 වැනිදා මෝඩයාගේ දවසේ මෝඩයා වගේ හදිසි නීතිය දාලා ඇඳිරි නීතිය දැමීමයි.එයිනුත් නොනැවතී මහජන ආරක්ෂක පනත යටතේ පොදු ස්ථානවල ගැවසීමත් තහනම් කිරීමයි.නමුදු ජනතාව මේ කිසිදු දෙයක් මායිම් කළේ නැහැ.ජනතාව එළියට ආවා.මොකද ඔවුන්ගේ අර්බුදය ඊට වඩා ලොකු නිසා.

මෙහි කේන්ද්‍රීය ප්‍රශ්ණ දෙකක් තිබෙනවා. ආණ්ඩුව කිසි අවස්ථාවක උත්සහ කළේ නැහැ ඒවාට විසඳුම් දෙන්න.එකක් තමයි ජනතාව පවසා සිටින්නේ ජනාධිපතිතුමා ඉවත් විය යුතු බව හා අනෙක් එක තමයි ජනතාවගේ සාමාන්‍ය ජනජීවිතයට අවශ්‍ය ආහාර,බෙහෙත්,ඉන්ධන හා අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබාදෙන්න කියා.එමනිසා දැන් ජනතා හඬට ඇහුම්කන් දෙන්න අවශ්‍යයයි.ඒ වෙනුවට රජය කරන්නේ කැබිනට් මණ්ඩලය මාරු කිරීමයි.අන්තර්කාලීන පාලනයක් ගෙන ඒමට යනවා.මන් හිතන්නේ නැහැ,එයිනුත් මෙම ගැටළුවට විසඳුම් ලැබෙයි කියා.ඒ දේ කරන්න නම් ඉලක්ක සහගතව අරගල දියත් කළ යුතුයි.රට ස්ථාවර කළ යුතුයි.රට වැටෙන්න දෙන්න බැහැ.මෙම අරගලය සංවිධානාත්මක හා අවිහිංසාවාදී විය යුතුයි.එමනිසා එයට දේශපාලන පක්ෂ විදිහට මැදිහත් විය යුතුයි.මේවන විට විවිධ කණ්ඩායම් උද්ඝෝෂණ සංවිධානය කරනවා මෙම උද්ඝෝෂණ හරි දිශානතියට රැගෙන යාම සඳහා අපි මැදිහත් විය යුතුයි.දැනඋගත් වැඩිහිටියන් විදිහට සක්‍රීය දේශපාලඥයින් විදිහට අවස්ථාවාදීත්වයට ගොදුරු වෙන්නේ නැතුව මේ සඳහා මැදිහත්විය යුතුයි.විරෝධය අඩපණවන ආකාරයේ දේවල් අපි නොකර ඒවා ශක්තිමත් කළ යුතුයි. රාජ්‍ය සේවකයින් ඊයේ පාරට බැස්ස.හෙට සංකේතාත්මකව සමස්ත මහා වැඩ වර්ජනයක් කැඳවනවා.එම නිසා ඉතා ගෞරවයෙන් පාණදුර නගර සභා සේවක මණ්ඩලයෙන් හා පාණදුර නගරයේ සියළු රජයේ ආයතන වලින් එයට සහය වෙන්න කියා ඉල්ලා සිටිනවා.මෙය ජනසටනක් ,මේ ජන සටනෙන් ප්‍රතිඵල තියෙන්නේ ජනතාවට දේශපාලන පක්ෂ වලට නොවෙයි. ජන අරගල වලින් තමයි ජයග්‍රහණ ලබාගෙන තිබෙන්නේ.අවසානයේදී මෙම අරගලයේ ජයග්‍රහණය හරිදිශාවට අරගත්තාට පසුව ජනතාව තීරණය කරයි කවුද මේ රට පාලනය කරන්නේ කියා.මෙම පුළුල් ජනසටනට ,කඩාකප්පල්කාරයන්ට හසුනොවී සක්‍රීයව මැදිහත් වෙන්න කියා සියළු සහික මහත්ම මහත්මීන්ගෙන් හා සියළු නිළධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා. මාතෘභූමියට සැබෑ නිදහස ලබාගැනීමට ඔබට හැකි සියළු ආකාරයන්ගෙන් දායක වන්න කියා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින බව පවසා සිටින ලදී.

2022.04.07 වන දින මහා සභා න්‍යාය පත්‍රයට අනුව නියමිත කරුණු එපමණක් වූයෙන් අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට තම ස්තූතිය පුද කරමින් 2022 අප්‍රේල් මස 07 වන දින මහා සභාවේ වැඩ කටයුතු ප.ව. 02.45 නිමාවට පත් විය.

සභාපති,

නගර සභාව,

පාණදුර.

දිනය

ඇම්.ඩී. චන්දන ගුණතිලක
සභාපති
පානදුර නගර සභාව

ලේකම්

නගර සභාව,

පාණදුර

දිනය 2022-05-05

ටී. මාහෙල් සියඹලාගොඩ
ලේකම්
පානදුර නගර සභාව